# ශ්‍රීලංකන් එයාර්ලයින්ස්

2012 – 2013

# වාර්ෂික වාර්තාව

# ප ටු න


| | |
|---|---|
| ආයතනික තොරතුරු | 1 |
| දැක්ම සහ මෙහෙවර | 2 |
| සුවිශේෂී කරුණු | 3 |
| සභාපතිවරයාගේ විමර්ශනය | 4 |
| ප්‍රධාන විධායක නිලධාරිවරයාගේ සමාලෝචනය | 9 |
| අධ්‍යක්ෂවරුන්ගේ කාර්යසාධන සටහන | 17 |
| අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව | 19 |
| අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශය | 25 |
| මණ්ඩලීය විගණන කමිටුවේ වාර්තාව | 26 |
| ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව | 28 |
| මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය | 30 |
| ආදායම් ප්‍රකාශය | 31 |
| සර්වව්‍යාපී ආදායම් ප්‍රකාශය | 32 |
| කොටස් ආයෝජනවල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය | 33 |
| මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය | 34 |
| ගිණුම් ප්‍රතිපත්ති හා මූල්‍ය ප්‍රකාශවලට සටහන් | 35 |
| දස අවුරුදු සමාලෝචනය | 80 |
| පාරිභාෂික පද විවරණය | 82 |
| මහ සභා රැස්වීම දැනුම් දීම | 83 |
| පෙරකලාසි පත්‍රය | 84 |
| පෙරකලාසි පත්‍රය පිරවීමේ උපදෙස් | 85 |

## ආයතනික තොරතුරු

**නෛතික ආකෘතිය**

පොදු සීමිත වගකීම් සමාගමකි.

**සමාගම ලියාපදිංචි කිරීමේ අංකය**

PB 67

**අධ්‍යක්ෂවරු**

නිශාන්ත වික්‍රමසිංහ - සභාපති

නිහාල් ජයමාන්න, ජ.නී.

කපිල චන්ද්‍රසේන-අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරි

ෂමීන්ද්‍ර රාජපක්ෂ

මනිලාල් ප්‍රනාන්දු

ලක්ෂ්මී සංගක්කාර

සනත් උක්වත්ත

සුසන්ත රත්නායක

**සමාගමේ ලේකම්**

මිල්ඩ්‍රඩ් පීරිස්

**ලියාපදිංචි කාර්යාලය**

ගුවන් සමාගම් මධ්‍යස්ථානය

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ

කටුනායක

ශ්‍රී ලංකාව

**විගණකවරු**

අර්න්ස්ට් ඇන්ඩ් යංග්

වරලත් ගණකාධිකාරීවරු

තැ.පෙ. 201, ද සේරම් පෙදෙස

කොළඹ 10

## අපගේ දැක්ම

ආසියාවේ වඩාත්ම ප්‍රිය මනාප ගුවන් සමාගම බවට පත්වීම

## අපගේ මෙහෙවර

ගුවන් ප්‍රවාහන ව්‍යාපාර කාර්යයෙහි නිරතව අප සිටින්නෙමු.විශ්වාසදායක හා සුපසන්න ප්‍රවාහන අත්දැකීමක් අප අපගේ සේවා ලාභීන් වෙත සපයන්නෙමු.අප අපගේ ව්‍යාපාරික හවුල්කරුවන් වෙත නව්‍ය, වෘත්තීයමය සහ අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක වූ විවිධ සේවා සලසා දෙන්නෙමු. ශ්‍රී ලංකාව ලාභදායී වශයෙන් අලෙවිකරණය කිරීම හා ශ්‍රී ලංකාවේ සමාජීය සුභසාධනය කෙරෙහි දායක වීම පිළිබඳ කොටස් හිමියන්ගේ අපේක්ෂා අප විසින් සාක්සාත් කරන්නෙමු. අප ප්‍රවීන, පෙරටුගාමී හා අනලස්ව ක්‍රියාත්මක වන කණ්ඩායමකි.අපගේ දායකත්ව මෙහෙවර ප්‍රසාදජනක වූද, ඵලදායී වූද එකකි.

# සුවිශේෂී කරුණු

| | | සමූහය 2013 | සමූහය 2012 | සමාගම 2013 | සමාගම 2012 |
|---|---|---|---|---|---|
| **මූල්‍ය** | | | | | |
| ආදායම් | රු.මි. | 121,407.66 | 94,638.60 | 119,570.90 | 92,867.93 |
| මෙහෙයුම් වියදම | රු.මි. | 143,961.21 | 111,647.29 | 143,972.27 | 111,775.88 |
| බදු පූර්ව අලාභය | රු.මි. | (22,503.54) | (17,197.43) | (17,197.43) | (19,774.74) |
| වර්ෂය සඳහා ශුද්ධ අලාභය | රු.මි. | (22,518.78) | (17,208.38) | (21,749.75) | (19,778.03) |
| ශුද්ධ වත්කම් | රු.මි. | 92,388.40 | 68,998.50 | 89,447.13 | 65,807.97 |
| කොටස් හිමියන්ගේ අරමුදල් | රු.මි. | (7,160.42) | 3,050.08 | (11,695.70) | (2,248.39) |
| **ප්‍රවාහනය** | | | | | |
| මගී ධාරිතාව | ඒ.එස්.කේ. මිලියන | | | 15,944.31 | 14,248.94 |
| සමස්ත ධාරිතාව | ඒ.ටී.කේ. මිලියන | | | 2,186.96 | 1,978.33 |
| ප්‍රවාහනිත මගී සංඛ්‍යාව | ආර්.පී.කේ. මිලියන | | | 12,968.74 | 11,270.23 |
| ප්‍රවාහනිත සමස්ත පැටවුම | ආර්.ටී.කේ. මිලියන | | | 1,513.70 | 1,338.30 |
| මගී පැටවුම් සාධකය | % | | | 81.34 | 79.10 |
| සමස්ත පැටවුම් සාධකය | % | | | 69.22 | 67.65 |
| සමච්ඡේදක පැටවුම් සාධකය | % | | | 90.52 | 88.84 |
| **කාර්ය මණ්ඩල ඵලදායිතාවය** | | | | | |
| පිරිස් බලයේ සාමාන්‍යය | සංඛ්‍යාව | 7,241 | 6,367 | 6,359 | 5,594 |
| ඒක සේවක ආදායම | රු.මිලියන | 16.77 | 14.86 | 18.80 | 16.60 |
| ඒක සේවක අගය ආරෝපණය | රු.මිලියන | (1.12) | (0.65) | (1.14) | (1.32) |
| **ගුවන් යානා ඇණිය** | | | | | |
| A320-200 | සංඛ්‍යාව | | | 8 | 7 |
| A330-200 | සංඛ්‍යාව | | | 7 | 7 |
| A340-300 | සංඛ්‍යාව | | | 6 | 6 |
| ටර්බෝ ඔට ගුවන් යානා | සංඛ්‍යාව | | | 1 | 2 |
| **වසරාවසාන සේවාගත ගුවන් යානා** | **සංඛ්‍යාව** | | | **22** | **22** |

**සභාපතිවරයාගේ විමර්ශනය**

සී/ස ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ 35 වන වාර්ෂික මහා රැස්වීමට මා ඔබ සියලුදෙනා සාදරයෙන් පිළිගනුයේ ඉමහත් සතුටිනි. 2012/13 මූල්‍ය වර්ෂය සඳහා ඔබේ සමාගමේ වාර්ෂික වාර්තාව හා විගණනිත මූල්‍ය ප්‍රකාශ නැවත වරක් ඔබ වෙත ඉදිරිපත් කිරීමට හැකිවීම ගෞරවයක් සේ මම සලකමි.

ජගත් ගුවන් කර්මාන්තයේ දිශානතිය සහ දේශීය ආර්ථික පුනර්ජීවනය යන කරුණුවලට අනුකලනය වෙමින් සමාලෝචිත වර්ෂය "සහබද්ධතාවයේ වසර" යනුවෙන් තේමා ගත කෙරිණි. සමාගමේ වර්තමාන සහ ඉදිරි අවශ්‍යතා සපුරාලීම පිණිස අප සතු සම්පත් උපරිම වශයෙන් යොදා ගනිමින් අපගේ තත්වය තවදුරටත් තහවුරු කර ගැනීමට සැබැවින්ම අපට හැකිවී තිබේ. අපගේ උදාරතම ශක්තිය හා වත්කම වන ශ්‍රීලංකන් ගුවන් සමාගම සතු කාර්ය මණ්ඩලය තුළින් පිළිබිඹු වූ විශිෂ්ටත්වය ද මින් මොනවට නිරූපණය වෙයි.

**ශ්‍රී ලංකාවේ ආර්ථිකය - ස්ථායීව පවතී.**

ලොව බොහෝ දියුණු ආර්ථිකයන් තුළ කඩා වැටීම් සනිටුහන් වීම මධ්‍යයේ වුවද, ඉකුත් දෙවර්ෂය තුළ මෙරට අත්විඳි ආර්ථික වර්ධනයේ ප්‍රකෘතිමත් භාවය හේතුවෙන් ප්‍රසාරණය වූ ඉහළ ව්‍යාපාර හා පාරිභෝගික විශ්වාසය ඉදිරියේ ශ්‍රී ලංකාවේ ආර්ථිකය 2012 වසර තුළ සියයට 6.4 ක්වූ සුවදායී අනුපාතයකින් වැඩි වර්ධනය වූයේය. මීට අමතර වශයෙන්, ගෝලීය හා දේශීය වශයෙන් උද්ගතවූ අභියෝග ගණනාවක් පැවතියද, සිව්වන සමගාමී වර්ෂය සඳහාද තනි සංඛ්‍යාවකින් යුත් උද්ධමන අනුපාතයක් රඳවා ගැනීමට ශ්‍රී ලංකාවේ ආර්ථිකයට හැකි විය. අධි ආනයන ඉල්ලුමක් මගින් බල ගැන්වූ ඉහළ ණය හා මූල්‍ය විස්තාරණයට මෙන්ම පුළුල් වන්නාවූ වෙළඳ හිඟයටද එරෙහිව ඉකුත් සමගාමී දෙවර්ෂය තුළ සියයට 08 ක්වූ ශක්තිමත් ආර්ථික වර්ධනයකින් අනුබල සලසා ගත් මෙම උසස් ව්‍යාපාර හා පාරිභෝගික විශ්වාසය දිරිගන්වන සුළු එකක් වූයේය.

ගෝලීය ඉල්ලුම තුළ පැවති මන්දගාමී ප්‍රකෘතිමත් භාවය සහ සාර්ව ආර්ථික ස්ථාවරභාවය සවිබල ගැන්වීම සඳහා හඳුන්වා දෙන ලද බහුවිධ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මධ්‍යයේ ආර්ථිකය වර්ධනය වූ අතර සියලුම ප්‍රධාන අංශ ඵලදායී දායකත්වයක් සලසා දුන්නේය. විදේශීය වෙළෙඳාම මන්දගාමී ස්වභාවයක් ගැනීමත්, ප්‍රවාහනය ආශ්‍රිත අනු අංශවල පසු බැස්මත් හේතුවෙන් සේවා අංශයේ වර්ධනය මධ්‍යස්ථායී වූයේය.

ශ්‍රී ලංකාවේ ආර්ථිකය වර්ධිත යටිතල පහසුකම් හා හිතකර සාර්ව ආර්ථික මූලාංගයන් තුළින් ප්‍රතිලාභ අත්කර ගනිමින් ඉහළ වර්ධන මාවතක් ඔස්සේ අඛණ්ඩව ඉදිරියට යාමට අපේක්ෂිතය. යටිතල පහසුකම් ආශ්‍රිත රජයේ ආයෝජනය තුළින් වාසි සලසා ගැනීමට පෞද්ගලික අංශය හා එමඟින් තම නිෂ්පාදන ධාරිතාව ව්‍යාප්ත කර ගැනීමට ඔවුනට පහසුකම් සලසා දීම අපේක්ෂිත මධ්‍ය හා කෙටි කාලීන වර්ධන ඉලක්ක මුදුන්පත් කර ගැනීම උදෙසා බෙහෙවින් වැදගත් වේ.

**ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය - සීඝ්‍රතාව අත්කර ගනී.**

දස ලක්ෂයකටත් වඩා අධික වාර්තාගත සංචාරකයන් පිරිසක් රට තුළට ගෙන්වා ගනිමින් ස්වකීය ඉලක්ක අභිබවා සිටි ශ්‍රී ලංකාව රටේ සංචාරක කර්මාන්ත වර්ධනයේ සීඝ්‍රතාව අත්පත් කරගැනීමට නොකඩවා කටයුතු කළේය. ලක්ෂ දස වැනි මගියා චීන රාජ්‍යයේ සිට ශ්‍රී ලංකාව කරා කැඳවා ගෙන ඒමට ශ්‍රීලංකන් ගුවන් සමාගම වරම් ලැබීය. ඉකුත් වසර හා සසඳන කළ සමාලෝචිත වසර තුළ සංචාරක පැමිණීම් 17.5% කින් ඉහළ යාමක් වාර්තා කළ අතර ශ්‍රී ලංකාවේ සමස්ත සංචාරක ව්‍යාපාර ඉතිහාසය තුළ මෙරටට පැමිණීම සනිටුහන් කළ ඉහළම සංචාරක සංඛ්‍යාව වාර්තා කිරීමට වසර 2012 දෙසැම්බර් මාසයට හැකි විය. විශේෂයෙන් යුරෝපීය වෙළෙඳපළ තුළ විද්‍යාමානවූ ආර්ථික ප්‍රකෘතිමත් භාවයත් සමඟ සංචාරක පැමිණීමෙහි අපේක්ෂිත ඉහළයාම හේතුවෙන් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය තවදුරටත් විවර්ධිත මුහුණුවරක් ගනු ලබනු ඇති අතර වසර 2013 අවසානය වන විට මිලියන 1.25 ක සංචාරකයන් පිරිසක් මෙරටට ගෙන්වා ගැනීමේ ඉලක්කය සපුරා ගැනීම, අදාළ සංචාරක ගමනාන්ත සම්බන්ධයෙන් සංචාරක ව්‍යාපාරය මෙන්ම ඊට අදාළ බලධාරීන් විසින් නිසි අලෙවිකරණයට හා ප්‍රවර්ධනයට ප්‍රමුඛතාව සලසා දීම තුළින් සාක්සාත් කරගනු හැකි වෙතැයි විශ්වාස කෙරේ. අභිනව වෙළෙඳපළ සොයා බලන අතරම දැනට පවත්නා වෙළඳපළ ඒ අනුවම පවත්වාගෙන යමින් ආයතනික හා රාජ්‍ය අංශය සමඟ කටයුතු කරමින් ශ්‍රී ලංකාවේ සංචාරක

කර්මාන්තය ස්වකීය අලෙවි උපාය මාර්ග සැලසුම්කරණයෙහි දැනට යෙදී සිටියි. මන්දගාමී මාස තුළ මගී ගැවසුම්හි අඩුව පිරවීමේ කාර්යයෙහිලා ප්‍රමුඛ කාර්ය භාරයක් ඉටුකළ හැකි කලාපීය වෙළඳපළ හා අභිනව වෙළඳපළ කරා නැඹුරුවක් සහිතවූ සංචාරක කර්මාන්තය නැංවීමේ අටියෙන් සකසන ලද නව ව්‍යාපාර වැඩ පිළිවෙළක් කෙරෙහි දැනට අවධානය යොමුව තිබේ.

**වැදගත් කමක් සහිත වූ වර්ෂයකි.**

ගතවූ වසර ශ්‍රී ලංකාවේ ගුවන් සේවා කර්මාන්තයෙහිලා වැදගත් වූ සංසිද්ධීන් දෙකක් සනිටුහන් කළේය. ශ්‍රී ලංකාවේ ගුවන් සේවා කර්මාන්තයට සිය වසරක් සපිරීමත්, දිවයිනෙහි දකුණු දිග ප්‍රදේශයෙහි ශ්‍රී ලංකාවේ දෙවන ජාත්‍යන්තර ගුවන් තොටුපළ විවෘතවීමත් එකී සුවිශේෂී සන්ධිස්ථාන වූයේය.

**ශ්‍රී ලංකාවේ ගුවන් ගමන් සේවයේ ශත වර්ෂය සැමරීම.**

ගුවන් ගමන් සේවා ක්ෂේත්‍රයෙහි ශත වර්ෂ සැමරුම සමාලෝචිත වසර තුළ යෙදී තිබීම සැබැවින්ම ජාතිකාභිමානය දනවන කරුණක් වූ අතර, ඒ සම්බන්ධයෙන් පවත්වන ලද සැමරුම් උත්සවවල ක්‍රියාශීලී හවුල් කරුවකු වශයෙන් ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන් සේවා කර්මාන්තයෙහි කොඳු නාරටිය ලෙස සැලකෙන ඔබේ සමාගමට ඒවාට දායකත්වය සලසාදීම ගෞරවයක් වූයේය.

**මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ විවෘත වෙයි.**

ජාතික ප්‍රවාහකයා වන ඔබේ සමාගමට ඉහළ ප්‍රමුඛත්වයක් ගෙන දුන් ගුවන් සේවා ඉතිහාසයේ අනෙකුත් සන්ධිස්ථානය වූයේ මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ ලෙස ශ්‍රී ලංකාවේ දෙවන ජාත්‍යන්තර ගුවන් තොටුපළ ස්ථාපනය වීමයි. එම ගුවන් තොටුපළ හරහා යාම් ඊම් ක්‍රියාත්මක කෙරෙන සියලුම ගුවන් යානාවලට සේවා සැපයිම සඳහා එහි පරිශ්‍රය තුළ නඩත්තු හා ගොඩබිම් මෙහෙයම් කටයුතු මෙන්ම ගුවන් භාණ්ඩ මෙහෙයුම් හා ශ්‍රීලංකන් කේටරින් සමාගමේ ආහාරපාන සැපයුම් කටයුතු යනාදිය ඉටු කිරීම පිණිස අවශ්‍ය වන්නාවූ වැඩ පිළිවෙළ ශ්‍රීලංකන් ගුවන් සමාගම විසින් සම්පාදනය කරනු ලැබ තිබේ.

**දියුණු මට්මක් සලසා ගත් වර්ෂයකි.**
**දිගු හා කෙටි කාලීන ගුවන් යානා ඇණි සැලසුම්කරණය**

කෙටි කාලීන වශයෙන්, දැනට අප සතුව පවත්නා ගුවන්යානා උත්ශ්‍රේණිගත කිරීමේ හා නවීකරණය කිරීමේ කටයුතු වල අප නියැලී සිටින අතර දිගු කාලීන වශයෙන් අපගේ අපේක්ෂාව වනුයේ, පසුගිය වසර ගණනාව මුළුල්ලේ අපට සේවා සලසා දුන් සියලුම A 340 වර්ගයේ එයාබස් ගුවන්යානා වෙනුවට නව ගුවන් යානා ප්‍රතිස්ථාපනය කිරීමයි. එහිලා A 330 – 300 වර්ගයේ නවීන එයාබස් ගුවන් යානා 6 ක් ලබා ගැනීම සඳහා අරමුදල් ආයෝජනය කෙරෙන අතර එහි අවසාන ඉලක්කය වනුයේ, A 350 – 900 වර්ගයේ ඉදිරි පරම්පරාවට අයත් නවතම එයාබස් ගුවන් යානා සේවයට යොදා ගැනීම තුළින් A 350 – 200 වර්ගයේ එයාබස් ගුවන් යානා සේවයෙන් ඉවත් කිරීමයි. ගුවන් යානා ඇණිය ප්‍රතිස්ථාපනය කිරිමේ දීර්ඝ කාලීන සැලසුම වනුයේ, කාර්යක්ෂම ඉන්ධන දහනයක් සහිත "මතු පරම්පරාවට" අයත් නවීනතම පුළුල් බඳ හා පටු බඳ ගුවන් යානා වලින් සමස්ත යානා ඇණියම සජ්ජිත කරනු ලැබීමයි. ඉන්ධන දහනය හා නඩත්තු කටයුතු ආශ්‍රිත වියදම් අඩුකර ගැනීම මගින් ගුවන් සමාගමේ ඍජු පිරිවැය ව්‍යුහය මෙම ප්‍රයත්නය තුළින් සැලකිය යුතු පරිදි පරිවර්තනයකට භාජනය වනු ඇත. නවතම පහසුකම් වලින් සමන්විත අති සුපිරි තත්වයේ ආසන හා යානාස්ථ විනෝදාත්මක පද්ධති සවි කෙරුණු අභිනව ගුවන් යානා, වෙනත් තරහකාරී සේවා පිරිනැමුම් හා උරෙනුර ගැටෙමින් හෝ එකී පහසුකම් ඉක්මවා යමින් සිටිනු ඇති අතර ආදායම් උත්පාදන අවස්ථා කෙරෙහිද ධනාත්මකව බලපානු ඇත.

**ජාතියේ උන්නතිය බල ගැන්වීම**

ජාතික ගුවන් ප්‍රවාහකයා වශයෙන් ඔබේ සමාගම විවිධ මූලාරම්භ වෙත අවතීර්ණ වෙමින් මෙරට ආර්ථික වර්ධනයේ ඉදිරි නියමුවා ලෙස නොකඩවා කටයුතු කළේය.

- ගුවන් සේවා කේන්ද්‍රස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව පරිවර්තනය කරනු ලැබීමේ ශ්‍රී ලංකා රජයේ දැක්ම අනුව කටයුතු කරමින් ආදායම් අවස්ථා වර්ධනය කර ගැනීමේ අරමුණ පෙරදැරිව අප අපගේ නඩත්තු, අලුත්වැඩියා හා පිරිවැඩියා සේවා පුළුල් බවට පත් කෙරිණි.
- 2013/14 කාල පරිච්ඡේදය තුළ දෙවන A 330 වර්ගයේ පූර්ණ පියසර අනුකාරක සිමියුලේටරයක් සවි කිරීම සඳහා එළඹී ගිවිසුම තුළින් අපගේ වර්තමාන සේවාලාභීන් වෙත පුළුල් පරාසයක විහිද ගිය සේවා පිරිනැමීමට හැකියාව සැලසෙනු ඇත.
- ගොඩබිම් හා ගුවන් භාණ්ඩ මෙහෙයුම් උපකරණ සම්බන්ධයෙන් යොදවනු ලබන අතිරේක ආයෝජනය මගින් තෘතීය පාර්ශව සේවා සපයන එකම සැපයුම්කරු වශයෙන් සමාගම කොළඹ හා මත්තල ආශ්‍රිත ගොඩබිම් මෙහෙයුම් කටයුතුවල කාර්යක්ෂමතාව වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.
- ශ්‍රීලංකනේහාලිඩේස් නමැති සමාගමේ නිවාඩු ව්‍යාපාරික අංශය, නිවාඩු ගත කිරීම සඳහා මෙරටට පැමිණෙන සංචාරකයන්ට විවිධ විකල්ප තෝරා ගැනීම සඳහා පුළුල් තෝරා ගැනීම් මාලාවක් පිරිනමමින් මෙරට බොහෝ ප්‍රමුඛ හෝටල්, සංචාරක මෙහෙයුම් කරුවන් සහ අනෙකුත් සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කරයි.

**ජයග්‍රහණ**

සාර්ථකත්වය අත්කර ගැනීමේ අපගේ දිගු සම්ප්‍රදාය තුළ ගරු සම්මාන දිනා ගැනීම් ආශ්‍රිත තවත් එක් වසරක් විද්‍යාමාන වූයේය.

- ආසියානු සහ ඔස්ට්‍රලේසියානු කලාපයේ "ඒපෙක්ස්" විශිෂ්ටතා සම්මානය (එයාලයින් පැසෙන්ජ එක්ස්පීරියන්ස් ඇසෝෂියේෂන්) - 2012.
- ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම සඳහා වූ ජාතික විදුලි බලශක්ති කාර්යක්ෂමතා සම්මානය - 2012.
- ලොව ප්‍රමුඛ පුහුණු මධ්‍යස්ථාන දහයෙන් එකක් ලෙස "අයටා" ප්‍රිමියසර්කල් හී ප්‍රවේශකත්වය සලසා ගැනීම.

**වර්ධනයේ වසරකි - 2012/13 සඳහා මූල්‍ය විමර්ශනය**

- 2012/13 මූල්‍ය වර්ෂය සඳහා සමාගමේ ආදායම රුපියල් මිලයන 119,570.90 ක්වූ එය, රුපියල් මිලියන 92,867.93 ක්වූ 2011/12 වර්ෂයේ ආදායම හා සංසන්දනාත්මකව 28.75% ක වර්ධනයක් වූයේය.
- මෙහෙයුම් වියදම රුපියල් මිලියන 143,972.27 ක් වූ අතර එය රුපියල් මිලියන 111,775.88 ක්වූ ඉකුත් වසරේ මෙහෙයුම් වියදම හා සංසන්දනාත්මකව 28.80% ක ඉහළ යාමක් දැක්වූයේය.
- මගී ධාරිතාව මිලියන 14,248.94 ක්වූ ඉකුත් වර්ෂයට අදාළ ප්‍රමාණයේ සිට මිලියන 15,944.31 ක් දක්වාවූ ලබාගත හැකි ආසන කිලෝ මීටර් ප්‍රමාණයක් දක්වා ඉහළ ගියේය.
- මගී කිලෝ මීටර ප්‍රමාණ ආදායම ඉකුත් වසරේ අදාළ ආදායම වූ මිලියන 11,270.23 ක්වූ ප්‍රමාණයට සංසන්දනාත්මකව මිලියන 12,968.74 ක මුළු අගයක් වාර්තා කළේය.
- 2012/13 වර්ෂය තුළ මගී පැටවුම් සාධකය 81.34% ක්වූ අතර එය ඉකුත් වසර එල්ලේ 79.10% ක ඉහළ යාමකි.

එසේ වුවද, රුපියල් මිලියන 19,774.74 ක්වූ ඉකුත් වසරේ සමාගමේ ශුද්ධ අලාභය 2012/13 වර්ෂය තුළ රුපියල් මිලියන 21,749.75 දක්වා පහත දැක්වෙන හේතු නිසා ඉහළ ගියේය.

- අධික ඉන්ධන පිරිවැය.
- යුරෝපයේ ආර්ථික අවපාතය හා අනෙකුත් ගුවන් සමාගම් වෙතින් එල්ල වූ තරඟය හේතුවෙන් සතුටුදායක මට්ටමට වඩා අඩු ප්‍රමාණයේ ලාභ අත්වීම.
- ගුවන් යානාවල කැබින් උත්ශ්‍රේණිගත කිරීමේ වැඩ සටහන ඇතුළුව අතිරේක ධාරිතාවක් අත්කර ගැනීමේ හා උපස්ථම්භක සේවා වැඩි වර්ධනය කිරීමේ වැදගත් ආයෝජන සිදු කිරීම. ඒවායේ සමස්ත ප්‍රතිලාභය ඉදිරි වර්ෂවලදී අත්කරගත හැකිවනු ඇත.

**සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගම**

සී/ස ශ්‍රීලංකන් කේටරින් සමාගම තවත් සාර්ථක වසරක් සනිටුහන් කරමින් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ සත්‍ය තත්වය සමනය පිණිස අනුබලයක් වූයේය. මීට අමතරව, සම්මානලාභී ගුවන් ප්‍රවාහකයෙකු වූ එමිරේට්ස් එයාර්ලයින්ස් සමාගමේ "එමිරේට්ස් ලෝන්ජ්" සඳහා අහාරපාන සේවා සැපයුම අරඹමින් සී/ස ශ්‍රී ලංකා කේටරින් සමාගම සිය ව්‍යාපාරික කටයුතු විවිධාංගීකරණයට හසු කළේය. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළින් මෙහෙයුම් කටයුතු සලසා ගන්නා සේවා දායක ගුවන් සමාගම් කිහිපයකට ආහාර පාන සේවා සපයාදීම සඳහා සී/ස ශ්‍රීලංකන් කේටරින් සමාගම සමාලෝචිත වසර තුළ ගිවිසුම් වලටද එළඹියේය. ඉදිරි මුදල් වර්ෂය තුළදීද තවත් වැඩි ගුවන් සමාගම් ගණනාවකට සිය සේවා සපායාදීමට හැකිවනු ඇතැයි සී/ස ශ්‍රීලංකන් කේටරින් සමාගම අපේක්ෂා කරයි. මත්තල ගුවන් තොටුපළ පරිශ්‍රයේ ඉදිවන අභිනව පියසර මුළුතැන්ගෙය සඳහා ද සමාගම වැඩි දුරටත් අරමුදල් ආයෝජනය කර තිබේ.

පහත දැක්වෙන වටිනා සම්මානවලින් පිදුම් ලබමින් ශ්‍රීලංකන් කේටරින් සමාගම ස්වකීය සමාගම් සමූහයේ විශිෂ්ටත්වය පිළිබඳව වැඩෙමින් පවත්නා කීර්තිනාමය තව දුරටත් ඉහළ තලයක් කරා රැගෙන යාමට කටයුතු කළේය.

- ජාත්‍යන්තර සංචාරක ආහාරපාන සේවා සැපයුම් සංගමය විසින් "ප්‍රබෝධනය" වර්ගීකරණය යටතේ පිරිනමනු ලබන "සුවදායී ආහාර/ මනා සෞඛ්‍ය පිණිස සොබාදම් මග" සඳහා වූ මර්කරි සම්මානය.
- ජාතික විදුල්ක බලශක්ති කාර්යක්ෂමතා සම්මානය - 2012.
- සී/ස ශ්‍රීලංකන් කේටරින් සමාගම තත්ව කළමනාකරණ පද්ධති, ආහාර සුරක්ෂිතතා කළමනාකරණ පද්ධති හා පාරිසරික කළමනාකරණ පද්ධති යන ත්‍රිත්ව සහතිකකරණය හිමි ගුවන්යානා ආහාර පාන සැපයුම්කාර ආයතන කීපයකින් එක් ආයතනයක් වේ. සමාලෝචිත වසර තුළ මෙම සියලු ක්ෂේත්‍රයන්හී ප්‍රමිති උත්ශ්‍රේණිගත කිරීම සඳහා සමාගම ඊට අදාළ විගණනය සම්පූර්ණ කළේය.

**අනාගතය - උඩු පියසරට සූදානම්ය.**

ශ්‍රීලංකන් ගුවන් සමාගම ස්වකීය ගුවන් ගමන් ජාල සේවය උපරිම තත්වයට පත්කර ගැනීමට සහ එහි තරඟකාරී පිරිවැය පදනම පවත්වාගෙන යාමට කටයුතු කරන අතරම මගී වපසරිය වර්ධනය කරගනිමින් සහ උපස්ථම්භක ආදායම් හා සන්ධාන ප්‍රතිලාභ උත්පාදනය කරගනිමින් තම ආදායම් මාර්ග වැඩිකර ගැනීම ඉලක්ක කරගත් ප්‍රගමනදායී ව්‍යාපාරික සැලැස්මක් ද ක්‍රියාවට නංවයි.

ශ්‍රී ලංකා රජය, අප ගුවන් සමාගමේ ශේෂ පත්‍රය සවිමත් කිරීම සඳහාත්, එහි ගුවන්යානා ඇණිය නවීකරණය පිණිස අනුබල සලසාදීම සඳහාත් වසර 2016 දක්වා වූ ඉදිරියට එළඹෙන වර්ෂ කීපය මුළුල්ලේම අඛණ්ඩ ප්‍රාග්ධන නික්ෂේපණයක් සහිතව නිරන්තර සහාය පළකරමින් සමාගම හා බැඳී සිටියේය.

පහත දැක්වෙන කටයුතු අනුසාරයෙන් මගී ආදායම් උපරිම තත්වයට ගෙන ඒමට ගුවන් සමාගම සැලසුම් කරයි:

- ශ්‍රී ලංකාව වෙත ලඟා වන නැවතුම් රහිත ගුවන් සේවා ආශ්‍රිත සිය තරඟකාරිත්ව වාසිය තුළින් වැඩි ප්‍රයෝජන අත්කර ගැනීම.
- උත්ශ්‍රේණිගත කරන ලද ව්‍යාපාරික පංති නිමැවුම් අනුසාරයෙන් වූ අධි මිල වාසි ඉහළ නංවා ගැනීම.
- පිළිගත හැකි ලාභ මට්ටම් අධි පැටවුම් සාධක පවත්වා ගැනීමේ අටියෙන් ආදායම් කළමනාකරණ චර්යා හා පද්ධති වැඩි වර්ධනය කර ගැනීම.
- ප්‍රමුඛ අධි ජනාශ්‍රිත හා ආර්ථික මධ්‍යස්ථාන සමඟ ගුවන් ගමන් ජාල සේවය සම්බන්ධීකරණය කිරීම.
- කොළඹ ගුවන් තොටුපළ පුළුල් කිරීමේ කාර්යය හා මෙරට දෙවන ජාත්‍යන්තර ගුවන් තොටුපළ විවෘත කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය හා ජාත්‍යන්තර වශයෙන් වූ සැලකිය යුතු ආයෝජන සපයා ගැනීම.

ඒකීය ලොවක් සන්ධානයේ සාමාජිකත්වය කරණකොට ගෙන වඩා හොඳ විශ්ව සබඳතාවක් පිරිනැම්ම පිණිස ස්වකීය ගුවන් ගමන් කාල සටහන් එම සන්ධාන හවුල් කරුවන් හා සම්බන්ධීකරණය කර ගැනීම මඟින් සාපේක්ෂ වශයෙන් ඉහළ වෙළඳපළ භාගයක් අත්කර ගැනීමට සමාගමට හැකියාව ලැබෙනු ඇත.

**අවසානය**

ශ්‍රී ලංකාවේ ගුවන් සේවයේ හා සංචාරක කර්මාන්තයේ ප්‍රගමනය පිළිබඳව අඛණ්ඩව දැඩි කැපවීමකින් කටයුතු කරන ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් එහිලා සලසා දෙනු ලබන මහඟු දායකත්වය වෙනුවෙන් මම මගේ හෘදයංගම කෘතඥතාව එතුමා වෙත පුදකරමි. ගරු ආර්ථික සංවර්ධන අමාත්‍ය තුමාටත්, ගරු සිවිල් ගුවන් සේවා අමාත්‍ය තුමාටත් ජාතික ගුවන් ප්‍රවාහකයා වෙත දක්වන ලද නිබඳ අනුබලය වෙනුවෙන් ද මගේ කෘතවේදිත්වය මෙහිලා පළකරමි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්ටද, ප්‍රධාන විධායක නිලධාරිවරයාටද, සමාගමේ කළමනාකරණ කණ්ඩායම හා කාර්ය මණ්ඩලයටද ඔවුන්ගේ අප්‍රතිහත වෙහෙසකර කාර්යභාරය හා කැපවීම වෙනුවෙන් ඔවුන් වෙත මාගේ තුති ප්‍රණාමය මෙයින් පිරිනමමි. ශ්‍රීලංකන් එයාර්ලයින්ස් නමැති ඔබේ සමාගම වන ජාතික ගුවන් ප්‍රවාහකයාගේ උන්නතිය උදෙසා දක්වන ලද නිරන්තර සහාය වෙනුවෙන් ශ්‍රී ලංකා රජය ඇතුළු අපගේ කොටස් හිමියන් වෙත ද මම කෘතවේදී වෙමි. ඔබට ස්තූතියි.

***අ/කළේ : නිශාන්ත වික්‍රමසිංහ***
***සභාපති***
***2013 ජූලි මස 30 වන දින***

**ප්‍රධාන විධායක නිලධාරිවරයාගේ සමාලෝචනය**

2012/13 වර්ෂය සඳහා වූ මෙහෙයුම් කටයුතු සමාලෝචනය හා ඔබ ආයතයේ අනාගත ප්‍රගතිය පිළිබඳ ගුවන් සමාගමේ සැලැස්ම ඔබ වෙත නැවත වරක් මා ඉදිරිපත්කර සිටිනුයේ ගෞරවයෙනි.

දෛනිකව ගුවන් ගමන් 80,000 කින් යුක්තව මිලියන 10ක් තරම්වූ ගුවන් මගී පිරිසක් ප්‍රවාහනය කරමින් 24,000 ක්වූ වාණිජ ගුවන් යානා සංඛ්‍යාවක් අහස් කුස සිසාරා ක්‍රියාත්මක වන පසුබිමක් සහිතව ලොව ඕනෑම ප්‍රවාහන මාධ්‍යයක් අතුරින් ඉහළම පැටවුම් සාධකයකට උරදෙන ගුවන් සේවා ක්ෂේත්‍රය අද්විතීය කර්මාන්තයකි. වාර්ෂිකව ඇමරිකන් ඩොලර් බිලියන 539 ක මුදල් ප්‍රමාණයක් යොදවනු ලබන මෙම කර්මාන්තය, ජගත් ආර්ථිකය කෙරෙහි ඉහළ බහුවිධ ක්‍රියාකාරිත්වයක් ජනනය කරන ප්‍රමුඛ දායකයෙකි. එසේ වුවද,දැඩි තරඟකාරිත්වය හා අධික ඉන්ධන පිරිවැය යන කරුණු මෙන්ම ව්‍යාපාරික ශුද්ධ ලාභය බොහෝ විට ගිලිහී යන ප්‍රවනතාවක් සහිත ඍජුවම මැනිය නොහැකි අවාසිදායක දායකත්ව කරුණු ද හේතුවෙන් අනෙකුත් කර්මාන්ත හා සසඳන කළ ආයෝජිත අරමුදල් මත උත්පාදනය වන ඍජු ලාභ ප්‍රමාණය ගුවන් සේවා කර්මාන්ත අංශය තුළ සාමාන්‍යයෙන් පහත් මට්ටමක් ගනී. ගුවන් ප්‍රවාහන කර්මාන්තය, අගය හා බැඳී දාමය තුළ එහි සියලු පරිශීලකයන් සඳහා සුවිශාල වටිනාකමක් ජනිත කෙරෙනු පිණිස නිරන්තරව ක්‍රියා කරන අතර එය ගුවන් සමාගම්හී කොටස් ආයෝජනය කරන්නවුන් වෙත පිරිනමා සිටිනුයේ ඌණ ලාභ ප්‍රමාණයකි.

ජාතික ප්‍රවාහකයා වන අප ගුවන් සමාගම, දළ ජාතික නිෂ්පාදිතයේ 2.2% ක්වූ ඇමරිකන් ඩොලර් බිලියන 1.3 ක මුදලක් උත්තපාදනය කරමින් රටේ ආර්ථිකයට මහඟු දායකත්වයක් සලසාදීමේ කාර්ය භාරය අඛණ්ඩව පවත්වාගෙන යයි. එම දායකත්වය තව දුරටත් වර්ධනය කර ගැනීමේ සැලකිය යුතු හැකියාවක් ද අප ගුවන් සමාගම සතුය.

**සමාලෝචිත වර්ෂය**

ගතවූ වසර අපට විවිධාකාර අංශවලින් වැදගත්වූ එකකි. එය, ඔබේ සමාගම හා බැඳී ඉතිහාසය ආශ්‍රිතව ඉකුත් වසරේදී මුල පුරන ලද නව පරිච්ඡේදය මත තව දුරටත් ගොඩනැගෙමින් අරමුදල් ආයෝජනය කිරීම හා අදාළ වැඩ පිළිවෙළ ක්‍රියාවට නැංවීම යන ව්‍යායාමය තුළ ස්ථාවරවීමේ මෙන්ම නව යුගයක් ඇරඹීමේ ද වර්ෂයක් වූයේය. අප රට තුළ නොකඩවා සිදුවන ආර්ථික හා යටිතල පහසුකම් සංවර්ධනයේ ප්‍රගතිය සේම ජාතික ප්‍රවාහකයා වන අප සමාගමද ඊට නියමිත අපේක්ෂා මුදුන් පමුණුවා ගැනීම උදෙසා අනවරතයෙන් ක්‍රියාත්මක වෙමින් සිටියි. සුපුරුදු පරිදි ගුවන් සමාගමේ කටයුතුවලට බලපෑම් එල්ල කළ ගෝලීය කර්මාන්ත ක්ෂේත්‍රයේ සාමාන්‍ය පසුබැසුම් ප්‍රවනතාව සහිත වූ සමාලෝචිත කාලපරිච්ඡේදය ඇත්ත වශයෙන්ම අභියෝගාත්මක වර්ෂයක් වූයේය. කෙසේ වුවද, අපගේ කාර්ය සාධනය කෙරෙහි අහිතකර ලෙස බලපෑ බාධක නොතකා අපගේ ව්‍යාපාරික සැලසුම් මාවත තුළ අවතීර්ණව සිටීමටත්, අපගේ ඉලක්කය කරා ක්‍රමානුකූලව ගමන් කිරීමටත් අපට හැකිවිය. පසුගිය දශකය තුළ ජෙට් ගුවන් යානා ඉන්ධන මිල 261% කින් ඉහළ යමින් සමාගමේ මෙහෙයුම් කටයුතු පිරිවැයද සීඝ්‍රයෙන් ඉහළ තලයකට ඇද දැමීමේ කාර්යය නොකඩවා සිදු කළේය. අපගේ ඒකක පිරිවැය, එකම කලාපයේ මෙහෙයුම් කාර්යයන් ඉටු කරන අනෙකුත් ගුවන් සමාගම්වලට සංසන්දනාත්මකව තරඟකාරී මට්ටමක පැවතිය ද, ඉකුත් වසරේ අපගේ මෙහෙයුම් කටයුතු වියදමින් 47% ක් ජෙට් යානා ඉන්ධන වෙනුවෙන් වෙන් වූ අතර ඉහළ යන ඉන්ධන මිලද අදායම සමඟ සමාන්තරව ගමන් නොකළේය. සමාලෝචිත වසර තුළ ආයෝජන කාර්යයෙහි අඛණ්ඩව නිරත වීමට අපට අවස්ථාව සලසා දෙමින් 2011 ජූලි මාසයෙදී ශ්‍රී ලංකා රජය විසින් අනුමත කරන ලද ඇමරිකන් ඩොලර් මිලියන 500 ක් වූ ආයෝජනයේ දෙවන මුදල් කොටස 2013 මාර්තු මාසයේදී අප වෙත ලැබුණි. එය සැබැවින්ම ඔබේ සමාගම ප්‍රගතියේ නව මාවතක් ඔස්සේ ගමන් කරවන වැදගත් පියවරක් වනු ඇත.

ගතවූ අතීතය තුළ ආයෝජන සම්බන්ධයෙන් සිදුවූ ප්‍රමාදය මධ්‍යයේ වුවද, ජාතික ගුවන් ප්‍රවාහකයා ලෙස අප විසින් බොහෝදෑ ඉටුකරනු ලැබ ඇති අතර ජාතික අභිවෘධියෙහිලා අපගේ දායකත්වය අති මහත්ය. සමාලෝචිත වසර තුළ අප විසින් අත්කර ගෙන ඇති සැලකිය යුතු ජයග්‍රහණ පහත පෙළ ගස්වා ඇත.

- පැටවුම් සාධකය ඉහළ නැංවීම සඳහා ව්‍යාපාර පංති නිමැවුමක් අදියරගතව හඳුන්වා දීම. පසුගිය වසර හා සසඳන කළ ව්‍යාපාර පංති මගී සංඛ්‍යාව 48% කින් ඉහළ ගියේය.
- මගී ඵලදාවෙහි වැඩිවීමක් ඇතිකළ නව පද්ධති හා ගාස්තු පංති ප්‍රතිඵකෙල්ල කිරීම් හඳුන්වාදීම මගින් හා විශිෂ්ට කර්මාන්ත චර්යා අනුගමනය කිරීම මගින් ආදායම් කළමනාකරණ කර්තව්‍යය වැඩි දියුණු කෙරිණි.

- වෙළෙඳපළ ප්‍රවනතා පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම සඳහාත්, ඒවා සම්බන්ධයෙන් නිවැරදි ලෙස පුරෝකථන පළ කිරීම සඳහාත් වඩා දියුණු දත්ත හා මෙවලම්හී ආයෝජනය සිදු කෙරේ.
- අනුපූරක අදායම් ඉහළ නැංවීම සඳහා නව අගය ආරෝපිත ප්‍රවාහ දියත් කිරීම.
- අප සතුව දැනට පවත්නා පටු බඳ ගුවන් යානා වෙනුවට අති නවීන වැඩි ඉන්ධන කාර්යක්ෂමතාවක් සහිත ගුවන් යානා යොදවමින් සමාගමේ යානා ඇණිය ප්‍රතිස්ථාපනය කිරීමේ කටයුතු නොකඩවා ඉටු කෙරුණි.
- ඇමඩේයුස් ඕල්ටී ගුවන් මගී සේවා පද්ධතිය හඳුන්වා දෙමින් දැඩි තරඟකාරී පරිසරයක් තුළින් එල්ල වන අභියෝග ජයගැනීමේ අරමුණ පෙරදැරිව අපගේ තාක්ෂණවේදය උත්ශ්‍රේණිගත කිරීමේ වැඩ සටහනක් වෙත අවතීර්ණවූ අතර අප සමාගම, මෙම කර්මාන්ත ප්‍රමුඛ තාක්ෂණය අනුගමනය කරන කලාපය තුළ සිටින ප්‍රථම ගුවන් ප්‍රවාහන ආයතනය වූයේය. මෙම ක්‍රමය අපගේ සේවා සම්පාදනය වැඩි වර්ධනය කරන අතරම අප සමාගම පෙර කිසි දිනකටත් වඩා සේවාදායක කේන්ද්‍රීය ගුවන් සේවයක් බවට පත්කර ගැනීමට අපට හැකිවන පරිදි සමාගමේ තොරතුරු තාක්ෂණ ක්‍රියාවලිය සැබැවින්ම නවීකරණය කරනු ඇත. ඉදිරි මූල්‍ය වර්ෂය එනම්, 2013/14 සිට ක්‍රියාත්මක වන පරිදි මෙම ගිවිසුම අපගේ කාර්ය මණ්ඩලයටත්, ගුවන් මගීන්ටත් හවුල්කාර පාර්ශව වලටත් අතිශය වැදගත් එකක් වනු ඇත.
- ඒකීය ලොවක් විශ්ව සන්ධානය තුළ අපගේ සාමාජිකත්වය පිළිගැනීමෙන් අනතුරුව ඊලඟ මූල්‍ය වර්ෂය තුළ එකී සන්ධානය හා අනුගත වීමේ අනිවාර්ය නියමයන් සපුරාලීම පිණිස සැලකිය යුතු ප්‍රගතියක් අප විසින් අත්කර ගනු ලැබ තිබේ.
- ඵලදායිතාව වර්ධනය සඳහාත්, භාණ්ඩ බර හා ඉන්ධන ඉතුරුම් සලසා ගැනීම සඳහාත් අයිපෑඩ් පදනම් කර ගත් විද්‍යුත් ගුවන් පියසර මළු හඳුන්වා දෙනු ලැබිණ.
- ඉකුත් වසර හා සසඳන කළ සමාලෝචිත වසර තුළ අපගේ මෙහෙයුම් ආන්තිකය සියයට හයක ප්‍රතිශත ලකුණු සංඛ්‍යාවකින් ඉහළ ගොස් තිබීම වැදගත් ප්‍රවනතාවක් වූයේය.

**ඒකීය ලොවක් සන්ධානයේ සාමාජිකත්වය**

ජගත් කීර්තියක් සහිත ඒකීය ලොවක් ගුවන් සමාගම් සන්ධානයේ සාමාජිකත්වයට බැඳෙන ලෙස සමාලෝචිත වසර තුළ ඔබේ ගුවන් සමාගමට ඇරයුම් ලැබී ඇති අතර 2014 වසරේ මුල් භාගය තුළ ඒ හා සන්ධානගත වීමට දැන් සියලු කටයුතු සූදානම්ය. ගුවන් සමාගම් ව්‍යාපාර ක්ෂේත්‍රයේ විශාලතම හා විශිෂ්ටතම වෙළෙඳ සන්නාම හා උරෙනුර ගැටෙමින් පියසර කාර්යයෙහි නිරතවීම යනු, අප ගුවන් සමාගමේ වර්ධන උපාය මාර්ගයෙහිලා සහාය වෙමින් ලොව පුරා පිහිටි අභිනව ගමනාන්ත 800 කටත් වැඩි ප්‍රමාණයක සබඳතාව සහිතව අපගේ ව්‍යාපාරික පරාසය පුළුල්වන්නා වූ අතිශය වැදගත් සන්ධානගත වීමකි. ඒකීය ලෝක සන්ධානය "විශිෂ්ටතම ගුවන් සමාගම් සන්ධානය" යනුවෙන් වූ ප්‍රමුඛ ජාත්‍යන්තර සම්මාන වලින් පහක්ම දැනටමත් හිමිකර ගෙන ඇති ආයතනයකි. යම් ලෝක ගුවන් ගමන් සන්ධාන කිසිවකට උප මහාද්වීපයෙන් බැඳුනු ප්‍රථම ගුවන් සමාගම වනුයේ ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ආයතනයයි. එමඟින්, පුළුල් ගුවන් ගමන් ජාල සේවයකට ප්‍රවේශය සලසා ගැනීම සඳහා ඒකීය ලෝක සන්ධානයට අයත් මොනයම් හෝ ගුවන් සමාගමක් වෙතින් පියසර සැතපුම් උපයා ගැනීමේ හා මුදා ගැනීමේ අවස්ථාව සලසා ගැනීම වැනි වැඩිමනත් සේවා හා ප්‍රතිලාභ සේවාදායකයන්ට පිරිනැමීමට අපට හැකියාව ලැබෙනු ඇත. ඒකීය ලෝක සන්ධාන ගුවන් ගමන් ජාල සේවය තුළ "ෆ්ලයිස්මයිල්ස්" නිරන්තර පියසර වැඩ සටහනට අයත් සාමාජිකයන් විවිධ වරප්‍රසාද හා ප්‍රතිලාභ සලසා ගනියි. එකී වැඩ සටහනට අයත් ප්‍රමුඛ සාමාජිකයිනට ලොව පුරා පිහිටි ගුවන් තොටුපළවල 500 කට වඩා අධික මගී විවේකාගාරවලට ප්‍රවේශවීමේ අවසරයද එම ප්‍රතිලාභවල අන්තර්ගත වේ.

**ගුවන් යානා ඇණිය සහ ජාල සේවය පුළුල් කිරීම**

කල් බදු ක්‍රමය යටතේ තවත් එක් ගුවන් යානයක් සපයා ගනු ලැබීමෙන් පසුව අප සතු යානා ඇණියේ මුළු අහස් යාත්‍රා සංඛ්‍යාව 22 දක්වා ඉහළ නංවා ගනිමින් අභිනව ගුවන් යානා අත්කර ගැනීමේ ක්‍රියාවලිය සමාලෝචිත වසර තුළ ද නොකඩවා ඉටු කෙරිණි. 2011/12 වසර තුළ ඇරඹි යානා අත්කර ගැනීමේ වැඩ සටහනට A 320 වර්ගයේ ගුවන් යාන 05 ක්ද, A 330 වර්ගයේ ගුවන් යානා 02 ක්ද, A340 වර්ගයේ ගුවන් යානයක් ද ඇතුළත් විය. සමාලෝචිත වසර තුළ ගුවන් ගමන් ජාල සේවය විස්තාරණය කිරීමේ කාර්යයෙහිලා ඉන්දියාව, ඈත පෙරදිග හා මැද පෙරදිග යන කලාප වෙත ගුවන් ගමන් වාර 17 ක් දක්වා ඉහළ නංවා ගැනීම අන්තර්ගත විය.

## ගුවන් යානා මගී මැදිරිවලට නව මුහුණුවරක් දීම

අපගේ දිගු බඳ ගුවන් යානා ඇණිය ආශ්‍රිතව වඩා සැප සහසුකම් සහිත නිමැවුමක් පිරිනැමීමේ වැඩ පිළිවෙළ සාර්ථකව නිම කරන ලද අතර එමඟින්, අපගේ ගුවන් සමාගම, කලාපය තුළ පවතින හොඳම ව්‍යාපාර පංතිය හා සමතැන් ගන්වන ලදි. අපගේ සියලුම දිගුබඳ යානා අංශ කෙරෙහි යොදා ගැනුණු මෙම නව මුහුණුවරක් ගත් නිමැවුම, ව්‍යාපාර පංතිය ඔස්සේ හඳුන්වා දෙන ලද අතර ඊට සමතල සයනාසන සහ ඉල්ලූ විට සැපයෙන ශ්‍රව්‍ය දෘෂ්‍ය රසාස්වාද පද්ධති ද ඇතුළත් විය.

## සේවා ඉටු කිරීම

සියලුම සේවා සම්පාදන ක්ෂේත්‍ර තුළ විවර්ධන කටයුතු ගණනාවක් සිදු කෙරිණි. ගුවන් තොටුපළ පර්යන්තයෙහි සේවාදායක අත්දැකීම් වර්ධනයෙහිලා වූ මුලපිරීම් තුළ පිරික්සුම් කවුන්ටර සන්නාමනගත කිරීම, මගී විවේකාගාරය පිළිසකර කිරීම, කුඩා පිරික්සුම් කුටි හඳුන්වාදීම සහ භාණ්ඩ දැත්වල තිබියදීම ඒවා පරීක්ෂා කිරීමේ ක්‍රමය (අත්දැරි පර්යන්ත පිරික්ෂුම් ක්‍රමය) හඳුන්වාදීම යනාදී කටයුතු අන්තර්ගත විය. පුළුල් තෝරා ගැනීමක් සහිත විස්තෘත ආහාර වට්ටෝරු මාලාවක් හඳුන්වා දීම ඔස්සේ යානාස්ථව ආහාර පාන පිරිනැමීම බෙහෙවින් දියුණු තත්වයකට ගෙන ඒම මගින් යානාස්ථ මගී අත්දැකීම් වලද වර්ධනයක් ඇති කරන ලදි. යානාස්ථ විනෝද සැපයුම් කාර්යය ඔස්සේ නැරඹීමට තැබෙන චිත්‍රපටිවල අන්තර්ගතය ඉහළ නැංවීම මගින් මෙන්ම ඒවා භාෂා කීපයකින් ලබා ගත හැකි විමට සැලැස්වීම මගින්ද එම අංශය තුළ වර්ධනයක් ඇති කෙරිණි. සමාගම සතු ගුවන් යානා මෙන්ම සේවාදායක ගුවන් යානාද වඩා කාර්යක්ෂමව මෙහෙයවීම සඳහා ඒ හා සම්බන්ධ ගොඩබිම් සහායක උපකරණ ලබා ගැනීම වෙනුවෙන් ද මුදල් ආයෝජනය කරන ලදි.

## සේවා ලාභීන්ගේ ප්‍රතිචාර හා අන්තර් ක්‍රියාකාරිත්වය

සේවා ලාභීන්ගේ අදහස් උදහස් ලබා ගැනීම අප හට අතිශයින් වැදගත් වන අතර ඔවුන් ක්‍රියාශීලීව දිරි ගැන්වීම මගින් හා ඔවුන් විසින් කරනු ලබන ප්‍රතිචාර දැක්වීම සඳහා පහසු ක්‍රම සලසාදීම මගින් ඔවුන් විසින් දක්වනු ලබන අදාළ ප්‍රතිචාර හා අන්තර් ක්‍රියාකාරිත්වය වැඩි දියුණු කිරීමේ අටියෙන් වඩාත් ව්‍යුහගත ආකාරයකින් හා නිර්මාණශීලී ක්‍රමවේද තුළින් කරුණු සොයා බැලීමට සමාලෝචිත වර්ෂය තුළ කටයුතු ආරම්භ කරන ලදි. දියුණු මට්ටමේ සේවාවක් සේවාලාභීන් වෙත සලසාදීමේ අරමුණින් ඔවුන් වෙත වඩ වඩාත් සමීප වනු පිණිසත්, වඩා හොඳින් ඔවුන් අවබෝධකර ගනු පිණිසත් දියුණු තාක්ෂණ ක්‍රමවේද ඔස්සේ එළඹෙන වසර තුළ තව දුරටත් ඉදිරි පියවර අප විසින් ගනු ලබන්නෙමු.

## ශ්‍රීලංකන් සමාගමේ ගුවන් භාණ්ඩ අංශය

ගුවන් සමාගමේ ඉතිහාසය තුළ කිසියම් මූල්‍ය වර්ෂයකදී උපයාගත් වැඩීම ආදායම වන ඇමරිකන් ඩොලර් මිලියන 98 ක්වූ ප්‍රමාණයක් උත්පාදනය කර ගැනීමට ශ්‍රීලංකන් සමාගමේ ගුවන් භාණ්ඩ අංශයට හැකිවිය. මෙට්රික් ටොන් 101,000 ක් වූ ඉහළම ටොන් ප්‍රමාණයක් ප්‍රවාහනය කිරීමට ද ඊට හැකිවිය. කොළඹ පිහිටි ප්‍රධාන කාර්යස්ථානය ඉකුත් වසර හා සසඳන කළ ආදායම් වර්ධනය 19% ක් වශයෙන්ද, ටොන් ප්‍රමාණ වර්ධනය 33% ක් වශයෙන්ද සැලකිය යුතු උසස් මට්ටමක් වාර්තා කර සිටියේය. සමස්ත ජාල සේවා ආදායමෙන් කොළඹ කාර්යස්ථානය 28% ක්වූ ප්‍රමාණයක් උදෙසා දායක වූ අතර ඈත පෙරදිග, ඉන්දියාව හා යුරෝපය පිළිවෙළින් 29%, 16%, හා 19% යන ප්‍රමාණවල දායකත්වයක් සලසා දුන්නේය. සමස්ත ජාල සේවය තුළ ගුවන් භාණ්ඩ ආදායම් දායකත්වය 12% ක් වූයේය.

සමාලෝචිත කාලපරිච්ඡේදය තුල නවතම ව්‍යාපෘති කීපයක්ද නිමාවට පත් කෙරිණි. ජීව සතුන් රඳවා ගැනීමේ ශාලාව, විකිරණශීලී ගබඩා පහසුකම්, අතිරේක වශයෙන් 30% ක් වූ ප්‍රමාණයකින් ඉඩ පහසුකම් ඉහළ නැංවෙන අයුරින් ගබඩා රාක්ක පද්ධතියේ උස වැඩි කිරීම හා එසවුම් යන්ත්‍ර සහිතව බර භාණ්ඩ පිරික්සුම් යන්ත්‍ර සවිකිරීම යනාදී කටයුතු ඉන් කිහිපයකි.

වර්ධිත ආදායම් ප්‍රතිලාභ සමාගම වෙත සලසා ගත හැකි වනු පරිදි ශ්‍රීලංකන් සමාගමේ ගුවන් භාණ්ඩ අංශය 2013 ජූනි මස සිට ක්‍රියාත්මක වන අයුරින් ගුවන් භාණ්ඩ ආදායම් කළමනාකරණ ඒකකයක් පිහිටුවීය. භාණ්ඩ ධාරිතාවය පිළිබඳ ගැටලු පිටු දැකීම පිණිස යුරෝපය කරා බ්ලොක් ඉඩ පහසුකම් අත්කරගනු සඳහා සුපිරි ගුවන් ප්‍රවාහක සමාගම් සමඟ කෙරෙන සාකච්ඡා දැනටමත් ආරම්භ කර තිබේ. අපගේ ව්‍යාපාර කාර්ය ප්‍රවර්ධනය පිණිස අපගේ පරිබාහිර මාර්ගගත කාර්යස්ථානවලදී නව ගුවන් භාණ්ඩ විකුණුම් නියෝජිතයාතන විවෘත කිරීමේ ක්‍රියාවලිය තුළ ද අප දැන් නිරතව සිටින්නෙමු. ශ්‍රීලංකන් සමාගමේ ගුවන් භාණ්ඩ අංශය සාර්ථක වසරක් වාර්තා කළ අතර එහි සමස්ත විවර්ධිත ව්‍යාපාර කර්තව්‍යය තුළින් සනිටුහන් වූයේ, සේවාලභීන් එහි ජාලගත සේවා ඔස්සේ අංශය කෙරෙහි දැක්වූ ඉහළ විශ්වාසයයි.

### ශ්‍රීලංකන් සමාගමේ ඉංජිනේරු අංශය

පුළුල් බඳ ගුවන් යානා 03 කට අයත් ව්‍යාපාර පංති හා සකසුරුවම් පංති යන දෙවර්ගයේම කැබින් මැදිරි උත්ශ්‍රේණිගත කිරීමේ කාර්යයද ඇතුළුව ස්වකීය ගුවන් යානා ඇණියේ ගුවන් යානා මෙන්ම අනෙකුත් සේවා ලාභී ගුවන් සමාගම්වලට අයත් ගුවන් යානා වලද ප්‍රධාන ඉංජිනේරු කටයුතු වැඩ සටහන් හා සිරිත් ප්‍රකාර කෙරෙන නඩත්තු කටයුතු ඉටු කරමින් ශ්‍රීලංකන් සමාගමේ ඉංජිනේරු අංශය තවත් එක් සාර්ථක වසරක් සම්පූර්ණ කළේය.

අපගේ ඉංජිනේරු අංශය, අපගේ සේවා දායකයන් වෙත ඉතා උසස් මට්ටමේ වෘත්තීය සේවාවක් සපයමින් ගුවන් යානා නඩත්තු කිරීමේ, අලුත්වැඩියා කිරීමේ හා පිරිවැඩියා කිරීමේ ප්‍රධාන මධ්‍යස්ථානයක් බවට පත්වීමේ අපගේ අරමුණ සාක්සාත් කරගනු පිණිස දැඩි ජවයකින් කටයුතු කළේය. ඉන්දියාවේ විශාලතම අඩු ගාස්තු ගුවන් ප්‍රවාහකයා වන ඉන්ඩිගෝ ගුවන් සමාගම අපගේ ප්‍රධාන සේවා දායකයා බවට පත්ව සිටින අතර පස්වන සමගාමී වර්ෂය සඳහාද ඔවුන්ගේ සමස්ත 'සීචෙක්' පිරික්සුම් වැඩ සටහනම අපට දිනාගත හැකිවීම තුළින් අප විසින් ඉටු කරනු ලබන එවන් 'සීචෙක්' පිරික්සුම් වැඩ සටහන් ගණනාවකම සීඝ්‍ර වර්ධනයක් විද්‍යාමාන කරගත හැකි වූයේය. ශ්‍රීලංකන් සමාගමේ ඉංජිනේරු අංශයේ රේඛීය නඩත්තු අංශයද ඔවුන් විසින් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ හා මාලේ ගුවන් තොටුපළ වෙත සපයා දෙනු ලබන තෘතීය පර්ශව ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ කොටස්භාගය ඉහළ නංවාගත් අතර එම අංශය, එකී ජාත්‍යන්තර ගුවන් තොටුපළද්වයටම ප්‍රබලතම කාර්මික සේවා සපයන්නා ලෙස කටයුතු කරයි. මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ පරිශ්‍රයෙහි පිහිටි අපගේ රේඛීය නඩත්තු කටයුතු මධ්‍යස්ථානය, මත්තල ගුවන් තොටුපළ පහසුකම් යොදාගනිමින් ශ්‍රීලංකන් ගුවන් සමාගම සහ තෘතීය පාර්ශව මෙහෙයුම්කාර ගුවන් සමාගම් වෙත කාර්මික මෙහෙයුම් කටයුතු ඉටු කර දෙයි.

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි ශ්‍රීලංකන් සමාගමේ ඉංජිනේරු අංශයෙහි පහසුකම් ඉහළ නංවමින් A 320 වර්ගයේ ගුවන් යානා සඳහා සුවිශේෂී වූ ගුවන් යානාගාරයක් ඉදිකරන ලද අතර එය නුදුරු දිනෙකදී විවෘත කිරීමට නියමිතය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් A 320 වර්ගයේ ගුවන් යානාවල එහා මෙහා හැරවුම් කාලය සැලකියයුතු අයුරින් අඩුවන අතර එමගින් අපගේ තෘතීය පාර්ශව නඩත්තු කටයුතු තව දුරටත් වර්ධනය කර ගැනීමට අපට හැකි වනු ඇත.

### ශ්‍රීලංකන් සමාගමේ ගුවන් ටැක්සි සේවය

මෙම කාර්ය හා සම්බන්ධ අධික මෙහෙයුම් වියදම් හේතුවෙන් ගුවන් ටැක්සි සේවා මෙහෙයුම් කටයුතු අඩු මට්ටමකින් පවත්වා ගැනුණු අතර ඒ සඳහා යොදවා ගැනුණු ගුවන් යානා සංඛ්‍යාව එක් යානයක් දක්වා අඩු කෙරෙණි. ඒ අනුව, වැඩිම ඉල්ලුමක් සහිත ගමනාන්ත කරා මූලික කාල සටහනක් පවත්වා ගෙන යන ලදි. එමඟින්, වැඩි අදායම් සඵලතාවක් සහිත කුලී ගුවන් යානා සඳහා වැඩි ගුවන් යානා කාලයක් ලබා දීමට හැකිවිය. සමාගමේ වැඩි සන්නාම පැවැත්ම තහවුරු වන පරිදි අඩු වියදම් සහිත විකල්ප ව්‍යාපාර ආකෘති සම්බන්ධයෙන්ද අපගේ සැලකිල්ල යොමුව තිබේ.

### "ෆ්ලයිස්මයිල්ස්" නිරන්තර පියසර වැඩ සටහන

ශ්‍රීලංකන් ගුවන් සමාගමේ "ෆ්ලයිස්මයිල්ස්" වැඩ සටහන, සංඛ්‍යාව හා ආදායම යන දෙඅංශයෙන්ම වර්ධනයක් විද්‍යාමාන කළ සාර්ථක වර්ෂයක් වූයේය. සාමාජිකත්වයේ ප්‍රමාණය අභිනව සාමාජිකයන් 61,000 ක් දක්වා ඉහළ

ගියේය. තවද, වැඩි ප්‍රතිලාභ මෙන්ම වැඩ උපචිත වීමේ හා මුදා ගැනීමේ විකල්පද සලසාදීමේ අරමුණින් යුතුව මෙම වැඩ සටහන වෙත නව හවුල්කරුවන්ද ආකර්ෂණය කර ගැනුණි.

**තොරතුරු තාක්ෂණය**

අති නවීන තාක්ෂණය හඳුන්වා දීමෙන් හා එමගින් මෙහෙයුම් පිරිවැය අවමකර ගැනීම තුළින් ගුවන් මගී අත්දැකීම් වැඩි දියුණු කිරීම සඳහා වැදගත් ප්‍රයත්න දැරිණි. ගුවන් තොටුපළේදී කඩිනම් පිරික්සුමක් සැලසීම සඳහා එහි ස්වයං පරික්සුම් හා අත්දැරි උපකරණ භාවිතයට ඉඩදෙන ස්කැනර් යන්ත්‍ර සහ ගුවන් ගමන් අවසරපත් මුද්‍රණය කිරීමේ යන්ත්‍ර සහිත කුටි සමාලෝචිත වසර තුළ හඳුන්වා දෙන ලදි. ගමන් මළු ඉක්මණින් සොයා ගැනීමටත්, ඒවායේ වැරදි පරිහරණය අවම කිරීමටත් හැකිවන පරිදි ගමන් මළු සැසඳුම් පද්ධතිය උත්ශ්‍රේණිගත කෙරුණි. කාර්යක්ෂමතාව නංවාලීමේ අටියෙන් ව්‍යාපාර කාර්යයෙහිලා විශාල වර්ධනයක් ඇති කරනු පිණිස ගුවන් යානා ප්‍රමාදවීමේ පිරිවැය පද්ධතිය, ගුවන් යානා සේවක පිරිසේ අගැයුම් පද්ධතිය සහ කළමනාකරණ තොරතුරු සහිතව යෙදවුම් සහබද්ධතා කිරීම යනාදී අභ්‍යන්තර පද්ධති යාවත්කාලීන කෙරිණි. තාක්ෂණ ක්‍රමවේදය, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ සිට මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ දක්වා සීමා මායිම් රහිතව මුදා හැරුණි. ස්වකීය කාර්යස්ථාන පිරිවැය සහ ගිණුම් යාවත්කාලීන කර ගැනීම පිණිස විදේශයන්හි පිහිටි කාර්යස්ථානවලට ප්‍රවේශය සලසා දෙමින් “ඔරකල් ඊබිස්නස් ස්වීට්” ක්‍රමය සහිතව ගිණුම්කරණ ක්‍රියාවලිය විමධ්‍යගත කෙරෙන විදේශ කාර්යස්ථාන ගිණුම් කටයුතු ඒකාබද්ධ කිරීමේ ක්‍රමවේදය තුළ මූල්‍ය වර්ෂයේදී සිදු කෙරුණු ඇතැම් සාර්ථක මුලපිරීම්හී පිළිබිඹුව විද්‍යාමාන විය. තත්ව කළමනාකරණ පද්ධති සඳහා වන ISO 9001:2008 ජාත්‍යන්තර ප්‍රමිති සහතිකකරණය සහ තොරතුරු ආරක්ෂණ කළමනාකරණ පද්ධති සඳහා වන ISO 27001:2005 ජාත්‍යන්තර ප්‍රමිති සහතිකකරණය දිනා දෙමින් උසස් හා තාක්ෂණ සේවා විධික්‍රම අප සමාගමේ තොරතුරු තාක්ෂණ අංශයට අභිමානනීය තත්වයක් උදාකර දුන්නේය.

**ජනතා අධ්‍යයනය හා සංස්කෘතිය**

ගතවූ වසර තුළ, මානව සම්පත් සංවර්ධනය සහ කළමනාකරණ කර්තව්‍යය ව්‍යාපාර හවුල්කාරිත්ව මුහුණුවරක් යටතේ සංවිධානයේ අවශ්‍යතා වෙත තවදුරටත් එකිනෙකට ප්‍රතිසම්බන්ධනය විය. එහිලා සමාගමේ අධි කාර්ය සාධක සේවක සේවිකාවන්ගේ සිට අති ප්‍රබල සේවක පිරිස් දක්වා වන සංවිධානයට අයත් අනාගත කළමනාකරණ හා නායකත්ව අවශ්‍යතාව පිරවීම පිණිස අනුප්‍රාප්තිකයන් ගණනාවක් හඳුනා ගැනීම ප්‍රමුඛ මූලාරම්භක කාර්යභාරය වූයේය. තවද, අධි කාර්යසාධක සේවක සේවිකාවන්ගේ නායකත්ව සංවර්ධනය, ඔවුනට උපදෙස් දීම හා ඔවුන්ගේ අඛණ්ඩ වෘත්තීය දියුණුව සලසාදීම යන කටයුතු නොකඩවා ඉටු කෙරෙන ව්‍යාපෘති ලෙස ආරම්භ කෙරුණු අතර අධි කාර්යසාධක සේවක සේවිකාවන් නිසි පරිදි හඳුනාගෙන ඔවුන් අගැයීමටද ලක් කෙරිණි. ව්‍යාපාර කටයුතුවල අඛණ්ඩත්වය පිණිස සංවිධානය පිළිබඳ සාමූහික අධ්‍යයනය හා දැනුම ඒකරාශී කිරීම සඳහා දැනුම කළමනාකරණ පද්ධතියක් දියත් කෙරුනු අතර සේවක සේවිකාවන්ගේ දැනුම ඉහළ නැංවීම හා නිමැවුම් සංවර්ධනය උදෙසා උපාය මාර්ග බොහොමයක් සම්බන්ධයෙන්ද මූලාරම්භක ක්‍රියා මාර්ග ගැනුණේය.

**ශ්‍රීලංකන් ගුවන් සමාගමේ කාර්මික පුහුණුව**

යුරෝපීය ගුවන් සේවා ආරක්ෂක නියෝජිත ආයතනය විසින් නිකුත් කරනු ලබන ගෞරවනීය EASA 147 සහතිකකරණයද සහිතව ශ්‍රීලංකන් ගුවන් සමාගමේ ඉංජිනේරු අංශයට පමණක් නොව විදේශීය සේවා දායක ගුවන් සමාගම් වලට මෙන්ම පුද්ගලයන්ටද කාර්මික පුහුණුව සලසාදීම අප විසින් නොකඩවා ඉටු කරමු. ආධුනිකයන් සඳහා වන අපගේ ගුවන් යානා නඩත්තු පාඨමාලාවත්, මාදිලි නිශ්චිත පුහුණුවත්, අනිවර්ය නියාමන පුහුණුවත් මෙම කාර්මික මධ්‍යස්ථානයෙහි පැවැත්වේ. මේ වන විට, ගුවන් යානා නඩත්තුව පිළිබඳ දැ අවුරුදු මූලික පාඨමාලාව කාණ්ඩ තුනකට අයත් සිසුහු හදාරති.

**ශ්‍රීලංකන් ගුවන් සමාගමේ පියසර විද්‍යායතනය**

A 320 වර්ගයේ එයාබස් ගුවන් යානා සඳහා වූ තෘතීය පාර්ශව කාර්මික සේවක පිරිස් වෙනුවෙන් මාදිලි වර්ගීකරණ පුහුණුව සිදු කිරීමට ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය වෙතින් මාදිලි වර්ගීකරණ පුහුණු සංවිධානයේ අනුමැතිය සමාගම විසින් ලබා ගති.

A 320 - 200 ගුවන් යානා "සිමියුලේට" අනුකාරක පුහුණු උපකරණය සඳහා වූ යුරෝපීය ගුවන් සේවා ආරක්ෂක නියෝජිත ආයතන සුදුසුකම ගුවන් යානා "සිමියුලේට" අනුකාරක මධ්‍යස්ථානය වෙත ප්‍රදානය කෙරිණි. තෘතීය පාර්ශව කාර්මික පිරිස් පුහුණු කිරීමට අපට ඇති හැකියාව තව දුරටත් වර්ධනයකර ගැනීමටත්, ආසියානු කලාපය තුළ වේගයෙන් වැඩෙමින් පවත්නා ගුවන් සේවා අංශය තුළ මානව සම්පත් අවශ්‍යතා සපුරාලීම සඳහා වන ඒකාබද්ධ ශ්‍රීලංකන් ගුවන් සමාගම් පුහුණු ක්‍රියාදාමයක් දියත් කිරීමටත් අපි අපේක්ෂා කරන්නෙමු.

**ජාත්‍යන්තර ගුවන් සේවා විද්‍යායතනය**

ජාත්‍යන්තර ගුවන් සේවා විද්‍යායතනය, පසුගිය දෙවසර මුළුල්ලේ සමාගමේ නිමැවුම් කාර්යාවලිය විස්තාරණය කර ගනිමිනුත්, ආදායම් හා ලාභ වර්ධනය කර ගනිමිනුත් සැලකිය යුතු දියුණුවක් අත්පත් කර ගත්තේය. විද්‍යායතනය විසින් උපදවා ගනු ලැබූ පරිබාහිර ව්‍යාපාර ඉපැයුම් මගින් සමාගමේ සේවාස්ථ හා පුනරාවර්තන පුහුණු කටයුතු වියදම් වලින් 80% කටත් වැඩි ප්‍රමාණයක් ආවරණය කර ගත හැකි විය. විද්‍යායතනය විසින් පිරිනමන ලද ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන නියෝජිතායතන වැඩ සටහන් සිව් ගුණයකින් ඉහළ ගිය අතර සම්මානලාභීන් 6 දෙනෙකු බිහි කිරීමට විද්‍යායතනට හැකිවිය. මෙම ජයග්‍රහණවල කුඨප්‍රාප්තිය සනිටුහන් වූයේ, විද්‍යායතනය ලොව විශිෂ්ටතම පුහුණු මධ්‍යස්ථාන දහයෙන් එකක් බවට තීරණය කිරීම මගිනි. එය අපගේ ප්‍රබල කාර්ය සාධනයෙහිලා වැදගත් සහතිකයක් වූයේය.

**ආයතනික සමාජ වගකීම**

2012/13 කාල පරිච්ඡේදය තුළද, හරිතවේදී කණ්ඩායම් හා හරිතවේදී මූලාරම්භයන් පිළිබඳව අතිරේක අවධානයක් යොමු කරමින් ආයතන සමාජ වගකීම් ආශ්‍රිත කටයුතු ඉකුත් වර්ෂයේදී සේම නොකඩවා පවත්වා ගැනුණි. "තිරසාර හා ඵලදායී ව්‍යාපාර සංවර්ධනයක් සාක්සාත් කර ගැනීම පෙරදැරි කරගත් ග්‍රහීය හිතෛෂී ගුවන් සමාගම බවට පත්වීම" යන අපගේ හරිත දැක්ම අනුව කටයුතු කරමින් අපගේ "කාබන් මංසළකුණු" සැලකිය යුතු මට්ටමකින් අවම කෙරෙන වැඩ සටහන් කීපයක් අප විසින් ඉටු කළෙමු. ජාතික හරිත කාර්යක්ෂමතා සම්මාන උළෙලේදී එහි රිදී සම්මානයේ ජයග්‍රාහකයා වශයෙන්ද අප ආයතනය නම් කෙරිණි. සමාජ ප්‍රජාව කෙරෙහි අපගේ වගකීම් කාර්ය භාරය තව දුරටත් ඉදිරියට ගෙන යමින්, වාර්ෂික පදනමක් මත අප විසින් කරගෙන යනු ලබන කටයුතුවලට අමතර වශයෙන්, ප්‍රධාන ව්‍යාපෘති දෙකක් සඳහා වන කටයුතු අප විසින් ආරම්භ කරන ලදි.

බහු ශික්ෂක ළමා මනෝ චිකිත්සා වාට්ටුවක් ඉදිකිරීම සඳහා සමාගමට අයත් "ශ්‍රීලංකන් කෙයාස්" නමැති සුව සත්කාරක අංශය විසින් සෞඛ්‍ය අමාත්‍යාංශය සහ රිජ්වේ ආර්යා ළමා රෝහල සමඟ අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබීය. එහි ඉදිකිරීම් කටයුතු 2013 මාර්තු මාසයේදී ඇරඹී අතර 2013 සැප්තැම්බර් මාසය වන විට එහි කටයුතු සම්පූර්ණවීමට අපේක්ෂිතය.ශ්‍රී ලංකාවේ පිහිටි පළමුවන ළමා මනෝචිකිත්සක වාට්ටුව මෙය වනු ඇත.

ගුවන් සේවයේ සිය වසර සැමරුමෙහි කොටසක් ලෙස අනාථ ළමා නිවාස දහයක් අතරින් තෝරාගත් ළමුන් 125 දෙනෙකු ශ්‍රීලංකන් කෙයාස් සුව සත්කාරක අංශය විසින් රටේ සිරි නැරඹීමේ ගුවන් ගමන මෙම ළමුන්ගේ සිහින සැබෑ කරවන අනුස්මරණීය චාරිකාවක් වූ බව නිසැකය. එම සත්කාරය, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ, ශ්‍රීලංකන් ගුවන් සමාගමේ ගුවන් යානාගාරය හා අභ්‍යන්තර පියසර සේවා දැන හඳුනා ගැනීමද ඇතුලත් චාරිකාවක් වූයේය.

කාබන් විමෝචනය අවමකර ගැනීම සඳහාද දායක වන ගුවන් යානා ඉන්ධන කළමනාකරණය ඔස්සේ සමාගමේ පියසර මෙහෙයුම් අංශය විසින් ඉන්ධන කාර්යක්ෂමතා වර්ධන මූලපිරීම් කීපයකට ද අත ගැසුවේය.

- ඉන්ධන කාර්යක්ෂමතාව නැංවීම පිණිස අංශද්වයක් සම්බන්ධයෙන් අවැසි ගුවන් තරණ/කාර්ය සාධන පාදක ගුවන් තරණ ප්‍රවේශකත්වයක් ක්‍රියාවට නැංවීය.
- ගුවන් යානා ගොඩබිම් ගමන් වලදී සිදුවන කාබන් විමෝචනය අඩු කිරීම පිණිස ශ්‍රී ලංකා ගුවන් තොටුපළ සහ ගුවන් සේවා අධිකාරිය සමග එක්ව කටයුතු කිරීම.
- ඉන්ධන බර ආශ්‍රිත විචල්‍යතාව අවම කර එමගින් අතිරේක ඉන්ධන එසැවුම අඩු කර ගැනීම පිණිස ගුවන් ගමන් ජාල සේවය හරහා ශුන්‍ය ඉන්ධන බර පිරික්සුම් යාන්ත්‍රනයක් ක්‍රියාවට නැංවීය.

**ඉදිරි වර්ෂයේ සමස්ත උපාය මාර්ගය**

එළඹෙන තෙවර්ෂය තුළ, අපගේ සේවාදායක සැලකිල්ල තව දුරටත් නංවා ගනු සඳහාත්, අපගේ ව්‍යාපාරික සැලැස්මට අනුව, ආයතනය පාඩු හෝ ලාභ නොලබන සම මට්ටමක් කරා ගෙන ඒමේ ඉලක්කය ආශ්‍රිත කටයුතු වර්ධනය කරනු සඳහාත් අපේ අවධානය යොමු කර ක්‍රියා කරන්නෙමු. ශ්‍රී ලංකාව ආසියාවේ ගුවන් තරණ කේන්ද්‍රස්ථානය බවට පත් කිරීම සඳහා එහි උපාය මාර්ගික භූගෝලීය පිහිටීම උපරිම අයුරින් යොදා ගනිමින් ආසියා ශාන්තිකර සහ මැද පෙරදිග යන කලාප වෙත වැඩි අවධානයක් යොමු කිරීමද අපේ අපේක්ෂාවයි.

වෙළෙඳපළ තොරතුරු හා විමර්ශණය පාදක වූ ප්‍රශස්ත තීරණ ගනිමින් නවීන තාක්ෂණයද යොදා ගනිමින් ආදායම් ඉහළ නංවා ගැනීම පිණිස අපි නොකඩවා ක්‍රියා කරන්නෙමු. ආදායම් වැඩිකර ගැනීම හා ගාස්තු ගැළපුම සඳහා වන ගාස්තු ව්‍යුහ අනුසාරයෙන් අදායම් කළමනාකරණ වෙනස්කම් නිරන්තරයෙන්සිදු කිරීමේ කාර්යය ඊට ඇතුළත් විය. තවද, "ප්ලේස්ග්‍රෑඩ්" යනුවෙන් හඳුන්වනු ලබන නොවිකුණු ව්‍යාපාර පංති ආසන වඩා හොඳින් උපයෝජනය කිරීමට ඉඩ සලසාදීම අරමුණු කරගත් අභිනව මූලාරම්භයක්ද දැනට ක්‍රියාත්මකය. ඒකීය ලෝක සන්ධානය තුළ ප්‍රවේශය මගින් විශේෂයෙන් යුරෝපීය වෙළඳපළ තුළ අතිරේක හවුල් කේත ආදායම් සැපයෙනු ඇති අතර එමගින් අපගේ වටිනා සේවාලාභීන් හට පුළුල් ගුවන් ගමන් ජාල සේවයක සබඳතාව ලබා ගැනීමටද හැකි වනු ඇත. වඩා හොඳ දත්ත සහ මෙවලම් සඳහා සිදු කරනු ලබන ආයෝජනය මගින් අප තරඟ කරුවන්ගේ කටයුතු සම්බන්ධයෙන් වැඩි විමර්ශනාත්මක සොයා බැලීමක් වෙත අපව යොමු කරනු ඇති අතර එමගින් අභිනව වෙළඳපළ සහ තරඟ කරුවන්ගේ වෙනස්වීම් පිළිබඳ බලපෑම ආශ්‍රිතව වඩා නිවැරදි පුරෝකථන වලටද අපට එළඹිය හැකිය. ඉහළ පැටවුම් සාධකයක් සහිත වෙළඳපළ ආශ්‍රිතව සිදුවන ගාස්තු වැඩිවීම් සම්බන්ධයෙන් නිසි කටයුතු කිරීමට අපට හැකිවනු පිණිස වඩා ක්‍රියාශීලී මිල නියම කිරීම් වැඩ සටහනක් අනුගමනය කෙරේ. මෙම මූලාරම්භය තුළින් මිල නියම කිරීම් ව්‍යුහ ආශ්‍රිතව නිරන්තර නම්‍යතාවක් හඳුන්වා දීමටද අප සමත් වනු ඇත.

ගුවන් සමාගමේ පුළුල් බඳ යානා ප්‍රතිඇණිගත කිරීමේ වැඩ සටහන තුළින් දැනට අප සතුව පවත්නා A340 යානා හය වෙනුවට A330 –300 වර්ගයේ නවතම එයාබස් යානා හයක් අපට ලැබෙනු ඇති අතර එහි අවසාන වශයෙන් A330 – 200 වර්ගයේ යානා ඇණිය වෙනුවට නවීනතම මතු පරපුරට අයත් A350 –900 වර්ගයේ එයා බස් ගුවන් යානා සේවයට යොදා ගැනීමට ද අප සමත් වනු ඇත. නවීනතම සහ අති සුපිරි තත්වයේ ආසන හා යානස්ථ විනෝදාත්මක පද්ධති සවි කෙරුණු මෙම ගුවන් යානා මගින් අපගේ සේවා ලාභීන් වෙත වඩා තරඟකාරී නිමැවුම් පිරිනැමීමට අප ගුවන් සමාගමට හැකිවනු ඇත.

**ඔබට ස්තුතියි**

ආයෝජනය කිරීම් හා සැලසුම් ක්‍රියාත්මක කිරීම් යන කරුණු සනිටුහන්වූ සහබද්ධතාවයේ වසරක් වශයෙන් සමාලෝචිත වර්ෂය ශ්‍රීලංකන් ගුවන් සමාගමට වැදගත් සන්ධිස්ථානයක් වූ අතර අපට එහිලා උරදුන් සියලු දෙනාටම මම මගේ කෘතවේදීත්වය පළ කරමි. ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති තුමාටද, ගරු සිවිල් ගුවන් සේවා ඇමති තුමාටද, සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම් තුමාටද ඔවුන්ගේ අඛණ්ඩ අනුබලයට හා සහයෝගයට මගේ තුති ප්‍රණාමය පුද කරමි. දැක්වූ අඛණ්ඩ මාර්ගෝපදේශකත්වය සහ අප්‍රතිහත සහය වෙනුවෙන් අපගේ සභාපතිතුමාටද, ජ්‍යෙෂ්ඨ කළමනාකාර කණ්ඩායමටද මගේ කෘතඥතාව හිමිවේ.

" ශ්‍රීලංකන් කුටුම්බය" යනුවෙන් හැඳින්විය හැකි සමාගමට අයත් සියලුම සේවක සේවිකාවන් හා සේවක සංගම් විසින් විද්‍යාමාන කළ අඛණ්ඩ කැපවීමටත්, වෙහෙසකර සේවයටත් මම මගේ හෘදයංගම ප්‍රණාමය පළ කරමි.

අප වෙත සහයෝගය පළකළ ආයතන බොහෝ ඇත. අපගේ විදේශික හා ශ්‍රී ලාංකික මූල්‍ය සැපයුම් කරුවන්, ශ්‍රී ලංකා සංචාරක ආයතනය, ගුවන් තොටුපළ හා ගුවන් සේවා අධිකාරිය, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි හා මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි ක්‍රියාත්මක වන සියලු ගුවන් සමාගම්, අපගේ සැපයුම් කරුවන් හා ව්‍යාපාරික හවුල්කරුවන්, ඒ සැමටත් වඩා අපගේ සේවා ලාභීන් යනාදී සැම සියලු පාර්ශව කරුවකුගේම අනුග්‍රාහකත්වය මෙහිලා අපගේ අගැයුමට ලක්වේ. අපේක්ෂා ඉටුවන හා කාර්ය සාධනය සපිරි නව වසරක් දෙස බලාපොරොත්තු දල්වා ගනිමින් නිරන්තරව එක්වන්ව කටයුතු කිරීමට අදිටන් කර ගනිමු.

**අ/ කළේ: කපිල චන්ද්‍රසේන**
**අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී**

**2013 ජූලි මස 30 වන දින.**

**අධ්‍යක්ෂවරුන්ගේ කාර්යසාධන සටහන**

**නිශාන්ත වික්‍රමසිංහ මහතා**

2006 ජනවාරි මාසයේදී අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදි. 2008 අප්‍රියෙල් මාසයේදී විධායක අධ්‍යක්ෂ වරයෙකු ලෙස පත් කරන්නට යෙදුණි. 2008 සැප්තැම්බර් මාසයේදී වැඩ බලන සභාපතිවරයා වශයෙන්ද, 2009 ජුනි මස සිට සභාපතිවරයා ලෙසද පත් කෙරිණි. සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සහ සීමාසහිත මිහින් ලංකා යන සමාගම්වල සභාපතිවරයාද වන වික්‍රමසිංහ මහතා උඩුපුස්සැල්ලාව වැවිලි සමාගමේද, හපුගස්තැන්න වැවිලි සමාගමේද අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරයි.

**කපිල චන්ද්‍රසේන මහතා**

2008 දෙසැම්බර් මාසයේදී අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදි. ඊට අමතර වශයෙන් 2011 අගෝස්තු මාසයේදී ප්‍රධාන විධායක නිලධරයා ලෙස ද පත් කෙරිණි. වෘත්තිමය අලෙවි කරුවෙකු වන චන්ද්‍රසේන මහතා දැනට සී / ස ශ්‍රීලංකන් කේටරින් සමාගමේ අධ්‍යක්ෂ වරයෙකු වශයෙන්ද සී/ස මිහින් ලංකා (පුද්ගලික) සමාගමේ ප්‍රධාන විධායක නිලධාරිවරයා ලෙසද කටයුතු කරයි. චන්ද්‍රසේන මහතා සී/ස ශ්‍රීලංකන් ටෙලිකොම් මොබිටෙල් (පුද්ගලික) සමාගමේ වැඩ බලන ප්‍රධාන විධායක නිලධාරිවරයාද වෙයි.

**නිහාල් ජයමාන්න මහතා, ජනාධිපති නීතිඥ**

1994-98 කාලය තුළ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකුව සිට පසුව 2008 සැප්තැම්බර් මාසයේදී නැවත පත් විණි. ජනාධිපති නීතිඥවරයෙකු වන ඒ මහතා වසර 40 කට අධික නීතිඥ වෘත්තියේ පළපුරුද්දක් ඇත්තකු වන අතර ශ්‍රී ලංකා නීති කොමිෂන් සභාවේ සහ සමාගම් පනත පිළිබඳ උපදේශක කොමිෂන් සභාවේ සභාපති වරයාද වේ. ජයමාන්න මහතා සී/ස ශ්‍රීලංකන් කේටරින් සමාගමේ සහ සෙලාන් බැංකු සමාගමේ අධ්‍යක්ෂ වරයෙකුද වේ.

**ෂමීන්ද්‍ර රාජපක්ෂ මහතා**

අධ්‍යක්ෂවරයෙකු වශයෙන් 2009 අගෝස්තු මාසයේදී පත් කෙරිණි. පරිගණක ඉංජිනේරු වෘත්තිකයෙකු වන රාජපක්ෂ මහතා ගරු මුදල් ඇමතිතුමාගේ පෞද්ගලික ලේකම් ධූරය දැනට හොබවයි. ඒ මහතා ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේද, සී/ස එස්.එල්.ටී. හොංකොං සමාගමේද, සී/ස එස්.එල්.ටී. පබ්ලිකේෂන්ස් (පුද්ගලික) සමාගමේද, සී/ස ශ්‍රී ලංකා කේටරින් සමාගමේද අධ්‍යක්ෂකවරයෙකු ලෙස කටයුතු කරයි.

**මනිලාල් ප්‍රනාන්දු මහතා**

2010 මැයි මාසයේදී අධ්‍යක්ෂක මණ්ඩලයට පත් කරන ලදි. සී/ස ස්ටැලියන් හෝල්ඩිංස් (පුද්ගලික) සමාගමේ සභාපති ධූරය දැනට හොබවයි. වෘත්තියෙන් නීතිවේදියෙකු වන ඒ මහතා සමාගම් කිහිපයකම අධ්‍යක්ෂ පදවි දරන අතර, සී/ස ඒට්කන් ස්පෙන්ස් සහ සමාගම, සිලෝන් ඉන්වෙස්ට්මන්ට් සමාගම සහ සී/ස ෂිපිං ඇන්ඩ් කාගෝ ලොජිස්ටික්ස් (පුද්ගලික) සමාගම ඉන් කිහිපයකි.

**ලක්ෂ්මී සංගක්කාර මහත්මිය**

2011 සැප්තැම්බර් මාසයේදි අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදි. ඇය මණ්ඩලීය විගණන කමිටුවේද සාමාජිකාවකි. වෘත්තියෙන් නීතිවේදිනියක වන ඇය පීපල්ස් ට්‍රැවල්ස් සමාගමේ සභාපති ධූරය සහ මහජන බැංකුවේ අධ්‍යක්ෂ ධූරයක්ද හොබවයි.

**සනත් උක්වත්ත මහතා**

2004-2008 කාලය තුළද, 2008-2010 කාලය තුළද අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකුව සිටි උක්වත්ත මහතා ඉන් අනතුරුව 2011 සැප්තැම්බර් මස සිට අද දක්වා අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරයි. වෘත්තියෙන් හෝටල්කරුවකු වන ඒ මහතා දැනට මවුන්ට් ලැවිනියා හෝටල් සමූහයේ සභාපතිවරයා වේ. මණ්ඩලීය විගණන කමිටුවේ සාමාජිකයෙකු වන උක්වත්ත මහතා සී/ස ශ්‍රීලංකන් කේටරින් සමාගමේ අධ්‍යක්ෂවරයෙකු වේ.

**සුසන්ත රත්නායක මහතා**

2011 දෙසැම්බර් මාසයේදී අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදි. මණ්ඩලීය විගණන කමිටුවේ සභාපතිවරයාද වන රත්නායක මහතා සී/ස ශ්‍රීලංකන් කේටරින් සමාගමේද ස්වාධීන අධ්‍යක්ෂවරයෙකි. දැනට ජෝන් කීල්ස් හෝල්ඩිං සමාගමේ සභාපති හා ප්‍රධාන විධායක නිලධාරි යන පදවි දරන ඒ මහතා ජෝන් කීල්ස් හෝල්ඩිං ව්‍යාපාර සමූහයේ ලැයිස්තුගත කළ හා නොකළ වෙනත් සමාගම් කිහිපයකද එම පදවි හොබවයි. ඔහු ලංකා දූම්කොළ සමාගමේ සභාපති වරයාද වේ.

## අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වර්ෂ 2013 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ස්වකීය වාර්ෂික වාර්තාව මෙහි ලා ඉදිරිපත් කර සිටිනුයේ සතුටිනි.

## ප්‍රධාන කටයුතු හා ව්‍යාපාර කාර්ය සමාලෝචනය

සමාගමේ ප්‍රධාන ව්‍යාපාරික කාර්යයන් වනුයේ ශ්‍රී ලංකාවේ නම්කළ ගුවන් ප්‍රවාහකයා වශයෙන් ගුවන් මගීන්, ගුවන් බඩු හා ගුවන් තැපැල් ප්‍රවාහනය සඳහා වන ජාත්‍යන්තර ගුවන් සේවා හා නිශ්චිතව කාල සටහන් ගතකළ /නොකළ ගුවන් සේවා ක්‍රියාත්මක කිරීමය. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ හා මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ ආශ්‍රිතව ගුවන් පර්යන්ත සේවා සැපයීම, ගුවන්යානා තුළ තීරුබදු රහිත භාණ්ඩ වර්ග විකිණීම, රට අභ්‍යන්තර හා ඉන් පරිබාහිර නිවාඩු ගත කිරීමේ සහනදායී සැලසුම් අලෙවි කිරීම සහ මගී ප්‍රවාහනය සඳහා අභ්‍යන්තර ගුවන් ටැක්සි සේවා ක්‍රියාත්මක කිරීම යන කටයුතු සමාගමේ අනෙකුත් ප්‍රධාන කාර්යයන්හි ලා ගැනේ. සමාගම විසින් ඉටු කරනු ලබන සහායක කර්තව්‍යයන් අතර තෘතීය පාර්ශව නඩත්තු කටයුතු සැපයීම, ගුවන්යානා මෙහෙයුම් සේවා සැපයීම හා ගුවන් සේවා ආශ්‍රිතව පුහුණු වැඩසටහන් මෙහෙයවීම යනාදිය වේ.

සමාගමට අයත් කර්තව්‍යන්හි ස්වභාවය සම්බන්ධයෙන් වූ වැදගත් වෙනස්කම් කිසිවක් මූල්‍ය වර්ෂය තුළ සිදු නොවීය.

ව්‍යාපාර සමූහය සමන්විත වනුයේ සමාගම සහ සමාගම විසින් පූර්ණ අයිතිය හොබවන අනුබද්ධ ආයතනයක් වූ සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගම යන ආයතනද්වයෙනි. සී/ස ශ්‍රීලංකන් කේටරින් සමාගමට අයත් ප්‍රධාන කර්තව්‍ය වනුයේ ශ්‍රී ලංකාවේ කටුනායක පිහිටි බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ හා මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ ඔස්සේ ක්‍රියාත්මක වන ගුවන් සමාගම් සඳහා ගුවන් යානාස්ථ ආහාර පාන සැපයුම් සලසා දීමය. මහජනයා හා මාර්ගස්ථ මගීන් සඳහා අවන්හල් පවත්වාගෙන යෑම, ලොන්ඩරි සේවා සම්පාදනය හා මාර්ගස්ථ මගීන් සඳහා හෝටලයක් කළමනාකරණය කිරීම අනෙකුත් සහායක කර්තව්‍යයන්ට ඇතුළත් වේ.

## මූල්‍ය ප්‍රකාශ හා විගණකවරයාගේ වාර්තාව

මූල්‍ය අංශයේ ප්‍රධානියා සහ අධ්‍යක්ෂවරුන් විසින් විධිමත් පරිදි අත්සන් තබන ලද 2013 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශ අඩංගු ලේඛන හා ඒ පිළිබඳව විගණකවරයාගේ වාර්තාව මේ වාර්තාවට අමුණා ඇත.

## ගිණුම් ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශ සැකසීමේදී අනුගමනය කරන ලද ගිණුම් ප්‍රතිපත්ති, අංක 35 – 53 දක්වා වූ පිටුවල සඳහන් වේ.

## සමූහයේ පිරිවැටුම

සමූහයට අයත් පිරිවැටුම් ප්‍රමාණය රු.මි.121,408 ක් වශයෙන් ගණනය විය.(2011/12: රු. මි.94,639 )සමූහයේ පිරිවැටුම් පිළිබඳ විස්තරාත්මක විශ්ලේෂණයක් මූල්‍ය ප්‍රකාශ වලට අදාළ 18 වන සටහනෙහි දැක්වේ.

සමාගම සහ සමාගමේ පූර්ණ අයිතිය හිමි අනුබද්ධ ආයතනයක් වූ සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගම අතර සිදුවන ගණුදෙනු සාධාරණ වෙළඳපළ මිල ගණන් අනුව ඉටුවේ.

**ප්‍රතිඵල**

බදු ගෙවීමට පෙර සමූහයේ ප්‍රතිඵලය රු.මි.22,503ක ඌනතාවයක් වශයෙන් ගණනය විය. (2011/12:සමූහයේ ඌනතාවය රු. මි.17,197). බදු සඳහා රු. මි.15ක ප්‍රමාණයක්(2011/12:රු.මි.11) ගළපනු ලැබීමෙන් පසුව වර්ෂය සඳහා සමාගමේ ප්‍රතිඵලය රු. මි.22,519කි. (2011/12: සමූහයේ ඌනතාවය රු. මි.17,208කි).

වසර සඳහා වූ ඒකාබද්ධ ආදායම් ප්‍රකාශය පිටු අංක 31 හි දැක්වේ.

**සමූහයේ ආයෝජන**

වසර තුළ සමූහය සඳහා වූ දේපළ, පිරියත සහ උපකරණ ආශ්‍රිත ප්‍රාග්ධන වියදම රු. මි.2,139ක් වශයෙන් ගණනය විය. (2011/12:රු. මි.2,692)

**දේපළ, පිරියත සහ උපකරණ**

ශේෂ පත්‍රයේ දිනට සමූහයට අයත් දේපළ, පිරියත සහ උපකරණ වල ශුද්ධ පොත් අගය රු. මි.8,155 ක් වශයෙන් ගණනය විය. (2011/12:රු. මි.7,234). දේපළ, පිරියත සහ උපකරණ හා ඒවායේ සංචලනය පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශ වලට අදාළ 3 වන සටහනෙහි දක්වා ඇත.

**ප්‍රකාශිත ප්‍රාග්ධනය**

සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. මි. 32,033ක් වශයෙන් ගණනය වේ. (2011/12: රු. මි. 19,433).

සමාලෝචිත වසර තුළ ශ්‍රී ලංකා රජය විසින් භාණ්ඩාගාර බැඳුම්කරයක අනුසාරයෙන් වූ රු. මි. 12,600 ක් වූ කොටස් ප්‍රාග්ධනයක් උදෙසා අත්තිකාරමක් වශයෙන් වූ මුදලක් ආයෝජනය කර ඇත. ශ්‍රී ලංකා රජය වෙත කෙරෙන පෞද්ගලික මුදල් ප්‍රතිස්ථාපනයක අනුසාරයෙන් සාමාන්‍ය කොටස් නිකුත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය කොටස් හිමියන්ගේ අනුමැතියට යටත්ව සාංගමික ව්‍යවස්ථාවලියේ 9 වන ව්‍යවස්ථාව ප්‍රකාරව බලය ප්‍රදානය කර ඇත.

මෙම කොටස් නිකුත් කිරීම සඳහා වන කොටස් හිමියන්ගේ අනුමැතිය 2013 සැප්තැම්බර් මස 26 වන දින පැවැත්වීමට නියමිත අතිවිශේෂ මහ සභා රැස්වීමේ දී ඉල්ලා සිටිනු ඇත.

**සංචිත**

2013 මාර්තු මස 31 වන දිනට සමූහයේ මුළු සංචිත ප්‍රමාණය සෘණ රු. මි. 39,193ක් වශයෙන් ගණනය වේ. (2011/12: සෘණ රු. මි. 16,383) රු. මි. 40,743ක් වූ සමුච්චිත අලාභයක්ද (2011/12: සමුච්චිත ලාභය රු. මි.18,163), රු. මි. 2,523ක් වූ ප්‍රාග්ධන සංචිත ප්‍රමාණයක්ද (2011/12: රු. මි. 2,523), රුපියල් මිලියන 1,027ක් වූ සෘණ සාධාරණ වටිනාකම් සංචිත ප්‍රමාණයක්ද (2011/12: සෘණ රු. මි. 796), රුපියල් මිලියන 0.63 ක්වූ ආදයම් සංචිත ප්‍රමාණයක්ද (2011/12: රු. මි. 0.63), රු. මි. 53ක් වූ පොදු සංචිත ප්‍රමාණයක්ද (2011/12: රු. මි. 53) මෙහි අඩංගු වේ. මූල්‍ය ප්‍රකාශයන්හි දැක්වෙන කොටස් ආයෝජන වෙනස්කම් පිළිබඳ ප්‍රකාශයෙහි මෙම සංචිත ආශ්‍රිතව සිදුවූ සංචලනය නිරූපණය කර ඇත.

**ආයතනික ප්‍රදාන**

වසර තුළ සමූහය විසින් කිසිදු මුදල් ප්‍රදානයක් සිදු කර නොමැත. දේශපාලනමය අරමුණු සඳහා ප්‍රදාන කිසිවක්ද සිදු කර නැත.

**බදුකරණය**

සමාගම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ එළඹ ඇති ස්වකීය ගිවිසුම අනුව 2013 මාර්තු මස 31 වන දින දක්වා බදු විරාමයක් භුක්ති විඳියි. 2011 අංක 22 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත මගින් සංශෝධිත 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාරව 2021 මාර්තු මස 31 වන දින දක්වා ස්වකීය සියලුම ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් වූ සෑම බද්දකින්ම සමාගම නිදහස ලබා ඇත.

දැනට ශ්‍රී ලංකාව හා ද්විත්ව බදු ගිවිසුම් ක්‍රියාත්මක නොකරන රටවල් වලදී සිදුකෙරෙන ස්වකීය එතෙර මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් සමාගම බදු ගෙවනු ලැබීමට යටත් වේ.

සමාගමේ පූර්ණ අයිතිය සතු සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් අනුබද්ධ ආයතනය සම්බන්ධයෙන් සලකා බලන කළ, එය යානාස්ථ මුළුතැන් ගෙවල් වලින් සහ මාර්ගස්ථ අවන්හල් වලින් උපයන ආදායම, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය හා බැඳුනු ගිවිසුම අනුව 2006 ජූනි මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි බද්දෙන් නිදහස්ය. වෙනත් ප්‍රභවයන් වෙතින් උත්පාදනය වන ආදායම සාමාන්‍ය බදු අනුපාත අනුව බදු ගෙවනු ලැබීමට යටත් වේ.

**කොටස් තොරතුරු**

2013 මාර්තු මස 31 වන දිනට කොටස් හා සම්බන්ධ තොරතුරු පහත දැක්වේ.

| **කොටස් අයිතිය** | **කොටස්ගණන** | **හිමිකම් ප්‍රතිශතය** |
|---|---:|---:|
| ශ්‍රී ලංකා රජය | 26,275,436 | 51.06% |
| ලංකා බැංකුව | 12,115,570 | 23.54% |
| මහජන බැංකුව | 4,236,135 | 8.23% |
| ජාතික ඉතිරි කිරීමේ බැංකුව | 4,236,135 | 8.23% |
| සේවක අර්ථසාධක අරමුදල | 1,863,676 | 3.62% |
| වෙනත් | 2,736,511 | 5.32% |

ඉහත සඳහන් කොටස් තොරතුරු දක්වා ඇත්තේ ශ්‍රී ලංකා රජය විසින් ලබා දී ඇති කොටස් ප්‍රාග්ධනය හා සම්බන්ධ රු. බි. 28.69 ක් වූ අත්තිකාරම් මුදල රහිතවය.

**අවිනිශ්චිත බැරකම් හා ප්‍රාග්ධන බැඳීම්**

2013 මාර්තු මස 31 වන දිනට පැවති අවිනිශ්චිත බැරකම් හා එදින වන විට එළඹී බැඳීම් ප්‍රමාණය මූල්‍ය ප්‍රකාශ වලට අදාළ 23 වන සටහනින් නිරූපණය වේ.

**ශේෂ පත්‍ර දිනයෙන් පසුව උද්ගතවූ සිදුවීම්**

මූල්‍ය ප්‍රකාශ වලට අදාළ 25 වන සටහනින් හෙළිදරව් කර ඇති කරුණු හැරුණු විට ගැළපුම් හෝ හෙළිදරව් කිරීම් අවශ්‍ය වන්නා වූ ශේෂ පත්‍ර දිනෙන් පසුව සිදුවූ කරුණු කිසිවක් උද්ගත වී නොමැත.

**සේවා නියුක්තිය පිළිබඳ ප්‍රතිපත්ති**

ව්‍යාපාර සමූහයට අයත් සේවා නියුක්තිය පිළිබඳ ප්‍රතිපත්ති වලින් පුද්ගල භාවය ගරුත්වයෙහිලා සැලකෙන අතර ස්ත්‍රී පුරුෂ භාවය, ජාතිය හෝ ආගම නොසලකා සෑමට එක සමාන වෘත්තීය අවස්ථා උදා කර දෙනු ඇත. වසර අවසන සමාගම සහ ඊට අනුබද්ධ ආයතන විසින් සේවයෙහි යොදවන ලද තැනැත්තන් සංඛ්‍යාව 7,241 ක් විය.(2011/12: 6,367)

**ව්‍යවස්ථාපිත ගෙවීම්**

සේවක සේවිකාවනට හා ශ්‍රී ලංකා රජයට අදාළ සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් අද දින දක්වා සිදුකර ඇති බවට තම උපරිම දැනුමේ හා විශ්වාසයට අනුව අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමට පත්වෙයි.

**පාරිසරික ආරක්ෂාව**

සමූහයට අයත් ව්‍යාපාර කටයුතු මගින් පරිසරයට සෘජු හෝ වක්‍ර බලපෑම් එල්ල විය හැකිය. පරිසරයට සිදු විය හැකි අහිතකර බලපෑම් අවම මට්ටමක තබා ගැනීමත්, බලධාරීන් සමඟ සහයෝගයෙන් කටයුතු කරමින් අදාළ අණපනත් වලට අනුකූලව කටයුතු කිරීමත් සමූහයේ ප්‍රතිපත්තියයි.

**ආයතනික පාලනය/අභ්‍යන්තර පාලනය**

වර්තමාන ආයතනික ලෝකය තුළ යහපාලන විධි අනුගමනය කිරීම අත්‍යවශ්‍ය නියමයක් බවට පත්ව තිබේ.

සමූහයේ අභ්‍යන්තර පාලන ක්‍රමවේදය පිළිබඳව තමන් වගකීම දරන බව අධ්‍යක්ෂ මණ්ඩලය පිළිගනියි. වත්කම් ආරක්ෂා කිරීම, විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ගැනීම හා උත්පාදිත තොරතුරු වල විශ්වාසනීයත්වය යන කාරණා අනෙකුත් කරුණු ද අතර සහතික කෙරෙනු පිණිස මෙම ක්‍රමවේදය නිර්මාණය කර ඇත. එසේ වුවද, වැරදි සිදුවීම් හා අක්‍රමිකතාවන් කිසියම් සාධාරණ කාලයක් තුළ වළක්වා ගන්නා බවට හෝ අනාවරණය කරගනු ලබන බවට එවැනි ක්‍රමවේදයක් තුළින් වගබලාගත හැක්කේ කිසියම් යුක්ති සහගත මට්ටමක් දක්වා පමණක් වන අතර, එහිලා පූර්ණ සහතිකවීමක් කළ නොහේ. අධ්‍යක්ෂ මණ්ඩලීය විගණන කමිටු වාර්තාව මෙම වාර්ෂික වාර්තාවට අයත් අංගයක් සේ සැකසී ඇත.

මූල්‍ය ප්‍රකාශ අත්සන් කරන ලද දිනය තෙක් කාල පරිච්ඡේදය සඳහා වූ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයේ සඵලත්වය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමට පත්වේ.

**ක්‍රියාත්මක ව්‍යාපාර තත්ත්වය**

අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශයෙහි දක්වා ඇති පරිදි, අදාළ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමෙහි ලා සමාගම ක්‍රියාත්මකව පවත්නා ව්‍යාපාරයක්ය යන පදනම මත පිහිටා අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කර ඇත.

**වත්මන් අධ්‍යක්ෂ මණ්ඩලය**

සමාගමේ වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය පහත දැක්වේ.

| | |
|---|---|
| නිශාන්ත වික්‍රමසිංහ මහතා | - සභාපති |
| නිහාල් ජයමාන්න මහතා, ජ.නී. | - අධ්‍යක්ෂ |
| කපිල චන්ද්‍රසේන මහතා | - අධ්‍යක්ෂ |
| ෂමීන්ද්‍ර රාජපක්ෂ මහතා | - අධ්‍යක්ෂ |
| මනිලාල් ප්‍රනාන්දු මහතා | - අධ්‍යක්ෂ |
| ලක්ෂ්මී සංගක්කාර මහත්මිය | - අධ්‍යක්ෂ |
| සනත් උක්වත්ත මහතා | - අධ්‍යක්ෂ |
| සුසන්ත රත්නායක මහතා | - අධ්‍යක්ෂ |

2012 අප්‍රියෙල් මස 01 වන දිනට අධ්‍යක්ෂ වරයෙකුව සිටි ඩබ්ලිව්. ඒ. නාලිනී මහත්මිය 2012 ජූලි මස 4 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඉල්ලා අස්වූවාය.

**ශ්‍රීලංකන් කේටරින් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය**

ශ්‍රීලංකන් කේටරින් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| නිශාන්ත වික්‍රමසිංහ මහතා | - | සභාපති |
| නිහාල් ජයමාන්න මහතා, ජ.නී. | - | අධ්‍යක්ෂ |
| ෂමීන්ද්‍ර රාජපක්ෂ මහතා | - | අධ්‍යක්ෂ |
| කපිල චන්ද්‍රසේන මහතා | - | අධ්‍යක්ෂ |
| සුසන්ත රත්නායක මහතා | - | අධ්‍යක්ෂ |
| ආචාර්ය නාලක ගොඩහේවා මහතා* | - | අධ්‍යක්ෂ |
| සනත් උක්වත්ත මහතා | - | අධ්‍යක්ෂ |

* ස්වාධීන අධ්‍යක්ෂ

**අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකය**

අධ්‍යක්ෂ වරුන්ගේ පාරිශ්‍රමික පිළිබඳව මූල්‍ය ප්‍රකාශයෙහි 26 වන සටහන මගින් කරුණු අනාවරණය කර ඇත.

**අධ්‍යක්ෂවරුන්ගේ කොටස් හිමිකාරිත්වය**

තමන් දරන තනතුරේ නිල බලය කරණකොටගෙන සභාපතිවරයා ඇතුළු ශ්‍රී ලංකා රජය විසින් නාම යෝජනා කරනු ලබන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙක් සමාගමට අයත් සාමාන්‍ය කොටස් 03 ක හිමිකරුවෝ වෙති.

**අධ්‍යක්ෂවරුන් දරන ගිවිසුම් සබඳතා**

සමාගමට අයත් කොන්ත්‍රාත්වල අධ්‍යක්ෂ වරුන් දරන සබඳතා මූල්‍ය ප්‍රකාශයෙහි 26 වන සටහන මගින් හෙළිදරව් කර ඇති අතර ඒවා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී ප්‍රකාශයට පත් කරනු ලැබ තිබේ. සමාගමට අයත් යම් කොන්ත්‍රාත්තු වල හෝ යෝජිත කොන්ත්‍රාත්තු වල අධ්‍යක්ෂකවරුන් මගින් දරනු ලබන ඍජු හෝ වක්‍ර සම්බන්ධතා කිසිවක් නොමැත.

**වාර්ෂික මහ සභා රැස්වීම**

2013 සැප්තැම්බර් මස 26 වන දින වාර්ෂික මහ සභා රැස්වීම පවත්වනු ලැබේ.

**විගණකවරු**

වරලත් විගණකවරුන් වන අර්න්ස්ට් ඇන්ඩ් යංග් සමාගම ශ්‍රීලංකන් ගුවන් සමාගමේ විගණකවරුන් වශයෙන් නැවත පත් කරනු ලැබීමේ යෝජනාවක් 2007 අංක 07 දරන සමාගම් පනත අනුව වාර්ෂික මහ සභා රැස්වීමට ඉදිරිපත් කෙරෙනු ඇත.

විගණකවරුන්ගේ ගාස්තු පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශ වලට අදාළ 21 වන සටහනෙහි දක්වා ඇත. සමාගම සමග හෝ එහි අනුබද්ධ ආයතනය සමඟ (විගණකවරයෙකු වශයෙන් පවත්නා සම්බන්ධය හැරුණු විට) කිසිදු විගණකවරයෙකුගේ සබඳතාවක් නොමැත.

**අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,**

**අ/කළේ - මිල්ඩ්‍රඩ් පීරිස්**
**සමාගමේ ලේකම්**

............................ ............................

**අ/කළේ - අධ්‍යක්ෂ** **අ/කළේ - අධ්‍යක්ෂ**

**2013.07.30**

**අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශය**

සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශ වලට අදාළ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් විගණක වරුන්ගේ වාර්තාවේ 28 වන පිටුවෙහි ගෙනහැර දක්වා ඇති විගණක වරුන්ගේ වගකීම් වලට වඩා වෙනස් වේ.

මූල්‍ය වර්ෂය අවසානයේදී සමාගමේ සහ සමූහයේ කටයුතු වල තත්වය පිළිබඳ හා අදාළ මූල්‍ය වර්ෂය තුළ සමාගමේ සහ සමූහයේ ලාභය හෝ අලාභය පිළිබඳව සත්‍ය හා සාධාරණ මතයක් පිළිඹිබු වන පරිදි එක් එක් මූල්‍ය වර්ෂය වෙනුවෙන් වූ මූල්‍ය ප්‍රකාශ අධ්‍යක්ෂ වරුන් විසින් පිළියෙල කරනු ලැබිය යුතු බවට 2007 අංක 07 දරන සමාගම් පනත මගින් නියම කර ඇත. මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමෙහි ලා ප්‍රශස්ත ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ඒවා සුසංගත අයුරින් යොදා ඇත. යුක්තයුක්ත වූද, විචක්ෂණශීලී වූද නිගමන හා ඇස්තමේන්තු එහිලා සිදුකර ඇත. අදාළ පරිදි ගිණුම්කරණ ප්‍රතිපත්ති ද අනුගමනය කර ඇත.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් වලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවටත්, 2007 අංක 07 දරන සමාගම් පනතින් නියම කර ඇති පරිදි අදාළ තොරතුරු සැපයෙන බවටත් සහතික වනු පිණිස සමාගමේ සහ සමූහයේ මූල්‍ය තත්වය යුක්ති සහගත නිවැරදිතාවයකින් යුක්තව හෙළිදරව් කිරීම සඳහා අදාළ සමාගම් සහ අනුබද්ධ ආයතන ප්‍රමාණවත් ගිණුම් වාර්තා තබා ගත යුතු බවට වගබලා ගැනීම අධ්‍යක්ෂ වරුන්ගේ වගකීම වේ. සමූහයට අයත් වත්කම් ආරක්ෂා කරගනු පිණිස යුක්ති සහගත ක්‍රියාමාර්ග ගැනීමේ වගකීමද ඔවුහු දරති. ඒ අනුව සලකන කළ වංචා හා අක්‍රමිකතා සිදුවීම වැළැක්වීමේ අටියෙන් සුදුසු අභ්‍යන්තර පාලන ක්‍රම ස්ථාපනය කිරීම සම්බන්ධයෙන්ද නිසි සැලකිල්ලක් ඔවුන් විසින් දැක්විය යුතුය.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමෙහි ලා ක්‍රියාකාරී ව්‍යාපාර පදනම අනුගමනය කිරීම අධ්‍යක්ෂකවරුන් තව දුරටත් පවත්වාගෙන ගියේය. සමාගමට අයත් මූල්‍ය ප්‍රවාහය හා ණය ගැනුම් පහසුකම් ඇතුළු 2013 මාර්තු 31 වන දිනට අවසන් මූල්‍ය වර්ෂය සඳහා වන අයවැය ලේඛනය පිළිබඳව විමසා බලා ඒ පිළිබඳව සමාලෝචනයක් කිරීමෙන් හා ශ්‍රී ලංකා රජය විසින් නික්ෂේපණය කිරීමට නියමිත කොටස් ආයෝජනයට අදාළ ඇමරිකන් ඩොලර් මිලියන 500 ක්වූ අනුමත අරමුදල්කරණයේ ශේෂයද සැලකිල්ලට ගැනීමෙන් පසුව ස්වකීය මෙහෙයුම් කටයුතු කරගෙන යාමට සමාගම සන්තකයේ ප්‍රමාණවත් සම්පත් ප්‍රමාණයක් ඇතැයි අධ්‍යක්ෂවරු නිගමනය කර ඇත.

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ ස්වකීය මතය ගොඩනගා ගැනීමට තමන්ට හැකිවනු පිණිස සුදුසු වේයැයි ඔවුන් සලකනු ලබන මොනයම් හෝ පරීක්ෂා කිරීමක් සිදු කිරීමට විගණකවරුන්ට සෑම අවස්ථාවක්ම සලසා දෙනු ලබන බවට සහතික වනු සඳහා අධ්‍යක්ෂ වරුන් අවශ්‍ය පියවර ගෙන තිබේ.

ගිණුම් වාර්තා කරනු ලබන දිනට සමාගමට සහ එහි අනුබද්ධ ආයතනයට අදාළව පැවති සියලු බදු හා ගාස්තු මෙන්ම අනෙකුත් මූල්‍ය බැඳීම්ද ගෙවා ඇති බවත්, එසේ නැතහොත් ඒවා අදාළ මූල්‍ය ප්‍රකාශ මගින් ප්‍රතිපාදනය කර ඇති බවත් අධ්‍යක්ෂ මණ්ඩලය සිය උපරිම දැනුම අනුව තහවුරු කර සිටී.

**අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,**

**අ/කළේ - මිල්ඩ්‍රඩ් පීරිස්**
**සමාගමේ ලේකම්**

**2013 ජූලි 30 දින.**

**මණ්ඩලීය විගණන කමිටුවේ වාර්තාව**

**කාර්යභාරය හා වගකීම්**

ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ මණ්ඩලීය විගණන කමිටුවේ විෂය පථය හා වගකීම් පාලනය වනුයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද මණ්ඩලීය විගණන කමිටු ප්‍රඥප්තිය ප්‍රකාරවය. මණ්ඩලීය විගණන කමිටුවේ මූලික කාර්ය භාරය වනුයේ අභ්‍යන්තර පාලන පද්ධතිය, මූල්‍ය වාර්තාකරණ පද්ධතිය, ව්‍යාපාරික අදායම් කළමනාකරණය, අණපනත් හා රෙගුලාසිවලට අනුකූලතාව දැක්වීමේ සමාගම් ක්‍රියාවලිය, බාහිර විගණක වරයාගේ ස්වාධීනතාව සහ බාහිර විගණක කර්තව්‍ය යන කරුණු පිළිබඳව ස්වාධීන සමාලෝචනයක් සලසාදීම මගින් සිය රාජකාරී කටයුතු ඉටුකිරීමෙහිලා අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වීමයි.

**මණ්ඩලීය විගණන කමිටුවේ සංයුතිය හා රැස්වීම්**

මණ්ඩලීය විගණක කමිටුව සාමාජිකයන් තිදෙනකුගෙන් හා එක් ස්වාධීන නිරීක්ෂක වරයෙකුගෙන් සමන්විත වේ. 2013 මාර්තු මස 31 වන දිනට මණ්ඩලීය විගණන කමිටුවේ සාමාජිකයන් වූයේ සුසන්ත රත්නායක (සභාපති), සනත් උක්වත්ත (සාමාජික) සහ ලක්ෂ්මී සංගක්කාර (සාමාජික) යන මහත්ම මහත්මීන්ය. සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ නියෝජිතයා වන එස්.එම්.චන්ද්‍රපාල මහතා ස්වාධීන නිරීක්ෂක වරයා ලෙස කටයුතු කළේය.

2013 මාර්තු මස 31 වන දිනෙන් අවසන්වූ මූල්‍ය වර්ෂය තුළ මණ්ඩලීය විගණන කමිටුව රැස්වීම් 5 ක් පවත්වන ලදි. නිශ්චිත කරුණු පිළිබඳව මණ්ඩලීය විගණන කමිටුව දැනුවත් කිරීම සඳහා සමාගමේ කළමනාකරණ සාමාජිකයන් ඔවුන් වෙත ලැබෙන ආරාධනා පරිදි එකී රැස්වීම්වලට සහභාගි විය. මීට අමතර වශයෙන්, අභ්‍යන්තර විගණනයේ ස්වභාවය, විෂය පථය පිළිබඳ දැනුවත් වනු පිණිසත්, මූල්‍ය ප්‍රකාශ හා කළමනාකරණ වාර්තා සමාලෝචනයට භාජනය කිරීම පිණිසත් බාහිර විගණක වරුන් වන අර්නස්ට් ඇන්ඩ් යං විගණක සමාගම සමඟ මණ්ඩලීය විගණන කමිටුව රැස්වීම් පැවැත්වීය.

**සමූහාරක්ෂණය සහ උපදේශක සේවා**

ශ්‍රීලංකන් ගුවන් සේවා සමාගම යටතේ කටයුතු කරන සමූහ රක්ෂණ හා උපදේශක සේවා අංශය මණ්ඩලීය විගණන කමිටුව වෙත ඍජුවම වාර්තා කරයි. ව්‍යවසාය අවදානම් කළමනාකරණ කාර්ය රාමුව ක්‍රියාත්මක කිරීමෙහිලා තොරතුරු පද්ධති/තොරතුරු තාක්ෂණ පාලනය හා පහසුකම් ඇතුළුව අභ්‍යන්තර පාලන පද්ධතියේ ප්‍රමාණවත් භාවය, කාර්යක්ෂමතාව හා ක්‍රියාකාරිත්වය පිළිබඳ ස්වාධීන හා විෂය මූලික තක්සේරුවක් සමූහාරක්ෂණ හා උපදේශක සේවා අංශය මගින් සලසා දෙයි. ආයතනික කාර්ය පැවරුම් සම්බන්ධයෙන් කළමනාකරණය වෙත උපදේශක සේවා සැපයීම ද මෙම අංශයෙන් සිදුවේ.

**මූල්‍ය වර්ෂය තුළ මණ්ඩලීය විගණන කමිටුවේ ප්‍රධාන කටයුතු**

- තොරතුරු පද්ධති/තොරතුරු තාක්ෂණ පාලනය සහ විගණන නිර්දේශවල තත්වය ඇතුළුව අභ්‍යන්තර පාලන පද්ධතිය පිළිබඳව විගණනය විසින් නිරාවරණය කළ කරුණු සමාලෝචනයට හසු කරන ලදි.
- වඩා හොඳ පද්ධති පාලනයක් සඳහාත්, අපේක්ෂිත සේවා මට්ටම් වලදී ව්‍යාපාරික කර්තව්‍යයන්හී අඛණ්ඩ පැවැත්ම සඳහාත් සියලුම ආයතනික ප්‍රතිපත්ති හා ක්‍රියා පරිපාටි නිරූපණය වනු පිණිස ආයතනික කාර්ය සංග්‍රහය සැකසීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලෙස කළමාණාකරණයට නියෝග කරන ලදි.
- කාර්යස්ථාන ක්‍රියාවලි තුළ විද්‍යාමාන වූ පාලන දුර්වලතා හඳුනා ගැනීම සඳහා ඉන්දියාව හා මැද පෙරදිග යන කාර්යස්ථානවල කාර්ය සාධන විගණනය බාහිර පාර්ශව වෙත පැවරීම නිර්දේශ කරන ලදි.
- ව්‍යාපාර අවදානම්වල බලපෑම් සමනය කරනු පිණිස කළමනාකරණය විසින් අනුගමනය කරනු ලබන ප්‍රධාන ආයතනික මට්ටමේ අවදානම් හා ක්‍රියා පරිපාටි සමාලෝචනය කිරීම.
- ව්‍යාපාර බාධා වීම්/කඩා වැටීම් යනාදියෙන් සිදුවන බලපෑම් අවම කරගනු පිණිස විශිෂ්ටතම චර්යා හා අනුකූල වන පරිදි ව්‍යුහගත කාර්ය රාමුවක් ස්ථාපනය කරනු සඳහා ව්‍යාපාර අඛණ්ඩව පවත්වා ගැනීමේ සැලසුමක් සකසන ලෙස කළමනාකරණයට නියෝග කරන ලදි.

- තොරතුරුවලට ප්‍රවේශය, ආරක්ෂණය, සන්නිවේදනය, භාවිතය, රඳවා ගැනීම හා ව්‍යපරණය යන කරුණුවලට අදාළව මුහුණ දෙන ව්‍යාපාරික අවදානම්වල බලපෑම් අවම කරගනු පිණිස ආයතනික තොරතුරු ආරක්ෂණ කාර්ය සංග්‍රහය සමාලෝචනය කර අනුමත කිරීම.
- සියලුම අදාළ අණපනත් හා රෙගුලාසි අනුව කටයුතු කරන බවට නිශ්චය කරනු පිණිස කාර්තුමය පදනමක් මත සැකසූ සමාගමේ අනුකූලතා උපදෙස් සංග්‍රහය සමාලෝචනයට හසු කරන ලදි.
- බාහිර විගණක වාර්තාවේ ප්‍රතිඵල හා ඉස්මතු කර දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් කළමනාකරණයේ ප්‍රතිචාරය සමාලෝචනයට හසු කරන ලදි.
- දැනට ක්‍රියාත්මක මූල්‍ය වාර්තාකරණයේ කාර්ය රාමුව සහ ඉදිරියේදී අනුගමනය කිරීමට නියමිත නව ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති කාර්ය රාමුව අතර පවත්නා හිඩැස් හඳුනා ගැනීම පිණිස ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති විවර විශ්ලේෂණ වාර්තාව සමාලෝචනයට හසු කරන ලදි.

**අ/කළේ: සුසන්ත රත්නායක**
**සභාපති, මණ්ඩලීය විගණන කමිටුව.**
**2013.07.24**

Ernst & Young
Chartered Accountants
201 De Saram Place
P.O. Box 101
Colombo 10
Sri Lanka

Tel : +94 11 24635
Fax Gen : +94 11 26973
Tax : +94 11 55781
eysl@lk.ey.com
ey.com

අර්නස්ට් ඇන්ඩ් යංග්
වරලත් ගණකාධිකාරීවරු
201, ද සේරම් පෙදෙස,
තැ.පෙ. 101,
කොළඹ 10.

## ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ කොටස් හිමියන් වෙත ඉදිරිපත් කරනු ලබන ස්වාධීන විගණක වරුන්ගේ වාර්තාව

### මූල්‍ය ප්‍රකාශ පිළිබඳ වාර්තාව

2013 මාර්තු මස 31 වන දිනට පිළියෙල කළ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශ වලින්ද, එදිනට අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශ, සර්වව්‍යාපී ආදායම් ප්‍රකාශ, කොටස් ආයෝජනයේ වෙනස්වීම් ප්‍රකාශ හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ වලින්ද, වැදගත් ගිණුම් ප්‍රතිපත්ති පිළිබඳ සම්පිණ්ඩනයකින් හා කරුණු පැහැදිලි කිරීමේ වෙනත් සටහන් වලින්ද සමන්විත සී/ස ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමට (“සමාගම”) අයත් මීට යා කර ඇති මූල්‍ය ප්‍රකාශ සහ එකී සමාගමට සහ එහි අනුබද්ධ සමාගමට අයත් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ අප විසින් විගණනය කරනු ලැබ තිබේ.

### මූල්‍ය ප්‍රකාශ සම්බන්ධ කළමනාකරණයේ වගකීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර සාධාරණ අයුරින් ඉදිරිපත් කිරීමේ වගකීම කළමනාකරණය උසුලයි. වංචා හා වැරදි හේතුකාරකව තිබුණද නොතිබුණද සැලකිය යුතු අවප්‍රකාශ වලින් තොරව අදාළ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර සාධාරණව ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වන්නා වූ අභ්‍යන්තර පාලනය, පිරිසැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම යන කරුණුද, ප්‍රශස්ත ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා යොදා ගැනීම යන කරුණුද, අවස්ථානුරූපව යුක්තිසහගත වන්නාවූ ගිණුම් ඇස්තමේන්තු සාධනය යන කරුණු ද මෙහි වගකීමෙහි ලා අන්තර්ගත වේ.

### විගණනයේ විෂය පථය හා මතයේ පදනම

අපගේ වගකීම වන්නේ අප විගණනය පදනම් කර ගනිමින් මෙම මූල්‍ය ප්‍රකාශ පිළිබඳව මතයක් පළ කිරීමය. අප අපගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුව ඉටු කර ඇත. අදාළ මූල්‍ය ප්‍රකාශ සැලකිය යුතු අවප්‍රකාශ වලින් තොරව පවතින්නේද නොපවතින්නේද යන කරුණු පිළිබඳව යුක්ති සහගත සහතිකයක් ලබා ගැනීම සඳහා අදාළ විගණනය අප විසින් සැලසුම් කර ඉටුකරනු ලැබ තිබීම එකී ප්‍රමිතීන් තුළින් අපේක්ෂා කෙරේ.

මූල්‍ය ප්‍රකාශ වල අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන සාක්ෂි සෝදිසි පදනමක් මත පරීක්ෂා කිරීම විගණනයකට ඇතුළත් වේ. කළමනාකරණය විසින් භාවිතා කරන ලද ගිණුම් ප්‍රතිපත්ති හා සකසන ලද වැදගත් ඇස්තමේන්තු තක්සේරු කිරීම මෙන්ම මූල්‍ය ප්‍රකාශවල සමස්ත ඉදිරිපත් කිරීම ඇගයීමද විගණනයකට ඇතුළත් වේ.

අපගේ උපරිම දැනීම හා විශ්වාසය අනුව අපගේ විගණන කාර්යය සඳහා අවශ්‍ය සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් අප විසින් ලබා ගතිමු. එසේ හෙයින් අපගේ විගණනය අපගේ මතය සඳහා සාධාරණ පදනමක් සපයන්නේ යැයි අප විශ්වාස කරමු.

### මතය

අපගේ මතයට අනුව, අපගේ පරීක්ෂණයෙන් මේ දක්වා පෙනී යන අන්දමට, 2013 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වර්ෂය සඳහා සමාගම විසින් නිසි ගිණුම් පොත් පවත්වාගෙන ගොස් ඇති බවත්, 2013 මාර්තු මස 31 වන දිනට සමාගමේ මූල්‍ය තත්වය පිළිබඳව හා එදිනට අවසන් වර්ෂය සඳහා වූ සමාගමේ කාර්යකරණය හා එහි මුදල්

ප්‍රවාහය පිළිබඳව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ දර්ශනයක් පිළිබිඹු කරන බවත් පෙන්නුම් කරයි.

අපගේ මතයට අනුව, 2013 මාර්තු මස 31 වන දිනට අදාළ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ සහ එදිනට අවසන් වර්ෂය සඳහා වූ කාර්යකරණය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් ප්‍රකාරව ඉදිරිපත්කර ඇතැයි යනුවෙන්ද, සමාගමේ සහ එහි අනුබද්ධ සමාගමේ මූල්‍ය කටයුතු ඊට අයත් කොටස් හිමියන්ගේ අවශ්‍යතාවන්ටද සැලකිල්ල යොමු කරමින් එදින වනවිට ඉටුකර ඇතැයි යනුවෙන්ද සත්‍ය හා සාධාරණ දර්ශනයක් ගෙන හැර දක්වයි.

අපගේ මතය හා කිසිදු බැඳීමකින් තොරව මෙම මූල්‍ය ප්‍රකාශ වල දක්වා ඇති 2.1.2 වන සටහනට අපි අවධානය යොමු කරන්නෙමු.

**වෙනත් නෛතික හා නියාමන කරුණු පිළිබඳ වාර්තාව**

මෙම මූල්‍ය ප්‍රකාශ 2007 අංක 07 දරන සමාගම් පනතේ 151(2) සහ 153(2) සිට 153(7) දක්වා වූ වගන්ති වල නියමයන් සමඟ අනුකූල වේ.

**අ/කළේ - අර්න්ස්ට් ඇන්ඩ් යංග්**
**වරලත් ගණකාධිකාරිවරු**
**කොළඹ.**
**2013.07.30**

## 2013 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

**මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය**

| | සටහන | සමූහය 2013 රු.මි. | සමූහය 2012 රු.මි. | සමූහය 2011.4.1 රු.මි. | සමාගම 2013 රු.මි. | සමාගම 2012 රු.මි. | සමාගම 2011.4.1 රු.මි. |
|---|---|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | | | |
| **දේපළ,පිරියත හා උපකරණ** | 3 | 8,154.80 | 7,234.01 | 4,647.69 | 6,380.13 | 5,312.22 | 2,558.82 |
| ගුවන්යානා එන්ජින්වල ප්‍රධාන පිරිවැඩියා හා උත්ශ්‍රේණි | 4 | 11,430.46 | 6,684.88 | 6,080.36 | 11,430.46 | 6,684.88 | 6,080.36 |
| ගුවන්යානා නඩත්තු සංචිතය | 5 | 13,570.76 | 15,209.12 | 8,763.58 | 13,570.76 | 15,209.12 | 8,763.58 |
| ගුවන්යානා හා අතිරේක එන්ජින් තැන්පතු | | 2,967.38 | 3,056.59 | 2,113.03 | 2,967.38 | 3,056.59 | 2,113.03 |
| අස්පෘෂ්‍ය වත්කම් | 6 | 150.91 | 60.53 | 111.69 | 150.74 | 60.20 | 110.07 |
| ආයෝජන | 7.2 | 0.40 | 13,370.21 | 0.40 | 42.44 | 13,412.25 | 42.44 |
| | | 36,274.71 | 45,615.34 | 21,716.75 | 34,541.91 | 43,735.26 | 19,668.30 |
| **ජංගම වත්කම්** | 8 | 5,021.85 | 4,513.76 | 4,490.19 | 4,664.89 | 4,232.38 | 4,259.99 |
| ඉන්වෙන්ට්‍රි භාණ්ඩ | 9 | 15,320.25 | 14,233.25 | 10,781.06 | 14,509.85 | 13,498.51 | 10,282.99 |
| වෙළෙඳ හා වෙනත් ලැබීම් නියමිත | 5 | 6,331.17 | 2,608.50 | 2,506.16 | 6,331.17 | 2,608.50 | 2,506.16 |
| ගුවන්යානා නඩත්තු සංචිතය | | 160.97 | - | - | 160.97 | - | - |
| ගුවන්යානා හා අතිරේක එන්ජින් නඩත්තුව | 7.1 | 25,597.78 | - | - | 25,597.78 | - | - |
| ආයෝජන | 10.1 | 3,681.67 | 2,027.65 | 1,757.24 | 3,640.56 | 1,733.32 | 1,455.17 |
| බැංකු හා මුදල් ශේෂය | | 56,113.69 | 23,383.16 | 19,534.65 | 54,905.22 | 22,072.71 | 18,504.31 |
| **මුළු වත්කම්** | | 92,388.40 | 68,998.50 | 41,251.40 | 89,447.13 | 65,807.97 | 38,172.61 |
| **කොටස් ආයෝජන හා බැරකම්** | | | | | | | |
| **ප්‍රාග්ධනය හා සංචිත** | | | | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 11 | 32,032.75 | 19,432.67 | 5,146.35 | 32,032.75 | 19,432.67 | 5,146.35 |
| සංචිත | 12 | 1,549.42 | 1,780.59 | 1,840.05 | 877.71 | 1,108.88 | 1,168.34 |
| සමුච්චිත අලාභය | | (40,742.59) | (18,163.18) | (766.65) | (44,606.16) | (22,789.94) | (2,823.76) |
| **මුළු කොටස් ආයෝජනය** | | (7,160.42) | 3,050.08 | 6,219.75 | (11,695.70) | (2,248.39) | 3,490.93 |
| **ජංගම නොවන බැරකම්** | | | | | | | |
| වරණීය කොටස් | 13 | 1,000.00 | 1,000.00 | 1,000.00 | - | - | - |
| පොලී දරන බැරකම් | 14 | 26,373.61 | 3,752.26 | 1,824.63 | 27,210.76 | 4,595.47 | 2,645.96 |
| වෙනත් විලම්බිත බැරකම් | 15 | 5,531.49 | 5,232.48 | 4,211.97 | 5,247.39 | 4,962.06 | 3,990.46 |
| | | 32,905.10 | 9,984.74 | 7,036.60 | 32,458.15 | 9,557.53 | 6,636.42 |
| **ජංගම බැරකම්** | | | | | | | |
| වෙළඳ හා වෙනත් ගෙවීම් නියමිත | 16 | 48,627.15 | 46,550.59 | 21,121.67 | 50,509.90 | 48,906.30 | 21,510.26 |
| ගෙවිය යුතු ආදායම් බදු | | 230.46 | 211.03 | 204.98 | 175.45 | 175.45 | 175.45 |
| පොලී දරන බැරකම් | 14 | 17,786.11 | 9,202.06 | 6,668.40 | 17,999.33 | 9,417.08 | 6,359.55 |
| | | 66,643.72 | 55,963.68 | 27,995.05 | 68,684.68 | 58,498.83 | 28,045.26 |
| **මුළු කොටස් ආයෝජනය හා බැරකම්** | | 92,388.40 | 68,998.50 | 41,251.40 | 89,447.13 | 65,807.97 | 38,172.61 |

මෙම මූල්‍ය ප්‍රකාශ 2007 අංක 07 දරන සමාගම් පනතේ නියමයන්ට අනුකූල වේ.

...........................................

**අ/කළේ: මූල්‍ය අංශ ප්‍රධානී**

අධ්‍යක්ෂ මණ්ඩලය මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කර ඉදිරිපත් කිරීමේ වගකීම උසුලයි. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් පහත අත්සන් තබමි.

.................................................... ............................................

**අ/කළේ: අධ්‍යක්ෂ** **අ/කළේ: අධ්‍යක්ෂ**

අංක 35 සිට 79 දක්වා පිටුවල දැක්වෙන ගිණුම් ප්‍රතිපත්ති සටහන් මූල්‍ය ප්‍රකාශයන්හි අවශ්‍යම අංගයක් නියෝජනය කරයි.
2013.07.30 වන දින කොළඹ දීය.

## ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ලිමිටඩ්

**2013 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**ආදායම් ප්‍රකාශය**

| | සටහන | සමූහය 2013 රු.මි. | සමාගම 2012 රු.මි. | සමාගම 2013 රු.මි. | සමාගම 2012 රු.මි. |
|---|---|---|---|---|---|
| ආදායම | 18 | 121,407.66 | 94,638.60 | 119,570.90 | 92,867.93 |
| විකුණුම් පිරිවැය | | (129,688.50) | (100,451.90) | (131,598.38) | (101,830.07) |
| දළ (අලාභය)/ ලාභය | | (8,280.84) | (5,813.30) | (12,027.48) | (8,962.14) |
| වෙනත් ආදායම් හා ලාභ | 19 | 1,615.83 | 1,196.66 | 4,155.05 | 421.70 |
| විකුණුම් සහ අලෙවි පිරිවැය | | (9,851 .25) | (7,472.12) | (9,851 .25) | (7,472.13) |
| පරිපාලන වියදම් | | (4,421 .46) | (3,723.27) | (2,522.64) | (2,473.68) |
| මූල්‍ය වියදම් | 20.1 | (3,222.38) | (1,642.30) | (3,138.40) | (1,537.89) |
| මූල්‍ය ආදායම | 20.2 | 1,656.56 | 256.90 | 1,634.97 | 249.40 |
| **බදු පූර්ව අලාභය** | 21 | (22,503.54) | (17,197.43) | (21,749.75) | (19,774.74) |
| ආදායම් බදු වියදම් | 22 | (15.24) | (10.95) | - | (3.29) |
| **වර්ෂය සඳහා අලාභය** | | (22,518.78) | (17,208.38) | (21,749.75) | (19,778.03) |

අංක 35 සිට 79 දක්වා පිටුවල දැක්වෙන ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශනයන්හි අවශ්‍යම අංගයක් නියෝජනය කරයි.

**2013 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**සර්වව්‍යාපී ආදායම් ප්‍රකාශය**

| සමූහය | සටහන | ප්‍රකාශිත ප්‍රාග්ධනය | ප්‍රත්‍යාගණන සංචිතය | විකුණුම් සංචිතය සඳහා පවත්නා මුදල | ආදායම් සංචිතය | පොදු සංචිතය | සමුච්චිත අලාභය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | | | රු.මි. | රු.මි. | රු.මි | රු.මි | රු.මි | රු.මි. |
| **2011 මාර්තු 31 වන දිනට ශේෂය** | | 5,146.35 | 1,785.98 | - | 0.63 | 53.44 | (766.65) | 6,219.75 |
| වර්ෂය සඳහා අලාභය | | - | - | - | - | - | (17,208.38) | (17,208.38) |
| වෙනත් සර්වව්‍යාපී ආදායම් | | - | 736.67 | (796.13) | - | - | (188.15) | (247.61) |
| මුළු සර්වව්‍යාපී ආදායම් | | - | 736.67 | (796.13) | - | - | (17,396.53) | (17,455.99) |
| කොටස් ප්‍රාග්ධනය සඳහා අත්තිකාරම් | 11 | 14,286.32 | - | - | - | - | - | 14,286.32 |
| **2012 මාර්තු 31 වන දිනට ශේෂය** | | 19,432.67 | 2,522.65 | (796.13) | 0.63 | 53.44 | (18,163.18) | 3,050.08 |
| වර්ෂය සඳහා අලාභය | | - | - | - | - | - | (22,518.78) | (22,518.78) |
| වෙනත් සර්වව්‍යාපී ආදායම් | | - | - | (231.17) | - | - | (60.63) | (291.80) |
| මුළු සර්වව්‍යාපී ආදායම් | | - | - | (231.17) | - | - | (22,579.41) | (22,810.58) |
| කොටස් ප්‍රාග්ධනය සඳහා අත්තිකාරම් | 11 | 12,600.08 | - | - | - | - | - | 12,600.08 |
| **2013 මාර්තු 31 වන දිනට ශේෂය** | | 32,032.75 | 2,522.65 | (1,027.30) | 0.63 | 53.44 | (40,742.59) | (7,160.42) |

| සමාගම | සටහන | ප්‍රකාශිත ප්‍රාග්ධනය | ප්‍රත්‍යාගණන සංචිතය | විකුණුම් සංචිතය සඳහා පවත්නා මුදල | ආදායම් සංචිතය | පොදු සංචිතය | සමුච්චිත අලාභය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | | | රු.මි. | රු.මි. | රු.මි | රු.මි | රු.මි | රු.මි. |
| **2011 මාර්තු 31 වන දිනට ශේෂය** | | 5,146.35 | 1,114.27 | - | 0.63 | 53.44 | (2,823.76) | 3,490.93 |
| වර්ෂය සඳහා අලාභය | | - | - | - | - | - | (19,778.03) | (19,778.03) |
| වෙනත් සර්වව්‍යාපී ආදායම් | | - | 736.67 | (796.13) | - | - | (188.15) | (247.61) |
| මුළු සර්වව්‍යාපී ආදායම් | | - | 736.67 | (796.13) | - | - | (19,966.18) | (20,025.64) |
| කොටස් ප්‍රාග්ධනය සඳහා අත්තිකාරම් | 11 | 14,286.32 | - | - | - | - | - | 14,286.32 |
| **2012 මාර්තු 31 වන දිනට ශේෂය** | | 19,432.67 | 1,850.94 | (796.13) | 0.63 | 53.44 | (22,789.94) | (2,248.39) |
| වර්ෂය සඳහා අලාභය | | - | - | - | - | - | (21,749.75) | (21,749.75) |
| වෙනත් සර්වව්‍යාපී ආදායම් | | - | - | (231.17) | - | - | (66.47) | (297.64) |
| මුළු සර්වව්‍යාපී ආදායම් | | - | - | (231.17) | - | - | (21,816.22) | (22,047.39) |
| කොටස් ප්‍රාග්ධනය සඳහා අත්තිකාරම් | 11 | 12,600.08 | - | - | - | - | - | 12,600.08 |
| **2013 මාර්තු 31 වන දිනට ශේෂය** | | 32,032.75 | 1,850.94 | (1,027.30) | 0.63 | 53.44 | (44,606.16) | (11,695.70) |

අංක 35 සිට 79 දක්වා පිටුවල දැක්වෙන ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශනයන්හි අවශ්‍යාම අංගයක් නියෝජනය කරයි.

## ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ලිමිටඩ්

### 2013 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

**කොටස් ආයෝජනවල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය**

| සමූහය | සටහන | ප්‍රකාශිත ප්‍රාග්ධනය | ප්‍රත්‍යාගණන සංචිතය | විකුණුම් සංචිතය සඳහා පවත්නා මුදල | ආදායම් සංචිතය | පොදු සංචිතය | සමුච්චිත අලාභය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | | | රු.මි. | රු.මි. | රු.මි | රු.මි | රු.මි | රු.මි. |
| **2011 මාර්තු 31 වන දිනට ශේෂය** | | 5,146.35 | 1,785.98 | - | 0.63 | 53.44 | (766.65) | 6,219.75 |
| වර්ෂය සඳහා අලාභය | | - | - | - | - | - | (17,208.38) | (17,208.38) |
| වෙනත් සර්වව්‍යාපී ආදායම් | | - | 736.67 | (796.13) | - | - | (188.15) | (247.61) |
| මුළු සර්වව්‍යාපී ආදායම් | | - | 736.67 | (796.13) | - | - | (17,396.53) | (17,455.99) |
| කොටස් ප්‍රාග්ධනය සඳහා අත්තිකාරම් | 11 | 14,286.32 | - | - | - | - | - | 14,286.32 |
| **2012 මාර්තු 31 වන දිනට ශේෂය** | | 19,432.67 | 2,522.65 | (796.13) | 0.63 | 53.44 | (18,163.18) | 3,050.08 |
| වර්ෂය සඳහා අලාභය | | - | - | - | - | - | (22,518.78) | (22,518.78) |
| වෙනත් සර්වව්‍යාපී ආදායම් | | - | - | (231.17) | - | - | (60.63) | (291.80) |
| මුළු සර්වව්‍යාපී ආදායම් | | - | - | (231.17) | - | - | (22,579.41) | (22,810.58) |
| කොටස් ප්‍රාග්ධනය සඳහා අත්තිකාරම් | 11 | 12,600.08 | - | - | - | - | - | 12,600.08 |
| **2013 මාර්තු 31 වන දිනට ශේෂය** | | 32,032.75 | 2,522.65 | (1,027.30) | 0.63 | 53.44 | (40,742.59) | (7,160.42) |

| සමාගම | සටහන | ප්‍රකාශිත ප්‍රාග්ධනය | ප්‍රත්‍යාගණන සංචිතය | විකුණුම් සංචිතය සඳහා පවත්නා මුදල | ආදායම් සංචිතය | පොදු සංචිතය | සමුච්චිත අලාභය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | | | රු.මි. | රු.මි. | රු.මි | රු.මි | රු.මි | රු.මි. |
| **2011 මාර්තු 31 වන දිනට ශේෂය** | | 5,146.35 | 1,114.27 | - | 0.63 | 53.44 | (2,823.76) | 3,490.93 |
| වර්ෂය සඳහා අලාභය | | - | - | - | - | - | (19,778.03) | (19,778.03) |
| වෙනත් සර්වව්‍යාපී ආදායම් | | - | 736.67 | (796.13) | - | - | (188.15) | (247.61) |
| මුළු සර්වව්‍යාපී ආදායම් | | - | 736.67 | (796.13) | - | - | (19,966.18) | (20,025.64) |
| කොටස් ප්‍රාග්ධනය සඳහා අත්තිකාරම් | 11 | 14,286.32 | - | - | - | - | - | 14,286.32 |
| **2012 මාර්තු 31 වන දිනට ශේෂය** | | 19,432.67 | 1,850.94 | (796.13) | 0.63 | 53.44 | (22,789.94) | (2,248.39) |
| වර්ෂය සඳහා අලාභය | | - | - | - | - | - | (21,749.75) | (21,749.75) |
| වෙනත් සර්වව්‍යාපී ආදායම් | | - | - | (231.17) | - | - | (66.47) | (297.64) |
| මුළු සර්වව්‍යාපී ආදායම් | | - | - | (231.17) | - | - | (21,816.22) | (22,047.39) |
| කොටස් ප්‍රාග්ධනය සඳහා අත්තිකාරම් | 11 | 12,600.08 | - | - | - | - | - | 12,600.08 |
| **2013 මාර්තු 31 වන දිනට ශේෂය** | | 32,032.75 | 1,850.94 | (1,027.30) | 0.63 | 53.44 | (44,606.16) | (11,695.70) |

අංක 35 සිට 79 දක්වා පිටුවල දැක්වෙන ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශනයන්හි අවශ්‍යම අංගයක් නියෝජනය කරයි.

| | සටහන | සමූහය 2013 රු.මි. | සමූහය 2012 රු.මි. | සමාගම 2013 රු.මි. | සමාගම 2012 රු.මි. |
|---|---|---|---|---|---|
| **මෙහෙයුම් කටයුතු වලින් /(යොදාගත්) මුදල් ප්‍රවාහ** | | | | | |
| ආදායම් බදු වියදම් පූර්ව අලාභය ගැළපුම් කිරීම: | | (22,503.54) | (17,197.43) | (21,749.75) | (19,774.74) |
| ක්ෂයවීම/ කාලික ණය හිලව් කිරීම | | 4,522.77 | 3,689.90 | 4,256.71 | 3,434.06 |
| මූල්‍ය පිරිවැය | 20.1 | 3,222.38 | 1,642.30 | 3,138.40 | 1,537.89 |
| දේපළ, පිරියත හා උපකරණ ව්‍යපහරණ අලාභය | | 2.90 | 8.87 | 6.48 | 8.87 |
| මූල්‍ය ආදායම් | 20.2 | (1,656.56) | (256.90) | (1,634.97) | (249.40) |
| ලාභාංශ ආදායම් | | - | - | (150.00) | (150.00) |
| බොල් සහ අඩමාන ණය ප්‍රතිපාදන ප්‍රතිවර්තනය | | (47.58) | - | (47.58) | - |
| මන්දගාමීව චලනය වන ඉන්වෙන්ට්‍රි බඩු ප්‍රතිපාදනය | | 211.07 | 101.40 | 211.07 | 101.40 |
| නඩත්තු සංචිත අඩමාන අයකර ගැනීම් ප්‍රතිපාදනය - පොලී හැර | | 972.53 | 148.69 | 972.53 | 148.69 |
| උපලබ්ධි නොවූ විනිමය (ලාභයේ)/අලාභයේ බලපෑම | | (1,888.74) | (1,065.21) | (1,823.55) | 49.02 |
| පූර්ව විකුණුම් ලියාදැන්වීම් | | (967.03) | (3,775.09) | (967.03) | (3,775.09) |
| පාරිතෝෂික ප්‍රතිපාදන | 15.1 | 489.28 | 451.20 | 443.42 | 382.14 |
| කාරක ප්‍රාග්ධන වෙනස්කම් පූර්ව මෙහෙයුම් අලාභය | | (17,642.52) | (16,252.27) | (17,344.27) | (18,287.16) |
| ඉන්වෙන්ට්‍රි භාණ්ඩ වැඩිවීම | | (719.16) | (124.97) | (643.58) | (73.79) |
| වෙළඳ හා වෙනත් ලැබීම් නියමිත වැඩිවීම | | (312.54) | (2,648.11) | (236.83) | (2,424.05) |
| වෙළඳ හා වෙනත් ගෙවීම් නියමිත වැඩිවීම | | 2,579.27 | 27,735.61 | 2,237.08 | 28,922.11 |
| නඩත්තු සංචිත වැඩිවීම | | (3,297.88) | (4,326.70) | (3,297.88) | (4,326.70) |
| ගුවන් යානා ආරක්ෂක තැන්පතු වැඩිවීම | | (91.13) | (552.97) | (91.13) | (552.97) |
| මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ /(යොදාගත්) මුදල් | | (19,483.96) | 3,830.59 | (19,376.61) | 3,257.44 |
| ගෙවූ මූල්‍යන පිරිවැය | | (2,714.62) | (1,087.41) | (2,568.20) | (917.67) |
| ගෙවූ පාරිතෝෂික | 15.1 | (246.26) | (112.22) | (219.92) | (92.08) |
| ගෙවූ ආදායම් බදු | | - | (13.60) | - | - |
| මෙහෙයුම් කටයුතු වලින් /(යොදාගත් ) ශුද්ධ මුදල් ප්‍රවාහ | | (22,444.84) | 2,617.36 | (22,164.73) | 2,247.69 |
| **මෙහෙයුම් කටයුතු වලින් /(යොදාගත් ) මුදල් ප්‍රවාහ** | | | | | |
| ලැබූ පොලිය | | 1,098.83 | 20.30 | 1,098.83 | 13.42 |
| කොටස් ආයෝජන | | - | (0.87) | - | (0.87) |
| දේපළ, පිරියත හා උපකරණ අත්කර ගැනීම | | (2,021.85) | (1,503.93) | (1,904.44) | (1,428.75) |
| එන්ජින් පිරිවැඩියා සඳහා ගෙවීම් | | (8,129.65) | (3,199.40) | (8,129.65) | (3,199.40) |
| අස්පෘෂ්‍ය වත්කම් අත්කර ගැනීම් | | (140.78) | (1.55) | (140.24) | (1.40) |
| දේපළ, පිරියත හා උපකරණ ව්‍යපහරණයෙන් ලත් මුදල් | | 8.38 | 12.60 | 5.42 | 12.60 |
| ආයෝජන කටයුතු වල යෙදවූ ශුද්ධ මුදල් | | (9,185.07) | (4,672.85) | (9,070.08) | (4,604.40) |
| මූල්‍යන කටයුතු වලින් /(යොදාගත්) මුදල් ප්‍රවාහ | | | | | |
| පොලී දරන බැරකම් ආපසු ගෙවීම | | (7,536.70) | (2,548.83) | (9,741 .32) | (2,239.87) |
| පොලී දරන ණය සහ ණය ගැනුම් වලින් ලත් මුදල් | | 37,966.97 | 5,119.05 | 40,029.71 | 5,119.05 |
| මූල්‍යන කටයුතු වලින් /(යොදාගත්) ශුද්ධ මුදල් | | 30,430.27 | 2,570.22 | 30,288.39 | 2,879.18 |
| **මුදල් හා මුදල් සාම්‍යයන්හි ශුද්ධ වැඩිවීම / (අඩුවීම)** | | (1,199.64) | 514.73 | (946.42) | 522.47 |
| **වසරාරම්භ මුදල් හා මුදල් සාම්‍යයන්** | 10 | (3,338.39) | (3,853.12) | (3,632.72) | (4,155.19) |
| **වසරාවසාන මුදල් හා මුදල් සාම්‍යයන්** | 10 | (4,538.03) | (3,338.39) | (4,579.14) | (3,632.72) |

අංක 35 සිට 79 දක්වා පිටුවල දැක්වෙන ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශයන්හි අවශ්‍යම අංගයක් නියෝජනය කරයි.

## 1. ආයතනික තොරතුරු

### 1.1 සාමාන්‍ය

**සමාගම**

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ලිමිටඩ් ("සමාගම") ආයතනය ශ්‍රී ලංකාව තුළ සංස්ථාගතව හා නිවෙස්නගතව ඇති සීමිත වගකීම් සමාගමකි. සමාගමේ ලියාපදිංචි කාර්යාලය හා ප්‍රධාන ව්‍යාපාර ස්ථානය ගුවන් සමාගම් මධ්‍යස්ථානය, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ, කටුනායක, ශ්‍රී ලංකාව යන ලිපිනයෙහි පිහිටා ඇත.

### 1.2 ප්‍රධාන කර්තව්‍යයන් හා මෙහෙයුම් කටයුතු වල ස්වභාවය

**සමාගම**

මගීන්, ගුවන් බඩු හා ගුවන් තැපැල ප්‍රවාහනය සඳහා ජාත්‍යන්තර වශයෙන් නිශ්චිත කාලසටහන් සහිතව සහ රහිතව ශ්‍රී ලංකාව තුළ නම් කළ ගුවන් බඩු ප්‍රවාහකයා වශයෙන් ගුවන් සේවා ක්‍රියාත්මක කිරීම සමාගමේ ප්‍රධාන කර්තව්‍යයන් වේ. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ සහ මත්තල රාජපක්ෂ ගුවන් තොටුපළේ ගුවන් ගමන් පර්යන්ත සේවා සැපයීමත්, ගුවන්යානා තුළ තීරුබදු රහිත භාණ්ඩ විකිණීමත්, අභ්‍යන්තර හා බාහිර සංචාරක නිවාඩු පැකේජ අලෙවි කිරීමත්, මගී ප්‍රවාහනය සඳහා දේශීය ගුවන් ටැක්සි සේවා ක්‍රියාත්මක කිරීමත් සමාගමේ අනෙකුත් ප්‍රධාන කටයුතු අතර වේ. සමාගමේ සහායක සේවා කටයුතු සමන්විත වනුයේ තෘතීය පාර්ශව වලට නඩත්තු සේවා සැපයීමත්, ගුවන්යානා මෙහෙයුම් සේවා සලසා දීමත්, ගුවන් සේවා ආශ්‍රිත පුහුණු වැඩසටහන් මෙහෙයවීමත් යනාදියෙනි.

**අනුබද්ධ සමාගම - ශ්‍රීලංකන් කේටරින් ලිමිටඩ්**

ශ්‍රීලංකන් කේටරින් ලිමිටඩ් ("අනුබද්ධ සමාගම") ආයතනයේ ප්‍රධාන කර්තව්‍ය වනුයේ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ සහ මත්තල රාජපක්ෂ ගුවන් තොටුපළ ඔස්සේ ක්‍රියාත්මක වන ගුවන් සමාගම් වලට ගුවන්යානාස්ථ ආහාර පාන සැපයුම් සේවා සලසාදීමය. සමාගමේ සහායක සේවා, පොදු හා ගුවන් මගී මාර්ගස්ථ අවන්හල් ක්‍රියාත්මක කිරීම, ලොන්ඩරි සේවා සැපයීම හා ගුවන් ගමන් මගී මාර්ගස්ථ හෝටලය කළමනාකරණය යනාදී කටයුතු වලින් සමන්විත වේ.

### 1.3 නිකුතුව සඳහා බලය පවරන ලද දිනය

2013 ජූලි මස 30 වන දින අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනාවකට අනුව 2013 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම සම්බන්ධයෙන් බලය පවරා දෙන ලදි.

## 02. පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 2;1 පිළියෙළ කිරීමේ පදනම

ව්‍යාපාර සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරී ආයතනය විසින් නිකුත් කරන ලද සකසා ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති ( SLFRS/LAKS) අනුව පිළියෙළ කර තිබේ.

2012 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වූ වර්ෂය ඇතුළුව ඒ දක්වා වූ සියලු කාලපරිච්ඡේද සඳහා ව්‍යාපාර සමූහය ස්වකීය මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කර ඇත්තේ 2012 මාර්තු 31 දිනට අදාළ ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති ප්‍රකාරවය. 2013 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහාවූ මෙම මූල්‍ය ප්‍රකාශ 'SLFRS' ශ්‍රී ලංකා

ගිණුම් ප්‍රමිති අනුව ව්‍යාපාර සමූහය විසින් පිළියෙළ කරන ලද ප්‍රථම මූල්‍ය ප්‍රකාශ වේ. (සංක්‍රමණ විස්තරයට අදාළ 2.6 වන සටහන බලන්න)

ව්‍යාපාර සමූහය, 'SLFRS' ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති පදනම් කර ගත් 2011 අප්‍රියෙල් මස 1 වන දිනට අවසන් ස්වකීය ආරම්භක මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය පිළියෙළ කිරීමෙහිලා භාවිතයට ගැනුණු ගිණුම් ප්‍රතිපත්ති, ඒවා නිරතුරුවම ක්‍රියාත්මකව පැවතුනාක් මෙන් සලකා එකී දිනයේ සිට සියලු කාල පරිච්ඡේද ආවරණය වන පරිදි සමානුයෝගීව යොදා ගෙන ඇත.

සාධාරණ වටිනාකමක් මත අගයනු ලැබ ඇති ඉඩම් හා ගොඩනැගිලි සහ විකුණුම් ආශ්‍රිතව පවත්නා මූල්‍ය වත්කම් හැරුණු විට සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කරනු ලැබ ඇත්තේ ඓතිහාසික පිරිවැය පදනමක් මතය.

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල් වලින් (රු.) ඉදිරිපත් කරනු ලබන අතර වෙනත් අයුරකින් සඳහන් කර නොමැති විට, සියලුම මුදල් අගයන් ආසන්නතම රුපියල් දස ලක්ෂයට (මිලියනයට) වටරවුම් කර ඇත.

### 2.1.1 අනුකූලතා ප්‍රකාශය

සමගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද සකසා ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති (SLFRS) අනුව පිළියෙළ කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීම හා ඉදිරිපත් කිරීම 2007 අංක 07 දරන සමාගම් පනත හා අනුකූල වේ.

### 2.1.2 ක්‍රියාත්මක ව්‍යාපාර තත්වය

ප්‍රවර්තන වර්ෂය තුළ සමාගම රු. මි. 21,749.75 ක අලාභයක් ( 2012 රු. මි. 19,778.03) අත් විඳි අතර සමුච්චිත අලාභය රු.මි. 44,606.16 ක් වූයේය. (2012 - රු.මි. 22,789.94). තවද, සමාගමේ ජංගම බැරකම් රු. මි. 13,779.46 කින් (2012 - රු. මි. 36,426.12) එහි ජංගම වත්කම් ඉක්මවන ලද අතර ගිණුම් වාර්තා කිරීමේ දිනයට සමාගමේ මුළු කොටස් ආයෝජන ප්‍රමාණය රු.මි. 11,695.70 ක් වූ සෘණ අගයක් දක්වා පහත වැටී ඇත. (2012 සෘණ රු.මි. 2,248.39)

මෑත අතීතය තුළ විද්‍යාමාන වූ ගෝලීය ගුවන් ප්‍රවාහන කර්මාන්තය ආශ්‍රිත කාර්යකරණයේ පිරිහීම සමාලෝචිත වසර තුළද එලෙසම නොකඩවා පැවතියේය. මීට අමතර වශයෙන්, අඛණ්ඩව ඉහළ යන ඉන්ධන මිලත්, යුරෝපාකරයේ පැවති අවපාත තත්වයත් සමාගමේ කාර්යකරණයේ පසුබෑම කෙරෙහි බලපෑ ඇතැම් පරිබාහිර සාධක වූයේය. කෙසේ වුවද, මෙම බාහිර බලවේගවල නිෂේධ බලපෑම සමනය පිණිස සමාගම වසර තුළ බොහෝ පියවර ගත් අතර ඒවායේ ප්‍රතිඵල අනාගතයේදී අත් කර ගනු ලැබීමට නියමිතය.

සමාගම වෙනුවෙන් 2011 පූලි මාසයේදී අනුමත කරන ලද ප්‍රතිප්‍රාග්ධනකරණයේ සැලැස්ම අනුව රුපියල් මිලියන 12,600.08 ක් වූ එහි දෙවන ප්‍රාග්ධන නික්ෂේපණය (2012 - රු.මි. 14,286.32) මුදා හරිමින් ශ්‍රී ලංකා රජය සමාගම කෙරෙහි දැක්වූ බැඳියාව තව දුරටත් ප්‍රදර්ශනය කළේය. මෙම අරමුදල් සැපයීම කාලෝචිත ලෙස ගිණිය හැකි අතර එම ප්‍රාග්ධන නික්ෂේපණය මගින් සමාගමේ මූල්‍ය තත්වය ශක්තිමත් විය. එසේ වුවද, එම නික්ෂේපණය ද්‍රවශීල මුදල් අනුසාරයෙන් සිදු වූවක් නොවූ අතර මුදල් අවහිරතා ආශ්‍රිත අභියෝග දිගින් දිගටම පැවතියේය. එවන් මුදල් අවහිරතා සිය ව්‍යාපාරික කටයුතු පුළුල් කිරීමේ හා නවීකරණය කිරීමේ සමාගමේ සැලසුම් කෙරෙහි අහිතකර ලෙස බලපෑම් එල්ල කළේය. මේ පිළිබඳව ධනාත්මක දෘෂ්ටි කෝණයකින් බැලුවහොත් පැවසිය හැක්කේ, සමාගම මුදල් සපයා ගැනීම සඳහා ගිණුම් වාර්තා කිරීමේ දිනෙන් පසුව මෙම භාණ්ඩාගාර බැඳුම්කර (2013/14 මූල්‍ය වර්ෂයේ සිට) යොදවා ගෙන ඇති බවයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් උත්පාදනය වන එකී මුදල් ප්‍රතිෂ්ඨා සමාගමේ මුදල් ප්‍රවාහයේ තත්වය විශාල ලෙස ඉහළ නැංවීම පිණිස ඉඩ සලසා දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. අභියෝග මධ්‍යයේ වුවද, මෙහෙයුම් කටයුතුවල කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහාත්, සේවාලාභීන් වෙත තරඟකාරී නිමැවුම් සලසාදීම සඳහාත් පසුගිය තෙවර්ෂය මුළුල්ලේ සමාගමට අයත් කටයුතු හා එහි යටිතල පහසුකම් පුළුල් කර නවීකරණය කිරීමෙහිලා සැලකිය යුතු අයුරින් ආයෝජනය කිරීමට සමාගම සමත් විය. මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීමෙහිලා කටයුතු කරමින් ස්වකීය පුළුල් බඳ ගුවන්යානා වෙනුවට,විශේෂයෙන් ගිණුම් වාර්තා කිරීමේ දිනයට වසර 15 ක

සාමාන්‍ය ආයු කාලයක් ඉක්මවූ A 340 – 300 වර්ගයේ ගුවන්යානා හයකින් යුතු ඇණිය වෙනුවට, නවතම යානා ප්‍රති ඇණි ගත කිරීමේ ක්‍රියාදාමය ඉදිරියටම ගෙන යාම සඳහා සමාලෝචිත වසර තුළ සමාගම විසින් තීරණය කරනු ලැබීය. සමාගමේ කල්බදු ගිවිසුම අවසන් වන 2014/15 තෙවන කාර්තුව සහ 2015/16 තෙවන කාර්තුව අතර කාලපරිච්ඡේදය තුළ මෙම ගුවන්යානා වෙනුවට නවතම යුගල එන්ජින් සහිත A 330 – 300 වර්ගයේ ගුවන්යානා යොදවනු ලබනු ඇත. මෙමගින් සමාගමේ මෙහෙයුම් කටයුතු සඳහා බෙහෙවින් අවශ්‍ය වන්නාවූ කාර්යක්ෂමතාව ( අඩු ඉන්ධන දහනය සහ නඩත්තු පිරිවැය) සමාගම වෙත ලැබෙනු ඇති අතර අනෙකුත් තරඟකාරී ගුවන් සමාගම් විසින් පිරිනමනු ලබන පහසුකම් හා සමාන හෝ ඇතැම් විට ඊට ඉහළ මට්ටමේ සියලුම නවීන ගුවන් මගී සැප පහසුකම් සහිත නිමැවුමක් පිරිනැමීමට ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමට හැකි වනු ඇත. මෙම ගුවන්යානා ප්‍රති ඇණිගත කිරීමේ ව්‍යායාමය තුළින් තම අනාගත ආදායම් උත්පාදන හැකියාව කෙරෙහි වැදගත් ඵලදායී බලපෑමක් ඇතිවනු ඇතැයි සමාගම අපේක්ෂා කරයි.

සමාගම විසින් සමාලෝචිත වසර තුළ, යුරෝපයේ සිට වඩා ඵලදායී මැද පෙරදිග හා දකුණු ආසියාතික කලාපීය ගුවන් සේවා ධාරිතාව ප්‍රතිස්ථාපනය සහ ඉන්දියාව කරා වූ ස්වකීය ගුවන් සේවා ජාලය සවිමත් කිරීම වැනි වෙනත් වැදගත් මෙහෙයුම් තීරණ කීපයක් ද ගන්නා ලදී. 2014 වර්ෂයේ මුල් භාගය තුළ වන් වර්ල්ඩ් ගුවන් සන්ධානය වෙත ප්‍රවේශකත්වය සලසා ගැනීම සඳහා වූ ස්වකීය සැලැස්මද සහිතවූ මෙම ගුවන් සේවා ජාල උපරිම අයුරින් යොදා ගැනීමේ වැඩ පිළිවෙළ සමාගමේ උත්පාදන හැකියාව කෙරෙහි මහත් අනුබලයක් වනු ඇතැයි අපේක්ෂිතය.මෙම කාල වකවානුව තුළම නව ගුවන් මගී සේවා පද්ධතිය (ඇමීඩියස් ඇල්ටියා පද්ධතිය) ක්‍රියාවට නැංවීම තුළින් සමාගමේ මෙහෙයුම් ආශ්‍රිත කාර්යක්ෂමතා කටයුතු තව දුරටත් වර්ධනය වෙතැයි බලාපෙරොත්තු වේ.

ශ්‍රී ලංකාවේ අනාගතය හා සංචාරක කර්මාන්තය සඳහා වන ශ්‍රී ලංකා රජයේ දැක්ම හා සමගාමීව කටයුතු කරමින් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම ජාතික ගුවන් ප්‍රවාහකයා ලෙස මෙම ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීම උදෙසා සවිමත්ව දායකවීමට අදහස් කරයි. ඒ අනුව, සමාගමේ පස් අවුරුදු ව්‍යාපාරික සැලැස්ම, පුළුල් බඳ ගුවන්යානා ප්‍රතිඇණිගත කිරීමේ සැලසුම් හා ප්‍රාග්ධන නික්ෂේපණය මගින් ශ්‍රී ලංකා රජය විසින් සලසා දෙනු ලබන අඛණ්ඩ සහභාගිත්වය වැනි වැදගත් බාහිර හා අභ්‍යන්තර ප්‍රවනතා සැලකිල්ලට ගනිමින් යාවත්කාලීන කර ඇත.

ශ්‍රී ලංකා රජය විසින් පිරිනමනු ලබන නිරන්තර සහය සහ සමාගමේ ප්‍රති ශක්තිමත් කෙරුණු ව්‍යාපාර සැලැස්ම මත පදනම්ව එහි මූල්‍ය තත්වය වැඩි දියුණුවනු ඇතැයිද, නුදුරු අනාගතයේදී සමාගම සඵල ව්‍යාපාරයක් ලෙස එහි කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යනු ඇතැයිද යනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විශ්වාසය පළ කරයි.

## 2.2 ඒකාබද්ධ කිරීමේ පදනම

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ වල ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ලිමිටඩ් ආයතනයේ සහ එහි පූර්ණ හිමිකාරිත්වය සතු එම ආයතනයේ ශ්‍රීලංකන් කේටරින් ලිමිටඩ් නැමැති අනුබද්ධ ආයතනයේ මූල්‍ය ප්‍රකාශ අඩංගු වේ. වෙනත් අයුරකින් සඳහන් කර ඇති විට හැර අනෙකුත් සෑම අවස්ථාවලදීම සුසංගත ගිණුම් ප්‍රතිපත්ති යොදා ගනිමින් සමාගම විසින් වාර්තාකරණයේ දිනට සකසනු ලැබ ඇති පරිදිම වූ මූල්‍ය ප්‍රකාශ අනුබද්ධ සමාගම විසින්ද පිළියෙල කර තිබේ.

සියලුම අන්තර් සමූහ ව්‍යාපාර ශේෂ, ගණුදෙනු, ආදායම් හා වියදම්, ලාභ හා අලාභ සහ අන්තර් සමූහ ව්‍යාපාර ගණුදෙනු හේතුවෙන් උද්ගත වූ ලාභාංශ සම්පූර්ණයෙන්ම ඉවත් කරනු ලැබ ඇත.

අනුබද්ධ සමාගම එය සංස්ථාපනය කළ දින සිටම සම්පූර්ණ වශයෙන්ම සමාගම හා ඒකාබද්ධ වී ඇත. එම සංස්ථාගත කළ දිනයේ සිට අදාළ පාලනය ඇරඹී එය නතර වන දිනය දක්වා එකී අනුබද්ධ සමාගම, සමාගම සමඟ ඒකාබද්ධ වී නොකඩවා පවතිනු ඇත.

## 2.3 වැදගත් ඇස්තමේන්තු හා උපකල්පන

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා වූ ගණන් ප්‍රමාණ කෙරෙහි හා අදාළ රපෝර්තු දිනයට සිදුවූ හෙළිදරව් කිරීම් කෙරෙහි බලපෑ හැකි නිගමනයන්ට,

ඇස්තමේන්තුවලට හා උපකල්පනයන්ට එළඹීමට කළමනාකරණයට සිදුවේ. ප්‍රධාන නිගමනයන්, ඇස්තමේන්තු හා ඒ හා බැඳුනු උපකල්පනයන් නිරන්තරව ක්‍රියාත්මක වන පදනමක් මත ඇගයීමට ලක් වන අතර ඒවා ඓතිහාසික අත්දැකීම් මතද, අවස්ථානුගතව සාධාරණ යැයි විශ්වාස කරන අනාගත සිදුවීම් වල මතු අපේක්ෂාද ඇතුළත් වෙනත් සාධක මතද පදනම් වේ.

විෂයික වන්නා වූ මෙන්ම මූල්‍ය ප්‍රකාශ තුළ හඳුනා ගැනෙන මුදල් ප්‍රමාණ මත වැදගත් බලපෑමක් ඇති කරන්නා වූද අනෙකුත් කරුණු අතර පහත දැක්වෙන නිගමන ඇස්තමේන්තු හා උපකල්පන යෙදේ.

### (අ) නිගමන

### i. ක්‍රියාත්මක ව්‍යාපාර තත්වය

2:1:2 වන සටහටනෙහි හෙළිදරව් කර ඇති පරිදි මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇත්තේ ව්‍යාපාරය ක්‍රියාත්මක තත්වයේ පවතීයයි යන පදනම මත පිහිටාය.

### ii. අවිනිශ්චිත බැරකම් - නඩු කටයුතු

24 වන සටහනෙහි හෙළිදරව් කර ඇති පරිදි ප්‍රවර්තන මූල්‍ය වර්ෂයේ අවසානය වන විට විවිධ පාර්ශව කරුවන් සමඟ සමූහය නඩු කටයුතු ගණනාවකට එළඹ තීන්දු අපේක්ෂාවෙන් සිටියේය. අධ්‍යක්ෂ මණ්ඩලය සමාගමේ නීතිඥයන්ගේ ද උපදෙස් විමසා බැලීමෙන් අනතුරුව එක් එක් නඩු කෘත්‍යයේ යුක්තයුක්ත බව ඇගයුමට ලක් කරන අතර අනාගතයේදී සිදුවිය හැකි සම්පත් විගලනයක් පවතී යැයි නිශ්චය කළ හොත් ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදනද සිදු කරනු ලබයි.

### iii. ක්‍රියාකාරී කල්බදුකර

ගුවන්යානා හා එන්ජින් වලට අදාළව වානිජ කල්බදු ගිවිසුම් වලට සමාගම එළඹ සිටී. එම වත්කම් වල හිමිකාරිත්වයට ආනුෂංගික වූ සියලුම වැදගත් අවදානම් දැරීම් හා විපාක සමාගම විසින් රඳවා ගනු නොලබන බව හා සමාගමේ දේපළ, පිරියත හා උපකරණ වල කොටසක් ලෙස ඒවා නොගැනෙන බව තහවුරු වූ විට එකී ගිවිසගත් නියමයන් හා කොන්දේසි මත ක්‍රියාකාරී කල්බදුකර හඳුනා ගැනේ.

### (ආ) ඇස්තමේන්තු

### i. දේපළ, පිරියත හා උපකරණ ක්ෂයවීම

දේපළ, පිරියත හා උපකරණ යන වත්කම් වල අපේක්ෂිත ප්‍රයෝජනය හා ආර්ථික ආයුකාලය පදනම් කර ගනිමින් ඒවාට යම් ප්‍රයෝජ්‍ය ආයු කාලයක් හා අවශේෂ වටිනාකමක් කළමනාකරණය විසින් පවරා දෙනු ලබයි. දේපළ, පිරියත හා උපකරණ යනාදියට අයත් අවශේෂ අගය සහ ප්‍රයෝජ්‍ය ආයු කාලයද එක් එක් රපෝර්තු දිනට ඒවායේ ක්ෂයවීම් ක්‍රමයද කළමනාකරණය විසින් සමාලෝචනය කරන අතර, මෙම වත්කම්හි පූර්ව ඇස්තමේන්තු හා ඒවායේ අයිතමයන් තුළ අඩංගු ආර්ථික ප්‍රතිලාභ වල පරිභෝජන රටාව සමඟ එය සුසංගත වන බවටද වග බලා ගනියි. මෙම වත්කම් වල ප්‍රයෝජ්‍ය ආයු කාලය හා අවශේෂ වටිනාකම් අතර වෙනස්කම් අනාගත ක්ෂය අයකිරීම්හි සමාලෝචන වලට හේතු විය හැකිය. (2:4:3 (ආ) ප්‍රතිපත්තිය බලන්න).

### ii. මහා පරිමාණ ගුවන්යානා එන්ජින්වල මහා පරිමාණ පිරිවැඩියා පිරිවැය හිලව් කිරීම

එකඟත්වයට පත් කල්බදු ගිවිසුම් කොන්දේසි වලට අනුව ගුවන්යානා එන්ජින් හා ඒවායේ ගොඩබෑසුම් උපකරණ පිළිබඳව සූක්ෂම නඩත්තු පරීක්ෂා කටයුතු ඉටු කිරීම කළමනාකරණය විසින් කළ යුතුව තිබේ. එකී පරීක්ෂා කිරීම් සම්පූර්ණ වීමෙන් පසුව හා එම වත්කම් පරිහරණය පිණිස සූදානම් තත්වයට පැමිණි විට සමාගම ඊට අදාළ පිරිවැය ප්‍රාග්ධනිත කරයි. එසේ ප්‍රාග්ධනිත කළයුතු පිරිවැය පදනම් වනුයේ විකුණුම් කරුගේ ඉන්වොයිස් පත්‍ර රහිත පවත්නා හොඳම ඇස්තමේන්තු මතය. එහිලා එකී පරීක්ෂා කිරීම් සඳහා එකඟත්වයට පත්වූ ණය සටහන් පත් සහ කළින් ගෙවූ අරමුදල් ද සැලකිල්ලට ගැනේ. දරන ලද මුදලෙහි වටිනාකම හා ප්‍රාග්ධනනිත කරන ලද මුදලෙහි වටිනාකම අතර යම් වෙනසක් වේනම්, එය

ප්‍රලෝකනාත්මකව ක්‍රියාවට නැංවේ. ඉන් අනතුරුව එබඳු පිරිවැය එකී සූක්ෂ්ම නඩත්තු පරීක්ෂාවන්හි කාලසීමාව හා බදුකරයේ ඉතිරි වලංගු කාලසීමාව අතර පවත්නා ඇස්තමේන්තුගත පියාසර පැය ගණනට/චක්‍රවලට අයත් කෙටිම කාල පරිච්ඡේදය එල්ලේ හිලව් කරනු ලැබේ. ( 4 වන සටහන බලන්න).

### iii. නිරන්තර පියාසර වැඩසටහන

සමාගම 'ෆ්ලයිස්මයිල්ස්' නැමැති නිරන්තර පියාසර වැඩසටහනක් ක්‍රියාත්මක කර පවත්වාගෙන යනු ලබන අතර, එමගින් එහි සාමාජික සාමාජිකාවන් සඳහා ඔවුන්ගේ එකතු වන මුළු සැතපුම් ප්‍රමාණය පදනම් කරගෙන සංචාරක ප්‍රදාන පිරිනමයි. නිරන්තර පියාසර ප්‍රතිලාභ උපයෝජනයට ගැනෙන තෙක් ප්‍රදාන වලට අදාළ මගී ආදායමෙන් කොටසක් විලම්බනය කර තැබේ. ආදායම් විලම්බනය ඇස්තමේන්තු කෙරනුයේ අදාළ බැර ප්‍රදාන නිදහස් කර ගැනීමේ ඓතිහාසික ප්‍රවනතාවයේ පදනම මත පිහිටා වන අතර, එය එකී ප්‍රතිලාභ වලට අදාළ අපේක්ෂිත උපයෝජනය පුරෝකථනය පිණිස යොදා ගැනේ. ප්‍රදානය කරනු ලබන බැරෙහි සාධාරණ වටිනාකම ඇස්තමේන්තු කෙරෙනුයේ ප්‍රදානය කරනු ලබන බැර නිදහස් කර ගත හැකි සේවා වල සාධාරණ අගයට සැඳහුම් දක්වමිනි. ඇස්තමේන්තු එක් එක් රපෝර්තු දිනට සමාලෝචනය කරනු ලබන අතර අදාළ බැරකම් ඒ අනුව ගළපනු ලැබේ.

### iv. නඩත්තු සංචිතය

නඩත්තු සම්බන්ධයෙන් වූ එකඟත්වයට පත් කොන්දේසි මත පදනම්ව, මෙහෙයුම් බදුකර යටතේ පවත්නා ගුවන්යානා හා එන්ජින් කීපයක් වෙනුවෙන් අදාළ බදුකරුවන්ට සමාගම ගෙවීම් සිදු කරයි. මෙම මාසික ගෙවීම් පදනම් වනුයේ පියාසර කරන ලද පැය සහ චක්‍ර ගණන අනුවය. ආපසු අයකර ගත යුතු මෙම මුදල් ප්‍රමාණ වල වඩාත් යෝග්‍ය ඇස්තමේන්තු මත පදනම්ව එකී ගෙවීම් ආපසු අය කර ගැනීමට ඇති හැකියාව පිළිබඳව කළමනාකරණය කලින් කල ඇගයීම් සිදු කරයි. ආපසු අයකර ගැනීමේ හැකියාව අඩමාන වේ නම් ප්‍රතිපාදන වෙන් කරනු ලබයි. කිසියම් වත්කමක ඉදිරියට ගෙන යන මුදල එහි ආපසු අයකර ගත හැකි මුදල ඉක්මවන විට එම වත්කම දුබලත්වයට පත්වූ සේ සලකා එහි ආපසු අයකර ගත හැකි මුදල් වටිනාකමට ලියා දැක්වේ. (5 වන සටහන බලන්න).

### v. ඉන්වෙන්ට්‍රි භාණ්ඩ

ඉන්වෙන්ට්‍රි භාණ්ඩ වල පැවැත්ම හා ප්‍රයෝජ්‍යතාවය නිත්‍ය ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ගණනය කිරීමේ පදනමක පිහිටා සමාගම සමාලෝචනය කරයි. එම භාණ්ඩ වල ආපසු අයකර ගත හැකි වටිනාකමෙහි අඩුකිරීමක් ලෙස යල් පිනූ තොග සහ/හෝ වත්කම් සම්බන්ධයෙන් කළමනාකරණය නිගමනය කළ විට ඒ සඳහා ප්‍රතිපාදන සැපයේ. (8 වන සටහන බලන්න)

### vi. මූල්‍ය වත්කම් දුබලතාවයට පත්වීම

යම් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් දුබලත්වයට පත්වී ඇති බවට වාස්තවික සාක්ෂි තිබේදැයි එක් එක් රපෝර්තු දිනට සමූහය තක්සේරු කරයි. අඩමාන ණය පරිශේෂව පවත්නා කාල සීමාවත්, ඒවා ආපසු අයකර ගැනීමට ඇති හැකියාවේ අවිනිශ්චිත භාවය සම්බන්ධයෙන් පවත්නා කළමනාකරණයද දන්නා වෙනත් සාධකත් එම දුබලතා ඇස්තමේන්තු කිරීමෙහිලා ස්වකීය නිශ්චයමතිය තුළ පිහිටා කළමනාකරණය විසින් පාවිච්චි කරනු ලබයි.

## (ඇ) උපකල්පන

### i. නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම

ශ්‍රී ලංකාවේ සිට සේවය කරන කාර්ය මණ්ඩල වලට අයත් විශ්‍රාම ප්‍රතිලාභ සැලැස්මෙහි පිරිවැය නිශ්චය කෙරෙනුයේ ආයුගණක තක්සේරුවක් යොදා ගනිමිනි. එම ආයුගණක තක්සේරුව පදනම් වනුයේ පොලී අනුපාතය, වැටුප් වර්ධක අනුපාතය, විශේෂ වාරික මුදල, විශ්‍රාම ගැනීමේ වයස හා සමාගම ව්‍යාපාරිකව ක්‍රියාත්මක වීමේ තත්වය යන කරුණු වලට අදාළ උපකල්පන මතය. සැලසුමෙහි පවත්නා දිගු කාලීන

ස්වභාවය හේතුවෙන් එබඳු ඇස්තමේන්තු සැලකිය යුතු මට්ටමේ අවිනිශ්චිතතා වලට යටත් වේ. (2:4:15 වන සටහන බලන්න)

**ii. දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය**

ස්වාධීන සුදුසුකම් ලත් තක්සේරුකරුවෙකුගේ සේවය ලබා ගනිමින් ප්‍රත්‍යාගණනිත අගය මත දේපළ, පිරියත සහ උපකරණ වල වටිනාකම ගණන් බලනු ලැබේ. සාධාරණ අගයක් නිශ්වය කිරීම පිණිස එකී තක්සේරුකරු උපකල්පන සහ තක්සේරු ශිල්ප ක්‍රම භාවිතා කරයි. අදාළ තක්සේරු කිරීමේ පදනම 3 වන සටහනෙහි හෙළිදරව් කර ඇත.

## 2.4 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශය

### 2.4.1 විදේශ ව්‍යවහාර මුදල් පරිවර්තනය

සමාගමේ ව්‍යාපාරික කටයුතු ඉටුකිරීමේ හා ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල වන ශ්‍රී ලංකා රුපියල් වලින් මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කර ඇත. විදේශ ව්‍යවහාර මුදලින් සිදුවන ගනුදෙණු ,ඒවා සිදුවන දිනයට වලංගු ප්‍රායෝගික ව්‍යවහාර මුදල් අනුපාතයට අනුව මූලික වශයෙන් සටහන් කෙරේ. විදේශ ව්‍යවහාර මුදලින් ගණනය වන මූල්‍ය වත්කම් හා බැරකම් රපෝර්තු දිනයට වලංගුව පවත්නා ප්‍රායෝගික ව්‍යවහාර මුදල් අනුපාතයට නැවත පරිවර්තනය කරනු ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස උද්ගත වන ලාභ සහ අලාභ ආදායම් ප්‍රකාශය මගින් හඳුනා ගැනේ. විදේශ ව්‍යවහාර මුදලක ඓතිහාසික පිරිවැය ප්‍රකාරව ගණනය කෙරෙන මූල්‍යමය නොවන අයිතම අදාළ මුල් ගනුදෙනුව සිදුවූ දිනයේ පැවති විනිමය අනුපාත භාවිතයට ගනිමින් පරිවර්තනය කරනු ලැබේ.

### 2.4.2 බදුකරණය

**(i) ප්‍රවර්තන ආදායම් බදු**

**සමාගම**

**(අ) දේශීය බදුකරණය**

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් 1994 අගෝස්තු මාසයේදී 'සමාගමට' 'ෆ්ලැග්ෂිප්' තත්වය ප්‍රදානය කරන ලද අතර, එමගින් එතෙක් සමාගම අත්විඳි බදු නිදහස 1998 මාර්තු 31 වන දින දක්වා දීර්ඝ කරන ලදි. 1998 මාර්තු මාසයේදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය 2013 දින දක්වා තවදුරටත් බදු නිදහස් කාල සීමාවක් සමාගම වෙත ප්‍රදානය කළේය. 2011 පෙබරවාරි මාසයේදී ස්වකීය සියලුම ව්‍යාපාරික කටයුතු සඳහා 2011.04.01 සිට 2021.03.31 දක්වා ක්‍රියාත්මක වන දස අවුරුදු බදු නිදහස් කාලයක් 2011 අංක 22 දරන දේශීය ආදායම් (සංශෝධන) පනතින් සංශෝධිත 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන යටතේ සමාගම වෙත ලැබුණි.

**(ආ) එතෙර බදුකරණය**

ද්විත්ව බදු ගිවිසුම් ක්‍රියාත්මක නොවන රටවල් තුළ ස්වකීය විදේශීය ව්‍යවහාර මෙහෙයුම් කටයුතු මත සමාගම බදු ගෙවනු ලැබීමට යටත් වේ . කෙසේ වුවද, සමාගම අත්විඳි ඉදිරියට ගෙන ගිය බදු අලාභ හේතුවෙන් ප්‍රවර්තන වර්ෂය තුළ සමාගම සම්බන්ධ කිසිදු බදු බැඳියාවක් නොමැත.

**අනුබද්ධ සමාගම - ශ්‍රීලංකන් කේටරින් ලිමිටඩ්**

ආදායම් බදු වියදම්හි ප්‍රවර්තන හා විලම්බිත බදු අඩංගු වේ. කොටස් ආයෝජනයන් තුළ සෘජුවම හඳුනා ගැනෙන අයිතමයන්ට ලාභය හෝ අලාභය අදාළ වන තාක් දුරට හැරුණු විට ආදායම් බදු වියදම ලාභය හෝ අලාභය තුළ හඳුනා ගැනේ. එහිලා එය හඳුනා ගැනෙනුයේ කොටස් ආයෝජනය තුළය. ප්‍රවර්තන බදු යනු රපෝර්තු දිනයට පනවා ඇති හෝ ස්ථාවරව පනවා ඇති බදු අනුප්‍රමාණ උපයෝගී කර ගනිමින් වර්ෂය සඳහා වූ බදුවන ආදායම් මත ගෙවිය යුතු අපේක්ෂිත බද්ද සහ ඉකුත් වර්ෂ සම්බන්ධයෙන් ගෙවිය යුතු බදු

වෙනුවෙන් සිදු කරනු ලබන යම් ගැළපුම් වේ.

ආයෝජන මණ්ඩලය සමඟ ඇතිකර ගත් ගිවිසුම අනුව, යානාස්ථ මුළුතැන් ගෙවල් වලින් හා ගුවන් මගී මාර්ගස්ථ අවන්හලෙන් උද්ගත වන ආදායම 2021 මැයි මස 31 වන දින දක්වා ආදායම් බද්දෙන් නිදහස් වේ. වෙනත් ප්‍රභවයන් වෙතින් උද්ගත වන ආදායම සාමාන්‍ය බදු අනුප්‍රමාණ අනුව බද්දට යටත් වේ.

### (ii) විලම්බිත ආදායම් බදු

වත්කම් හා බැරකම් බදු මූලයන් හා ඒවායේ මූල්‍යමය වාර්තාකරණ කාර්යයන් සඳහා ඉදිරියට ගෙනයනු ලබන ගණන් ප්‍රමාණ අතර රපෝර්තු දිනට පවත්නා තාවකාලික වෙනස්කම් පිළිබඳව බැරකම් ක්‍රමවේදය භාවිතා කරමින් විලම්බිත ආදායම් බදු ප්‍රතිපාදනය කෙරේ.

**සමාගම**

සමාගම එහි බදු විරාම කාල සීමාව තුළ පසුවන හෙයින් දේශීය ආදායම් පනතේ විධිවිධාන අදාළ නොවන අතර, අදාළ තාවකාලික වෙනස්කම් බද්දෙන් නිදහස් කාලපරිච්ඡේදය තුළ උද්ගත වන්නේද නැත. ඒ අනුව මෙම මූල්‍ය ප්‍රකාශ වල විලම්බිත බදු කිසිවක් ප්‍රතිපාදනය කර නොමැත.

**අනුබද්ධ සමාගම - සී/ස ශ්‍රීලංකන් කේටරින් සමාගම**

මූල්‍යමය වාර්තාකරණ කාර්යයන් සඳහා ඉදිරියට ගෙනයනු ලබන වත්කම් හා බැරකම් වල ගණන් ප්‍රමාණ සහ බදුකරණ කාර්යයන් සඳහා උපයෝගීකර ගැනෙන ගණන් ප්‍රමාණ අතර තාවකාලික වෙනස්කම් සඳහා ප්‍රතිපාදන සලසා බැරකම් ක්‍රමය භාවිතා කරමින් විලම්බිත බදු හඳුනා ගැනේ. ප්‍රතිපාදනය කරනු ලැබ ඇති විලම්බිත බදු ප්‍රමාණය පදනම් වනුයේ, රපෝර්තු දිනට පනවා ඇති හෝ ස්ථිරව පනවා ඇති බදු අනුප්‍රමාණ උපයෝගී කර ගනිමින් ඉදිරියට ගෙන යනු ලබන වත්කම් වල හා බැරකම් වල උපලබ්ධි වීමේ හා නිරාකරණය වීමේ අපේක්ෂිත ආකාරය මතය.

ප්‍රධාන තාවකාලික වෙනස්කම් උද්ගත වනුයේ දේපළ, පිරියත හා උපකරණ ක්ෂයවීම ඉදිරියට ගෙන ගිය බදු අලාභ සහ නිශ්චිත ප්‍රතිලාභ ආශ්‍රිත බැඳීම් සඳහා වූ ප්‍රතිපාදන යන කරුණු ඔස්සේය.

ඉදිරියට ගෙනයනු ලබන අභාවිත වන අලාභ වලට අදාළ විලම්බිත වත්කම් හඳුනා ගැනෙනුයේ අනාගත බදුවල අලාභය එල්ලේ අභාවිත බදු අලාභ උපයෝගී කරගෙන ඇති ප්‍රමාණය අනුමාන යැයි සැලකෙන දුර ප්‍රමාණය දක්වාය.

විලම්බිත බදු වත්කම් හඳුනා ගැනෙනුයේ අනාගත බදුවල අලාභය එල්ලේ අභාවිත බදු අලාභ උපයෝගී කරගත හැකි එකී අනාගත බදුවන අලාභයේ ප්‍රමාණය අනුමාන යැයි සැලකෙන දුර ප්‍රමාණය දක්වාය. විලම්බිත බදු වත්කම් රපෝර්තු දිනට සමාලෝචනය කෙරෙන අතර ඊට අදාළ බදු ප්‍රතිලාභ උපලබ්ධි වීම තව දුරටත් අනුමාන නොවේ යැයි සලකනු ලබන දුර ප්‍රමාණයක් දක්වා අඩු කෙරේ.

## 2.4.3 දේපළ, පිරියත හා උපකරණ

### (අ) පිරිවැය හා තක්සේරු කිරීම

දේපළ, පිරියත හා උපකරණ යනාදී සියලුම අයිතම ප්‍රාරම්භක වශයෙන් සටහන් කෙරෙනුයේ ගත් මිලටය. අත්කර ගැනීම් හෝ ඉදිකිරීම්හි ලා සෘජුව ආරෝපනය කළ හැකි වියදම් පිරිවැයට ඇතුළත් වේ. දේපළ, පිරියත හා උපකරණ යනාදී අයිතම පසුව ප්‍රත්‍යාගණනය කිරීමේදී ඒවා පසු අවස්ථාවක සිදුවන යම් ක්ෂයවීම් හා දුබලතා ඌණ ප්‍රත්‍යාගණනිත ගණන් ප්‍රමාණ මත ඉදිරියට ගෙන යනු ලැබේ. අනෙකුත් සියලු දේපළ, පිරියත හා උපකරණ ක්ෂයවීම් හා/හෝ උපචිත දුබලතා අලාභ වෙතොත් ඒවාද අඩුකළ ඓතිහාසික පිරිවැය මත ප්‍රකාශ කෙරේ.

වත්කමක් ප්‍රත්‍යාගණනය කිරීමේදී එහි යම් ප්‍රත්‍යාගණන අතිරික්තයක් හඳුනා ගැනනුයේ, කලින් ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගනු ලැබ තිබූ එම වත්කමට අයත් ප්‍රත්‍යාගණන අඩුවීමක් කරා එය ප්‍රතිවර්තනය වනතාක් දුරකට හැරුණු විට, වෙනත් සර්වව්‍යාපී ආදායම් තුළ සහ එහි කොටස් ආයෝජන ලෙස සමුච්චිතවූ වත්කම් ප්රත්‍යාගණන සංචිතය තුළය. එහිලා අදාළ වැඩිවීම ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගැනේ. ප්‍රත්‍යාගණන ඌණතාවයක් ආදායම් ප්‍රකාශ තුළ හඳුනා ගැනෙනුයේ, වත්කම් ප්‍රත්‍යාගණන සංචිත තුළ හඳුනා ගනු ලැබ ඇති එම වත්කමේම දැනටමත් පවත්නා අතිරික්තයක් එය හිලවු කරන තාක් දුරකටය.

ප්‍රත්‍යාගණනිත වත්කමක සාධාරණ අගය එහි ඉදිරියට ගෙන යනු ලබන වටිනාකමෙහි විශාල වෙනසක් සිදුනොකරන බවට සහතික වනු පිණිස වත්කම් ආගණන කටයුතු ප්‍රමාණවත් කාලාන්තරයක් තුළ සිදු කෙරේ. ඉන්පසු උද්ගත වන පිරිවැයක් වේනම් එය අදාළ වත්කමෙහි ඉදිරියට ගෙනයන වටිනාකම තුළ අවස්ථාවෝචිත පරිදි අන්තර්ගත කෙරේ. එසේ නැතහොත් වෙනමම වත්කමක් ලෙස හඳුනා ගැනේ. මෙවැන්නක් සිදුවනුයේ අදාළ අයිතමය ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත ගලාඒම අනුමාන වන කල්හිත්, අදාළ පිරිවැය විශ්වාසදායක අයුරින් මැනිය හැකි කල්හිත් පමණි.

අලුත්වැඩියා හා නඩත්තු පිරිවැය ඒවා සිදුවන කාලපරිච්ඡේදය තුළ ආදායම් ප්‍රකාශයට අයගත කෙරේ. දේපළ, පිරියත හා උපකරණ වලට පහත සඳහන් දෑ අනෙකුත් කරුණු අතර ඇතුළත් වේ.

**(i) ගුවන්යානා භ්‍රමනමය අමතර කොටස්**

ස්පෘෂ්‍ය වත්කම් ලෙස සැලකෙන ගුවන්යානා භ්‍රමණමය අමතර කොටස් ප්‍රාරම්භක වශයෙන් ගත්මිල අනුව සටහන් කර එහි ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයුකාලය එල්ලේ ක්ෂය කරනු ලබයි. මෙම අයිතමය ගුවන්යානා ආශ්‍රිත උපකරණ යටතේ කාණ්ඩ ගත කර ඇත.

**(ii) කෙරෙමින් පවත්නා ප්‍රාග්ධන වැඩ**

කෙරෙමින් පවත්නා ප්‍රාග්ධන වැඩ ගත් මිළ අනුව සටහන් කෙරේ. ඒවා අත්කරගත් දිනයේ සිට වැඩ ස්ථාපන දිනය දක්වා දරන සියලු වියදම් ඊට ඇතුළත් වේ. වැඩ ස්ථාපනය කළ විට කෙරෙමින් පවත්නා වැඩ දේපළ, පිරියත හා උපකරණ යටතේ සුදුසු කාණ්ඩය වෙත මාරු කර එහි ඇස්තමේන්තු ගත ප්‍රයෝජ්‍ය ආයු කාලය එල්ලේ ක්ෂය කරනු ලැබේ.

**(ආ) ක්ෂයවීම**

සින්නක්කර ඉඩම් හැරුණු විට සියලුම දේපළ, පිරියත හා උපකරණ යනාදියෙහි පිරිවැය හෝ තක්සේරුව මත සරල මාර්ග ක්‍රමය යොදා ගනිමින් පහත දැක්වෙන ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයු කාල වකවානු පුරා දිවෙන පරිදි සමාන වාරික වලින් එකී ගණන් ප්‍රමාණ කපා හැරීමේ අටියෙන් ක්ෂයවීම් සඳහා වූ ප්‍රතිපාදන ආගණනය කරනු ලැබේ.

**ගුවන්යානා ආශ්‍රිත අමතර කොටස්:**

වසර 08 ක් හෝ කල්බදු කාල සීමාව යන කාල දෙකෙන් අඩු කාලය මුළුල්ලේ.

**පිරියත හා උපකරණ:**

උපකරණයේ වර්ග මත පදනම්ව වසර 1 -10 දක්වා කාල පරිච්ඡේද මුළුල්ලේ.

**ගොඩනැගිලි:**

උපරිම වශයෙන් වසර 20 කට යටත්ව අපේක්ෂිත ප්‍රයෝජ්‍ය ආයුකාලය මුළුල්ලේ.

අවශේෂ අගය, ප්‍රයෝජ්‍ය ආයුකාලය හා ක්ෂය කිරීමේ ක්‍රමය යන කරුණු එක් එක් රපෝර්තු දිනට

සමාලෝචනයට භාජනය කර සුදුසු අවස්ථාවලදී ප්‍රලෝකනාත්මකව ගලපනු ලැබේ.

ඉහත සඳහන් ක්ෂය අනු ප්‍රමාණ ඉදිරිපත් කෙරෙන සියලු කාලපරිච්ඡේදවලට අදාළ වේ.

### (ඇ) හඳුනා නොගැනීම

කිසියම් දේපළ, පිරියත හා උපකරණ අයිතමයක භාවිතයෙන් හෝ ව්‍යපහරණයෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අත් නොවන කල්හී එම අයිතමය එහි ව්‍යපහරණයෙන් පසුව හඳුනා ගනු නොලැබේ. යම් වත්කමක් එසේ හඳුනා ගනු නොලැබීමෙන් උද්ගත වන ලාභයක් හෝ අලාභයක් වෙතොත් එය (ව්‍යපහරණයෙන් ලත් ශුද්ධ මුදල සහ වත්කමේ ඉදිරියට ගෙනයන වටිනාකම අතර වෙනස ලෙස ආගණනය කරන ලද) අදාළ වත්කම හඳුනා නොගන්නා වර්ෂයට අයත් මූල්‍ය ප්‍රකාශයෙහි අන්තර්ගත කෙරේ.

## 2.4.4 අස්පෘෂ්‍ය වත්කම්

කිසියම් වත්කමක් නිසා උද්ගතවන අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලාඒම සහ එබඳු යම් වත්කම් වල පිරිවැය විශ්වාසදායක ලෙස ගණනය කළ හැකිවීම යන කරුණු අනුමාන වශයෙන් සලකනු ලබන්නේ නම් ඒවා අස්පෘෂ්‍ය වත්කම් ලෙස හඳුනා ගැනේ. ඒ අනුව මෙම වත්කම් මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි සඳහන් කෙරෙනුයේ සමුච්චිත හිලව්කිරීම් හා සමුච්චිත දුබලතා අලාභ වෙතොත් ඒවාද ඌණ වූ ගත් මිල මතය.

අදාළ දෘඩාංග අයිතමයකින් වෙන්කර ගත හැකි පරිගණක මෘදුකාංගයක් අත්කර ගැනීමේ හෝ වැඩිදියුණු කිරීමේ වියදම වෙන් වශයෙන් ප්‍රාග්ධනනය කරනු ලබන අතර එය සරල මාර්ග පදනම මත වසර 05 ක් නොඉක්මවන කාලයක් මුළුල්ලේ හිලව් කිරීමටද කටයුතු කෙරේ. හිලව් කිරීමේ කාල පරිච්ඡේදය හා හිලව් කිරීමේ ක්‍රමය එක් එක් රපෝර්තු දිනට සමාලෝචනයට භාජනය කෙරේ. මෙම වත්කමේ ඉදිරියට ගෙන යන අගය ආපසු අයකර ගත හැකි විය නොවන්නක් බව යම් අවස්ථාගත සිදුවීම් හා වෙනස්කම් අනුව පෙනී යන්නේ නම් එකී අගය වත්කම් දුබලතා එල්ලේ කලින් කල සමාලෝචනය කෙරේ.

## 2.4.5 ප්‍රධාන ගුවන්යානා එන්ජින් පිරිවැඩියා කිරීම

එක් කාල පරිච්ඡේදයකට වඩා ආර්ථික ප්‍රතිලාභ අනාගතයේදී සලසා දෙන ප්‍රධාන ගුවන්යානා එන්ජින් පිරිවැඩියා වියදම් හා ගුවන්යානා ගොඩබෑමේ උපකරණ වියදම් හා පූර්ව අරමුදල් හා වොරන්ට් බලපත්‍ර වලට අදාළ හිමිකම් රහිතව ප්‍රාග්ධනනය කර ඊළඟ ප්‍රධාන පිරිවැඩියාව තෙක් ඇස්තමේන්තු කළ පියාසර පැය ගණන්හි කාලය හා ඉතිරිව පවත්නා බදු කාල සීමාව යන දෙකෙන් අඩු කාලය මත හිලව් කරනු ලැබේ.

## 2.4.6 කල්බදුකර

### (අ) ක්‍රියාකාරි කල්බදුකර

කල්බදුකරයේ කාල සීමාව තුළ සන්තකභාවයට අයත් සියලු අවදානම් හා ප්‍රතිලාභ කල්බදුකරු විසින් සැලකිය යුතු යෝග්‍ය අයුරකින් රඳවා ගැනෙන බදුකර ක්‍රියාකාරී බදුකර ලෙස සැලකේ. වෙනත් ක්‍රමවත් පදනමක් පරිශීලක ප්‍රතිලාභයේ කාල රටාව සම්බන්ධයෙන් වැඩි නියෝජනයක් නොකරනන්නේ නම් මිස ක්‍රියාකාරී බදුකර ගෙවීම් හඳුනා ගැනෙනුයේ, ආදායම් ප්‍රකාශය තුළ කල්බදුකර කාල සීමාව මුළුල්ලේ පවතින මෙහෙයුම් වියදමක් ලෙස වූ සරල මාර්ග පදනමක් මතය.

ක්‍රියාකාරී බදුකර යටතේ වත්කම් ප්‍රතිවින්‍යාසගත කිරීමේ වියදම්, ප්‍රාග්ධනනය කරනු ලැබූ ප්‍රයෝජ්‍ය ආයුකාලය හා ඉතිරිව පවත්නා බදුකර කාලය යන දෙකෙන් අඩු කාල සීමාව එල්ලේ හිලව් කරනු ලැබේ.

**(ආ) මූල්‍ය බදුකර**

බදු දුන් අයිතමයේ සියලුම අවදානම් හා එහි සන්තකභාවයේ අනුෂංගික වූ දේපළෙහි සාධාරණ අගය හෝ ඊට වඩා අඩු අගයක් ගන්නේ නම්, අවම බදුකර ගෙවීම් වල වටිනාකම අනුව බදුකරයේ සමාරම්භක අවස්ථාවේදීම ප්‍රාග්ධනනය කෙරේ. බැරකම්හි ඉතිරිව පවත්නා ශේෂය මත සංගත පොලී අනුපාතයක් අත්කර ගැනීමට හැකිවන පරිදි කල්බදුකර ගෙවීම් මූල්‍ය ගාස්තු සහ බදුකර බැඳියාවේ අඩු කිරීමේ ප්‍රමාණය අතර විභාජනය කෙරේ.

ප්‍රාග්ධනිත බදු දුන් වත්කම්, දේපළ, පිරියත හා උපකරණ යනුවෙන් අනාවරණය කරන අතර, බදු දුන් විෂයාංග ක්ෂය කෙරේ. 2.4.3 දරන ගිණුම් ප්‍රතිපත්තිය බලන්න.

**(ඇ) විකිණීම හා ආපසු බදුදීම**

විකුණුම් හා ආපසු බදුදීම් සම්බන්ධ ගණුදෙනු නිසා ජනනය වන ක්‍රියාකාරී බදුකරයක් මත උද්ගත වන ලාභ, එකී විකුණුම් වලින් ලැබෙන මුදල් අදාළ වත්කම් වල සාධාරණ අගය නොඉක්මවන තාක් දුරට ආසන්න මට්ටමකින් ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගැනේ.

**(ඇ) විලම්බිත එන්ජින් උත්ශ්‍රේණිගත කිරීමේ පිරිවැය**

ක්‍රියාකාරී ගිවිසුම් වලට අදාළ ප්‍රතිලාභ කොන්දේසි වලට අනුකූල වූ විලම්බිත එන්ජින් වැඩිදියුණු කිරීමේ පිරිවැයෙහි ප්‍රවර්තන අගය ජංගම නොවන වත්කම් වල කොටසක් ලෙස ඇතුළත් කෙරෙන අතර, වත්කමෙහි ප්‍රයෝජ්‍ය ආයුකාලය හා ශ්‍රී.ලං.ගි.ප්‍ර. 37 අනුව ගණනය කළ හා මූල්‍ය තතත්වය පිළිබඳ ප්‍රකාශයෙහි වෙනත් විලම්බිත බැරකම් යටතේ කාණ්ඩගත කළ අනුරූපී බැරකම් සහිත වූ බදුකර කාලපරිච්ඡේදය යන දෙකින් අඩු කාල සීමාව එල්ලේ එකී අගය හිලවු කෙරේ.

## 2:4:7 ඉන්වෙන්ට්‍රි භාණ්ඩ

ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ගණනය කරනු ලබන්නේ යල්පිනූ හා මන්දගාමීව චලනය වන අයිතම වලට නිසි ප්‍රතිපාදන සැපයීමෙන් පසුව ගණනය වන පිරිවැය අගය හා ශුද්ධ උපලබ්ධි වටිනාකම යන දෙකෙන් අඩු අගය මතය. සියලුම ඉන්වෙන්ට්‍රි භාණ්ඩ බරතැබූ සාමාන්‍ය පිරිවැය පදනම මත ගණනය කෙරේ.

## 2.4.8 මූල්‍යමය නොවන වත්කම් දුබල වීම

කිසියම් වත්කමක් දුබලතාවයට පත්වූ බවට සඳහනක් ඇත්දැයි සමාගම එක් එක් රපෝර්තු දිනයේදී ඇගයුමක් කරයි. එබඳු යම් සඳහනක් වෙතොත් හෝ යම් වත්කමක් සඳහා වාර්ෂික දුබලතා පරීක්ෂණයක් අවශ්‍ය වන කල්හී හෝ වත්කමෙහි ආපසු අයකර ගතහැකි මුදල පිළිබඳව සමාගම ඇගයීමක් කරයි. වත්කමක ඉදිරියට ගෙන ගිය හැකි වටිනාකමේ ප්‍රමාණය එය ආපසු අයකර ගත හැකි ගණනෙහි ප්‍රමාණය ඉක්මවන්නේ නම් වත්කම දුබලත්වයට පත්ව ඇතැයි සලකනු ලබන අතර, එය ආපසු අයකර ගත හැකි වටිනාකම දක්වා කපා හැරේ.

## 2.4.9 මූල්‍ය සාධන පත්‍ර - මූලික හඳුනා ගැනීම හා පසු මානනය

### 2.4.9.1 මූල්‍ය වත්කම්

මූල්‍ය සාධන පත්‍රයෙහි ගිවිසුම්ගත ප්‍රතිපාදන කෙරෙහි ව්‍යාපාර සමූහය පාර්ශවකරුවකු වන විට පමණක් මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි මූල්‍ය වත්කම් හඳුනා ගැනේ . ලාභ හෝ අලාභ ඔස්සේ ගණනය වන සාධාරණ අගය ලෙසත්, ණය මුදල් හා ලැබීම් නියමිත ලෙසත්, පරිණත ආයෝජන ලෙස යොදවා ඇති මුදල් ලෙසත්, විකුණුම් සඳහා පවත්නා දේවල් ලෙසත් සුදුසු පරිදි මූල්‍ය වත්කම් වර්ගීකරණයට හසු කෙරේ. කළමනාකරණය ස්වකීය මූල්‍ය වත්කම්හි වර්ගීකරණය එහි ආරම්භක හඳුනා ගැනීමේදී නිශ්චය කරන අතර

එම වර්ගීකරණය රඳා පවතිනුයේ වත්කමෙහි ස්වභාවයත්, වත්කම් අත්කර ගනු ලැබූ අරමුණත් මතය.

සියලුම මූල්‍ය වත්කම් මූලික වශයෙන් හඳුනා ගැනෙනුයේ ඒවායේ සාධාරණ අගය අනුවය.

විකුණුම් සඳහා පවත්නා දැ ලෙස වර්ගීකරණය කරන ලද ණය හා ලැබීම් නියමිත වලින් සහ ආයෝජන වලින් සමාගමේ වත්කම් සංයුක්ත වේ. එබඳු අයිතම හඳුනා ගැනීම, මූලික හා පසු මානනය, දුබලතාව සහ හඳුනා නොගැනීම පිළිබඳ ව්‍යාපාර සමූහයේ ප්‍රතිපත්තිය පහත දැක්වේ;

### (අ) ණය සහ ලැබීම් නියමිත

ණය මුදල් හා ලැබීම් නියමිත යනු, සක්‍රීය වෙළඳපලක් තුළ ලැයිස්තු ගත නොකළ ස්ථිර හෝ නිශ්චය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවූ මූල්‍ය වත්කම්ය. එබඳු වත්කම් ආරම්භක මානනයෙන් පසු දුබලතා අගය ඌණ සඵල පොළී අනුපාතය යොදා ගනිමින් හිලව් කළ මිලට දෙවනුව මානනය කෙරේ. හිලවු කළ මිළ ආගණනය කරනු ලබන්නේ, අත්කර ගැනීම් මත ලැබූ වට්ටම් හෝ අධිමිල සහ සඵල පොළී අනුපාත ක්‍රමයේ අවශ්‍යම අංගයක් වන ගාස්තු හා පිරිවැය සැලකිල්ලට ගනිමිනි. ආදායම් ප්‍රකාශයේ මූල්‍ය අදායමට හිලව් කිරීම් ඇතුළත් කෙරේ.

### (ආ) විකුණුම් සඳහා පවත්නා මූල්‍ය වත්කම්

විකුණුම් සඳහා පවත්නා මූල්‍ය වත්කම්වලට කොටස් ආයෝජනය හා ණය සුරැකුම් පත් අන්තර්ගත වේ. විකුණුම් සඳහා පවතිය යනුවෙන් වර්ගීකරණය කර ඇති කොටස් ආයෝජන, අලෙවිය සඳහා තැබෙන්නාවූ යනුවෙන් වර්ගීකරණය නොකළ හෝ ලාභ හෝ අලාභ එල්ලේ සාධාරණ අගය මත පවතින්නාවූ යනුවෙන් නම් නොකළ ඒවාය. මෙම වර්ගීකරණයෙහිලා ණය සුරැකුම් පත් යනු, අනිශ්චිත කාල සීමාවක් සඳහා දරනු ලැබීමට අපේක්ෂිතව පවත්නාවූ හෝ ද්‍රවශීලතා අවශ්‍යතා මත හෝ වෙළඳපළ තත්වයන්ගේ වෙනස්කම් මත උද්ගත වන ප්‍රතිචාරය අනුව විකිණිය හැකි වන්නාවූ ඒවාය.

විකුණුම් සඳහා පවත්නා මූල්‍ය වත්කම්, ආයෝජනය හඳුනා නොගැනෙන තෙක් විකුණුම් සඳහා පැවති සංචිතවල වූ වෙනත් සර්වව්‍යාපී ආදායම් ලෙස හඳුනා ගැනෙන උපලබ්ධි නොවූ අලාභ හෝ ලාභ සමඟ සාධාරණ අගයක් මත, සමුච්චිත අලාභය, විකුණුම් සඳහා පවත්නා සංචිතයේ සිට මූල්‍ය පිරිවැයට ආදායම් ප්‍රකාශය තුළ ප්‍රතිවර්ගීකරණය කිරීමේදී, වෙනත් මෙහෙයුම් ආදායම්හි සමුච්චිත ලාභය හෝ අලාභය හඳුනා ගනු ලබන හෝ ආයෝජනය දුබලත්වයට පත්වන්නේ යයි නිගමනය කරනු ලබන අවස්ථාවේදී පසු මානනයට හසු කරනු ලබන්නේය. විකුණුම් සඳහා පවත්නා මූල්‍ය ආයෝජන දරමින් උපයා ගන්නා ලද ලාභය සඵල පොලී අනුපාතය යොදා ගනිමින් පොලී ආදායම ලෙස සටහන් කෙරේ.

### (ඇ) හඳුනා නොගැනීම

පහත දැක්වෙන් අවස්ථාවලදී මූල්‍ය වත්කම් හඳුනා ගනු නොලැබේ.

- වත්කම් වලින් මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ අයිතිවාසිකම් අවසන්වී ඇති විට.
- වත්කම් වලින් මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ ස්වකීය අයිතිවාසිකම් සමූහ ව්‍යාපාරය විසින් පවරා දෙනු ලැබ ඇති හෝ ලැබූ මුදල් ප්‍රවාහ යම් පැවරුම් වැඩ පිළිවෙළක් යටතේ සැලකිය යුතු ප්‍රමාදයකින් තොරව තෙවන පාර්ශවකට සම්පූර්ණයෙන් ගෙවීම සඳහා යම් බැඳියාවකින් බැඳෙනු ලැබ ඇති විට සහ (අ) වත්කම නිසා උද්ගත වන සියලු අවදානම් හා වාසි සමූහ ව්‍යාපාරය විසින් සැලකිය යුතු අයුරින් පවරා දෙනු ලැබ ඇති විට හෝ (ආ) වත්කමේ සියලු අවදානම් හා වාසි සමූහ ව්‍යාපාරය විසින් සැලකිය යුතු අයුරින් පවරා දෙනු ලැබ හෝ රඳවා ගනු ලැබ නොමැති මුත් අදාළ වත්කමේ පාලනය පවරා දෙනු ලැබ ඇති විට.
-

## (ඈ) මූල්‍ය වත්කම් දුබලත්වයට පත්වීම

යම් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් දුබලත්වයට පත්වන වාස්තවික සාක්ෂි කිසිවක් පවතීදැයි එක් එක් රපෝර්තු දිනයට ව්‍යාපාර සමූහය තක්සේරුවක් කරයි. වත්කමෙහි මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව හටගත් සිදුවීම් එකක් හෝ කිහිපයක් (දරන ලද පාඩු සිදුවීමක්) හේතුවෙන් හෝ එකී පාඩු සිදුවීම මගින් විශ්වාසදායක ලෙස ඇස්තමේන්තු කළ හැකි මූල්‍ය වත්කමේ හෝ මූල්‍ය වත්කම් සමූහයේ ඇස්තමේන්තු ගත අරමුදල් ගලනය කෙරෙහි බලපෑම් ඇති වීම හේතුවෙන් වත්කමක් දුබල වේයැයි යනුවෙන් වූ කිසියම් වාස්තවික සාක්ෂි පැවතියහොත් පමණක්, එම මූල්‍ය වත්කම හෝ මූල්‍ය වත්කම් සමූහය දුබලත්වයට පත්ව ඇතැයි සලකනු ලැබේ. සැලකිය යුතු මූල්‍ය අපහසුතා වලටත්, ගෙවීම් ප්‍රමාද කිරීම් වලටත්, බංකොලොත්භාවය හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධාන වෙත නැඹුරු වීමේ සම්භාවිතා වලටත් ණය ගැතියන් හා ණය ගැති පිරිස් මුහුණ දී ඇති බව හැඟවෙන ලක්ෂණ පහළවීම හා අනාගත ඇස්තමේන්තුගත මුදල් ගලනයන්හී සැලකිය යුතු අඩුවීමක් ඇති බවට දත්ත අනුසාරයෙන් නිරීක්ෂණය වීම යන කරුණු වත්කම් දුබලතාවයට ලක්වීමේ සාක්ෂි තුළ තිබෙන්නට පුළුවන.

### (i) හිලව් කරන ලද පිරිවැය එල්ලේ ගෙන ගිය මූල්‍ය වත්කම්

කිසියම් දුබලතා අලාභයක් සිදුව ඇති බවට වාස්තවික සාක්ෂි පවතී නම්, එම පාඩුවට අදාළ මුදල් වටිනාකම මානනය කරනු ලබන්නේ, වත්කමෙහි ඉදිරියට ගෙන යන මුදල හා අනාගත ඇස්තමේන්තුගත මුදල් ගලනයන්හී වත්මන් අගය අතර වෙනසය. අනාගත ඇස්තමේන්තුගත මුදල් ගලනයන්හී වත්මන් අගය මූල්‍ය වත්කමේ මුල් සඵල පොලී අනුපාතය එල්ලේ වට්ටම්ගත කෙරේ.

වත්කමෙහි ඉදිරියට ගෙන යන මුදල් වටිනාකම දීමනා ගිණුමක් යොදා ගැනීම මගින් අඩු කෙරේ. අලාභයේ මුදල් වටිනාකම ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගැනේ. පොලී ආදායම, අඩු කළ ඉදිරියට ගෙන යන මුදල මත නොකඩවා උපචිත වන අතර එය දුබලතා අලාභය මානනය කරනු සඳහා, වට්ටම් ගත කිරීමට යොදා ගනු ලැබූ පොලී අනුපාතය භාවිතා කරමින් උපචිත කරනු ලැබේ. පොලී ආදායම මූල්‍ය ආදායමෙහි කොටසක් ලෙස ආදායම් ප්‍රකාශයෙහි සටහන් කෙරේ.

පසුව එළඹෙන වර්ෂයකදී, දුබලතාව හඳුනා ගනු ලැබීමෙන් අනතුරුව හටගත් සිදුවීමක් හේතුවෙන් ඇස්තමේන්තු ගත අලාභයේ වටිනාකම වැඩි හෝ අඩු වේ නම්, දීමනා ගිණුම ගැළපීම මගින් කලින් හඳුනාගනු ලැබූ දුබලතා අලාභය වැඩි හෝ අඩු කිරීම සිදු කෙරේ. පසුව යම් කපා හැරීමක් මගින් ආපසු පියවා ගැනීම සිදු කළහොත්, එකී ආපසු පියවා ගැනීම ආදායම් ප්‍රකාශයෙහි මූල්‍ය පිරිවැයට බැර කෙරේ.

### (ii) විකුණුම් සඳහා පවතින මූල්‍ය වත්කම්

විකුණුම් සඳහා පවතින මූල්‍ය වත්කම් ආයෝජන, යම් ආයෝජනයක් හෝ ආයෝජන සමූහයක් දුබලතාවයට පත්වී ඇති බවට වාස්තවික සාක්ෂි කිසිවක් තිබේදැයි දැනගනු පිණිස රපෝර්තු දිනයට ව්‍යාපාර සමූහය විසින් තක්සේරු කරනු ලබයි.

කොටස් ආයෝජන විකුණුම් සඳහා පවතීයැයි වර්ගීකරණය කර තිබීම සම්බන්ධයෙන් වන විට, ආයෝජනයෙහි සාධාරණ අගයට අඩු එහි පිරිවැය තුළ විද්‍යාමාන වන සැලකිය යුතු හෝ කල්ගත වූ පහත වැටීම්, වාස්තවික සාක්ෂිවල අන්තර්ගත වනු ඇත. දුබලතාව සම්බන්ධයෙන් සාක්ෂි නිරූපණය වන අවස්ථාවකදී, කලින් ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගනු ලැබූ එකී ආයෝජනය ආශ්‍රිත දුබලතා අලාභ කිසිවක් වේ නම්, ඒවා අඩු කළ ආයෝජන අත්කර ගැනීමේ පිරිවැය හා ඒවායේ වර්තමාන සාධාරණ අගය අතර වෙනස ලෙස මානනය කළ සමුච්චිත අලාභය වෙනත් සර්වව්‍යාපී ආදායම් වෙතින් ඉවත් කර ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගැනේ. කොටස් ආයෝජන මත දුබලතා අලාභ ආදායම් ප්‍රකාශය හරහා ප්‍රතිවර්තනය නොකෙරේ. දුබලතාවයෙන් පසු ඒවායෙහි ඇතිවන සාධාරණ

අගය ආශ්‍රිත වැඩි වීම් වෙනත් සර්වව්‍යාපී ආදායම තුළ ඍජුව හඳුනා ගැනේ.

විකුණුම් සඳහා පවතීයැයි වර්ගීකරණය කර ඇති ණය සාධන පත්‍ර සම්බන්ධයෙන් වන විට, හිලව් කරන ලද පිරිවැය එල්ලේ මූල්‍ය වත්කම් ඉදිරියට ගෙන ගිය සමාන නිර්ණායක මතම පදනම්ව දුබලතා තක්සේරු කෙරේ. කෙසේ වුවද, දුබලතාව සඳහා සටහන් කරන ලද මුදලේ ප්‍රමාණය යනු, කලින් ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගනු ලැබූ එකී ආයෝජනය ආශ්‍රිත දුබලතා කිසිවක් වේ නම්, ඒවා අඩු කළ හිලවු කරන ලද පිරිවැය හා වත්මන් පිරිවැය අතර වෙනස ලෙස මානනය කරන ලද සමුච්චිත අලාභයයි.

## 2.4.9.2 මූල්‍ය බැරකම්

ශ්‍රී.ලං.ගි.ප්‍ර. 39 යටතේ වන විෂය පථය තුළ මූල්‍ය බැරකම් වර්ගීකරණය කෙරෙනුයේ ලාභය හෝ අලාභය හෝ ණය හෝ ණය ගැනුම් හරහාවූ සාධාරණ අගය එල්ලේ මූල්‍ය බැරකම් ලෙසය. ව්‍යාපාර සමූහය, ආරම්භක හඳුනා ගැනීමේ අවස්ථාවේදී ඒවායේ මූල්‍ය අගය පිළිබඳ වර්ගීකරණය නිගමනය කරයි.

සියලුම මූල්‍ය බැරකම් ආරම්භක අවස්ථාවේදී හඳුනා ගැනෙනුයේ සාධාරණ අගයට අනුව වන අතර ණය හා ණය ගැණුම් සම්බන්ධයෙන් වන විට, ඒවා හඳුනා ගැනෙනුයේ, ගණුදෙනුවල වියදම මත ඍජුවමය.

ව්‍යාපාර සමූහයේ මූල්‍ය බැරකම් වලට වෙළඳ හා වෙනත් ගෙවීම් නියමිත, බැංකු අයිරා, ණය හා ණය ගැණුම් සහ මූල්‍ය ඇපකර කොන්ත්‍රාත්තු යනාදිය ඇතුළත් වේ.

පහත විස්තර කර ඇති පරිදි මූල්‍ය බැරකම්වල පසු මානනය රඳා පවතිනුයේ ඒවායේ වර්ගීකරණය මතය;

### (අ) ණය හා ණය ගැනුම්

මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව පොලී දරන ණය හා ණය ගැනුම් පසු මානනයට ලක් කෙරෙනුයේ සඵල පොලී අනුපාත ක්‍රමය යොදා ගනිමින් හිලව් කරන ලද මිලටය. බැරකම් හඳුනා ගනු නොලබන අවස්ථාවේදී ආදායම් ප්‍රකාශය තුළ මෙන්ම සඵල පොලී අනුපාත ක්‍රියාවලිය ඔස්සේ ද ලාභ සහ අලාභ හඳුනා ගැනේ. අත්කර ගැනීම් මත වන්නාවූ යම් වට්ටමක් හෝ අධි මිලක් සහ සඵල පොලී අනුපාතයේ අවශ්‍යම අංගයක් වන ගාස්තු හා පිරිවැය සැලකිල්ලට ගනිමින් හිලව් කරන ලද පරිවැය ආගණනය කෙරේ. සඵල පොලී අනුපාත හිලවුකරණය ආදායම් ප්‍රකාශය තුළ මූල්‍ය පිරිවැයට ඇතුළත් කෙරේ.

### (ආ) හඳුනා නොගැනීම

යම් මූල්‍ය වත්කමක බැඳියාව නිදහස් කරනු හෝ අවලංගු කරනු හෝ අවසන් කරනු ලබන විට එහි බැරකම හඳුනා නොගැනේ.

දැනටමත් පවත්නා මූල්‍ය බැරකමක් වෙනුවට සැලකිය යුතු වෙනස්කම් සහිත කොන්දේසි මත එකම ණය දෙනුවා ගෙන්ම වන වෙනත් මූල්‍ය බැරකමක් ප්‍රතියෝජනය වේ නම් හෝ දැනටමත් පවත්නා බැරකමක කොන්දේසි සැලකිය යුතු ලෙස ප්‍රතිශෝධනය වේ නම්, එබඳු හුවමාරුවක් හෝ ප්‍රතිශෝධනය කිරීමක් මුල් බැරකම හඳුනා නොගැනීමක් ලෙසත්, නව බැරකමක් හඳුනා ගැනීමක් ලෙසත් සලකනු ලැබේ. අදාළ ඉදිරියට ගෙන යනු ලබන මුදල් ප්‍රමාණවල වෙනස අදායම් ප්‍රකාශයෙහි හඳුනා ගැනේ.

### (ඇ) මූල්‍ය සාධන පත්‍ර පාඩු පියවීම

මූල්‍ය වත්කම් හා බැරකම් සම්බන්ධ පාඩු හිලව් කරනු ලබන අතර හඳුනාගත් මුදල් ප්‍රමාණ හිලව් කිරීම සඳහා දැනට බලාත්මක කළ හැකි යම් නෛතික අයිතිවාසිකමක් හෝ ශුද්ධ පදනමක් මත බැරකම්

එකවර බේරුම් කිරීමට හෝ වත්කම් උපලබ්ධි කර බැරකම් පියවීමට යම් අභිප්‍රායක් තිබේ නම් පමණක් ශුද්ධ මුදල් ප්‍රමාණ, ආදායම් තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි වාර්තා කළ හැකිය.

**(ඇ) මූල්‍ය සාධන පත්‍රවල සාධාරණ අගය**

එක් එක් රපෝර්තු දිනට සක්‍රීය වෙළඳපළ තුළ අලෙවියට තැබෙන මූල්‍ය සාධන පත්‍රවල සාධාරණ අගය නිශ්චය කරනු ලබන්නේ, ගණු දෙනු වල වියදම් සඳහා කිසිදු අඩු කිරීමකින් තොරව ලැයිස්තුගත කළ වෙළඳපළ මිල ගණන් වලට හෝ ගණුදෙනු කරුවන්ගේ මිල ගණන් ඉදිරිපත් කිරීම්වලට (දිගු කාලීන තත්වයන් සඳහා ලංසු මිලත්, කෙටි කාලීන තත්වයන් සඳහා ඉල්ලුම් මිලත්ය.) සැඳහුම් දක්වමිනි.

සක්‍රීය වෙළඳළ තුළ අලෙවියට නොතැබෙන මූල්‍ය සාධන පත්‍ර සඳහා සාධාරණ අගය නිශ්චය කරනු ලබන්නේ ප්‍රශස්ත තක්සේරු ශිල්ප ක්‍රම උපයෝගී කර ගනිමිනි. එබඳු ශිල්ප ක්‍රමවලට පහත දැක්වෙන දෑ ඇතුළත් විය හැකිය.

මෑතකදී අතේ දුරින් සිදුවූ වෙළඳ පළ ගනුදෙනු යොදා ගැනීම.

- සැලකිය යුතු ලෙස සමාන කමක් දක්වන වෙනත් සාධන පත්‍රයක වත්මන් සාධාරණ අගයට සැඳහුම් දැක්වීම.
- වට්ටම් ගත මුදල් ප්‍රවාහ විශ්ලේෂණයක් හෝ වෙනත් තක්සේරු කිරීමේ ක්‍රම.

මූල්‍ය සාධන පත්‍රවල සාධාරණ අගයෙහි විශ්ලේෂණයක් හා ඒවා මානනය කරනුයේ කෙසේදැයි යනුවෙන්වූ වැඩි විස්තර 17 වන සටහනෙහි සපයා ඇත.

### 2.4.10 ගුවන්යානා නඩත්තු සංචිතය

ක්‍රියාත්මකව පවත්නා කල්බදු ගිවිසුම් අනුව ගුවන්යානා එන්ජින්, ගුවන්යානා සැකිලි සහ ගුවන්යානා අංගෝපාංග යනාදියෙහි පිරිවැඩියා සඳහා මාසික පදනමක් මත කල්බදු කරුවන් වෙත කරන ලද ගෙවීම් වලින් ගුවන්යානා නඩත්තු සංචිතය සමන්විත වේ. ගුවන්යානා එන්ජින්, ගුවන්යානා සැකිලි සහ ගුවන්යානා අංගෝපාංග පිරිවැඩියා සඳහා දරන ලද වියදම අදාළ නඩත්තු කටයුතු නිමවීමෙන් පසුව එකී සංචිත හරහා කල්බදු කරුවන් වෙතින් සමාගම ආපසු අයකර ගනී.

ගුවන්යානා නඩත්තු සංචිතය එහි අදාළ ස්වභාවය මත පදනම්ව ණය සහ ලැබීම් නියමිත යටතේ වර්ගීකරණය කර ඇති අතර, මෙම මූල්‍ය වත්කම් කාණ්ඩය සඳහා අදාළ වන්නාවූ ගිණුම් ප්‍රතිපත්තිය ඉහත 2.4.9.1(අ) වන සටහනෙහි සඳහන් කර ඇත.

### 2.4.11 වෙළඳ හා වෙනත් ලැබීම් නියමිත

අනුබද්ධ සමාගමට අයත් මුදල් ප්‍රමාණද ඇතුළත් වෙළඳ ණයගැතියන්, තැන්පතු සහ වෙනත් ණයගැතියන් (ගත් මිලට මානනය කරනු ලබන තැන්පතු හා වෙනත් ලැබීම් නියමිත යටතේ වර්ගීකරණය කරණ ලද මූල්‍ය නොවන වත්කම් හැර) වර්ගීකරණය කර ගිණුම් ගත කෙරෙනුයේ ණය සහ ලැබීම් නියමිත වශයෙනි. අදාළ ස්වභාවය මත පදනම්ව මෙම කාණ්ඩයට අයත් මූල්‍ය වත්කම් සඳහා අදාල වන ගිණුම් ප්‍රතිපත්තිය ඉහත 2.4.9.1 (ආ) වන සටහනෙහි සඳහන් කර ඇත.

### 2.4.12 ආයෝජන

**(i) භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජන**

භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජන වර්ගීකරණය කෙරෙනුයේ ''විකුණුම් සඳහා පවත්නා'' මූල්‍ය වත්කම් ලෙසය. මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව ආයෝජන මානනය කෙරෙනුයේ සාධාරණ අගය අනුවය.

මෙම කාණ්ඩයට අයත් මූල්‍ය වත්කම් සඳහා අදාළ වන ගිණුම් ප්‍රතිපත්තිය ඉහත 2.4.9.1(ආ) වන සටහනෙහි සඳහන් කර ඇත.

### (ii) අනුබද්ධ සමාගමේ ආයෝජනය

සමාගමේ මූල්‍ය ප්‍රකාශ තුළ, අනුබද්ධ සමාගම ආශ්‍රිතව සිදු කෙරුණු ආයෝජන ගත් මිලට ගිණුම් ගත කර ඇත. එය, තාවකාලික අගය හීනවීම් නොවන අගය හීනවීම් කිසිවක් සඳහා වූ යම් ප්‍රතිපාදන වලින් තොරය.

### (iii) වෙනත් දිගු කාලීන ආයෝජන

වෙනත් දිගු කාලීන ආයෝජනවලට කොටස් සුරැකුම් පත්හී ආයෝජන ඇතුළත්වේ. මෙම ආයෝජන අලෙවි කිරීම සඳහා සක්‍රිය වෙළඳපළක් නොමැති නිසාත්, විශ්වාසදායක ලෙස සාධාරණ අගය මානනය කළ නොහෙන නිසාත් මෙම ආයෝජන සඳහන් කරනුයේ ගත් මිල අනුවය.

## 2.4.13 මුදල් හා මුදල් සාම්‍යයන්

මුදල් හා මුදල් සාම්‍යයන් ගෙන හැර දක්වනුයේ බැංකුවේ ඇති මුදල්, අතැති මුදල් හා නිවේදිත තැන්පතු වශයෙනි. ඒවා, දන්නා මුදල් ප්‍රමාණවලට වහා පරිවර්තනය කළ හැකි හා වටිනාකම් වෙනස්කම් වලට නොවැදගත්, අවදානම් වලට යටත් කෙටි කාලීන අධි ද්‍රවශීල ආයෝජන වශයෙන්ද ගෙන හැර දැක්වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යයන් සඳහා මුදල් හා මුදල් සාම්‍යයනට බැංකුවේ හා අතැති මුදල්ද, හිඟහිට ඇති බැංකු අයිරා රහිත බැංකුවේ ඇති නිවේදිත තැන්පත්ද ඇතුළත් වේ. කෙටි කල් පිරීමේ කාලයක් සහිත ආයෝජන ද (එනම්, අත්කර ගැනීමේ දිනයේ සිට තෙමසක කාලයක් හෝ ඊට අඩු) මුදල් සාම්‍යයන් ලෙස සැලකේ. බැංකු අයිරා අනාවරණය කෙරෙනුයේ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය තුළ බැරකම් දරන පොලී යටතේය.

## 2.4.14 ප්‍රතිපාදන

### (i) සාමාන්‍ය

ප්‍රතිපාදන හඳුනා ගැනෙනුයේ සමාගම විසින් වගකිය යුතු කිසියම් ප්‍රවර්තන බැඳීමක් බේරුම් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ අන්තර්ගත යම් සම්පත් විගණනයක් අවශ්‍ය වෙතැයි හෝ එකී බැඳීමේ වටිනාකම අදාළ විශ්වාසදායක ඇස්තමේන්තුවක් සැදීමට ඇති වෙතැයි අනුමාන කරන කිසියම් අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස සමාගම සතුව එබඳු යම් ප්‍රවර්තන බැඳීමක් (නෛතික හෝ සම්ප්‍රයුක්ත) පවතින අවස්ථාවකදීය. ප්‍රතිපාදන සමහරක් හෝ සියල්ලම ප්‍රතිපූරණය කළ යුතු යැයි ව්‍යාපර සමූහය අපේක්ෂා කරන්නේ නම්, වෙනමම වත්කමක් ලෙස එකී ප්‍රතිපූරණය හඳුනා ගැනෙන මුත්, එය එසේ කෙරෙනුයේ අදාළ ප්‍රතිපූරණය සැබැවින්ම නිශ්චිත වූ විට පමණි. මොනයම් හෝ ප්‍රතිපාදනයකට අදාළ වියදම් ප්‍රතිපූර්ණ කිසිවකින් තොරව ආදායම් ප්‍රකාශය තුළ ගෙන හැර දැක්වේ.

### (ii) එන්ජින් උත්ශ්‍රේණිගත කිරීමේ විලම්බිත බැරකම්

ව්‍යාපාර සමූහය ගුවන්යානා එන්ජින් සමහරක් සඳහා එන්ජින් උත්ශ්‍රේණිගත කිරීමේ විලම්බිත බැරකම් වෙනුවෙන් ප්‍රතිපාදන සටහන් කරනුයේ ක්‍රියාත්මක බදුකර මතය. බැඳියා නිරාකරණය පිණිස ඇස්තමේන්තු ගත මුදල් ප්‍රවාහ යොදා ගනිමින් අපේක්ෂිත වියදම් හී ප්‍රවර්තන අගයට අනුව එන්ජින් උත්ශ්‍රේණිගත කිරීමේ විලම්බිත පිරිවැය සලසා දෙනු ලබන අතර එය වෙනමම වත්කකමක් ලෙස හඳුනා ගැනේ. (15 වන සටහන) එන්ජින් උත්ශ්‍රේණිගත කිරීමේ විලම්බිත පිරිවැය සම්බන්ධයෙන් නිශ්චිත වූ අවදානම් විද්‍යාමාන වන ප්‍රවර්තන බදු පූර්ව අනුපාත අනුව මුදල් ප්‍රවාහ වට්ටම් කෙරෙන අතර අදාළ

වට්ටම් නිදහස් කිරීම දරන ලද්දක් ලෙස වැයගත කෙරෙන අතර අදායම් ප්‍රකාශය තුළ මූල්‍ය පිරිවැයක් සේ හඳුනා ගැනේ. එන්ජින් උත්ශ්‍රේණිගත කිරීම්හී ඇස්තමේන්තුගත අනාගත වියදම් වාර්ෂිකව සමාලෝචනයට හසුකර සුදුසු පරිදි ගළපනු ලැබේ. ඇස්තමේන්තුගත අනාගත වියදම්හී යොදා ගැනෙන වට්ටම් අනුපාතවල වෙනස්කම් වත්කම් පිරිවැයට එකතු කරනු හෝ වත්කම් පිරිවැයෙන් අඩු කරනු හෝ ලැබේ.

## 2.4.15 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

### (අ) නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂිකය

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් වන ප්‍රතිඥාත පාරිතෝෂික විශ්‍රාම ප්‍රතිලාභ වල ප්‍රවර්තන අගය සෑම වසරකම ජීව ගණකඥ වරයෙකුගේ උපදෙස් සහිතව ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය යොදා ගනිමින් සමාගම විසින් ගණනය කරනු ලබයි.

සමාගම/ව්‍යාපාර සමූහය, සර්වව්‍යාපී අදායම් ප්‍රකාශයෙහි දැක්වෙන නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්වලට අදාළ වෙනත් සර්වව්‍යාපී ආදායම් හා වියදම් තුළ පවත්නා නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වලින් උද්ගත වන ජීවගණක ලාභ/අලාභ හඳුනා ගනියි.

ජීවගණකඥ වරයා විසින් යොදා ගනු ලබන ප්‍රධාන උපකල්පන වලට පහත සඳහන් දෑ ඇතුළත්ය.

| | සමාගම | | | අනුබද්ධ සමාගම | | |
|---|---|---|---|---|---|---|
| | 2013 | 2012 | 2011 | 2013 | 2012 | 2011 |
| i) පොලී අනුපාතිකය | 11% | 11% | 10% | 10% | 10% | 12% |
| ii) වැටුප් වර්ධක අගය | | | | | | |
| -ශ්‍රී ලං.රු. | 10% | 10% | 10% | | | |
| -ඇ.ඩො. | 2% | 2% | 2% | | | |
| -විධායක | | | | 10% | 10% | 10% |
| -විධායක නොවන | | | | 20% | 20% | 17% |
| iii) විශ්‍රාම වයස - අවුරුදු | 60 | 60 | 60 | 55 | 55 | 55 |
| iv) ආයතනය අඛණ්ඩව ක්‍රියාත්මක වන බව | | | | | | |

පාරිතෝෂිත බැරකම් බාහිර ලෙසින් අරමුදල් ලබා නොගනී. මෙම අයිතම මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි 'වෙනත් විලම්බිත බැරකම්' යටතේ කාණ්ඩගත කර ඇත. එතෙර ස්ථානගතව රැකියාවේ නිරත සේවක සේවිකාවන් ආවරණය වනුයේ ඔවුන් පදිංචි රටවලට අදාළ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම යටතේය.

### (ආ) නිශ්චිත දායකත්ව සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල

ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත සේවා නියුක්තිකයන් අදාළ අණපනත් හා රෙගුලාසි ප්‍රකාරව සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට සුදුසුකම් ලබා සිටී. සේවක දළ පාරිශ්‍රමික ප්‍රමාණයෙන් 15% ක් හා 3% ක ප්‍රමාණයක් පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට සමාගම විසින්ද, 12% ක් හා 3% ක් වූ ප්‍රමාණය අනුබද්ධ සමාගම විසින් ද දායක කරයි.

## 2.4.16 නිරන්තර පියාසර වැඩසටහන

"ෆ්ලයිස්මයිල්ස්" යනුවෙන් හඳුන්වනු ලබන නිරන්තර පියාසර වැඩසටහනක් සමාගම විසින් ක්‍රියාත්මක කරනු ලබන අතර, එමගින් වැඩසටහනේ සාමාජිකයන්ට සමුච්චිත සැතපුම් ප්‍රමාණය පදනම් කර ගනිමින් සංචාරක සම්මාන ප්‍රදාන පිරිනමයි. මෙම "ෆ්ලයිස්මයිල්ස්" වැඩසටහනේ ප්‍රතිලාභ වලට අදාළ මගී ආදායමෙන් කොටසක්, ඒවා උපයෝජනයට ගනු ලබන තෙක් එම ප්‍රතිලාභ අපේක්ෂිත උපයෝජනය මත පදනම්ව ඇස්තමේන්තු කර විලම්බනය කර තැබේ. මේවා විලම්බිත ආදායම් යටතේ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි අන්තර්ගත කෙරේ.

## 2.4.17 ආදායම් හඳුනා ගැනීම

ව්‍යාපාර සමූහය වෙත ආර්ථික ප්‍රතිලාභ ගලා එන්නේ දැයි අවිනිශ්චිත වන්නාවූ හා ආදායම විශ්වාසදායක ලෙස මානනය කළ හැකි වන්නාවූ දුරකට, අදාළ ගෙවීම් සිදු කරනුයේ කෙදිනකද යන්න නොසලකා, ආදායම හඳුනා ගැනේ. ලද හෝ ලැබිය යුතු ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගය අනුව ආදායම මානනය කෙරේ. අන්තර් සමාගම් ගණුදෙනු සමාගම සඳහාවූ ආදායමෙන් බැහැර වේ.

### (අ) ගුවන් සමාගමේ ආදායම

ප්‍රධාන වශයෙන් ආදායම ජනනය කර ගැනෙනුයේ මගී ප්‍රවාහනය, ගුවන් බඩු හා තැපැල් ප්‍රවාහනය, ගුවන් තොටුපළ පර්යන්ත සේවා සැපයීම, ඉංජිනේරු සේවා සැපයීම හා ආශ්‍රිත සේවා යනාදිය මගිනි.

(i) ගුවන් මගී ගුවන් බඩු විකුණුම් හඳුනා ගැනෙනුයේ අදාළ ප්‍රවාහනය සපයන අවස්ථාවලදී උද්ගතවන මෙහෙයුම් ආදායම් වශයෙනි.

(ii) භාවිතයට නොගත් ගුවන් ප්‍රවේශ පත්‍ර හා ගුවන් මාර්ග බිල්පත් වල අගය ප්‍රවාහන පූර්ව විකුණුම් ලෙස ජංගම බැරකම්හි ඇතුළත් කෙරේ. අභාවිත හා ගුවන් මාර්ග බිල්පත් වල අගය හඳුනා ගැනෙනුයේ එක් වසරකට පසුව භාවිතයට නොගෙන පවතින්නේ නම්, ආදායම වශයෙනි.

(iii) තෘතීය පාර්ශව නඩත්තු සේවා සැපයීමෙන් අත්වන ආදායම හඳුනා ගැනෙනුයේ එකී කටයුතු නිමවීමෙන් අනතුරුවය.

(iv) ගුවන් ගමන් මෙහෙයුම් සේවා සැපයීමෙන් අත්වන ආදායම හඳුනා ගැනෙනුයේ අදාළ සේවා ඉටු කිරීමෙන් පසුවය.

### (ආ) ගුවන් සමාගමේ ආහාරපාන සේවා වලින් ආදායම

**භාණ්ඩ විකිණීම**

සන්තකභාවයට අදාළ සැලකිය යුතු අවදානම් හා ලැබීම් දීමනා ගැනුම්කරු වෙත පවරනු ලැබ ඇති විට ආදායම හඳුනා ගැනේ. අගය එකතු කළ විකුණුම් බදු ආදායමට අන්තර්ගත නොවන අතර, ආදායම නිශ්චය කරනුයේ වෙළඳ වට්ටම් අඩු කිරීමෙන් පසුවය. ප්‍රතිෂ්ඨා මුදල්, අදාළ වියදම් හෝ සිදුවිය හැකි භාණ්ඩ හැරවුම් ආපසු අයකර ගැනීම සම්බන්ධයෙන් හා භාණ්ඩ පිළිබඳ අඛණ්ඩ කළමනාකරණය සම්බන්ධයෙන් සැලකිය යුතු අවිනිශ්චිතතා වේනම් ආදායම් කිසිවක් හඳුනා නොගැනේ.

**(ඇ) ලාභාංශ ආදායම**

කොටස් හිමියන් අදාළ ගෙවීම් ලැබීමට ඇති ඔවුන්ගේ අයිතිය තහවුරු කරනු ලැබූ විට ලාභාංශ ආදායම ගිණුම්ගත කෙරේ.

**(ඈ) කුලී ආදායම**

කුලී ආදායම හඳුනා ගැනෙනුයේ උපචිත පදනමක් මතය.

**(ඉ) පොලී ආදායම**

හිලව් කරන ලද පිරිවැය අනුව මානනය කළ සියලුම සාධන පත්‍ර සඳහාත්, විකුණුම පිණිස පවත්නාවූ යනුවෙන් වර්ගීකරණය කර ඇති පොලී දරන මූල්‍ය වත්කම් සඳහාත් පොලී ආදායම හෝ වියදම සටහන් කරනුයේ සඵල පොලී අනුපාතය යොදා ගනිමිනි. එකී අනුපාතය, අදාළ මූල්‍ය වත්කමේ හෝ බැරකමේ ඉදිරියට ගෙන යන ශුද්ධ මුදල් ප්‍රමාණයට, මූල්‍ය සාධන පත්‍රයේ අපේක්ෂිත ආයු කාලය හෝ ඊට අඩු කාලයක් ඔස්සේ ලැබෙන අදාළ ඇස්තමේන්තුගත අනාගත මුදල් ගෙවීම් හෝ ලැබීම් සුදුසු පරිදි නිසි ලෙසම වට්ටම්ගත කෙරෙන්නක් වේ.

**(ඊ) වෙනත් ආදායම්**

වෙනත් ආදායම් හඳුනා ගැනෙනුයේ උපචිත පදනම මතය.

## 2.14.18 වියදම් හඳුනා ගැනීම

නිශ්චිත ආදායම් අයිතම වල දරන ලද පිරිවැය හා ඉපයුම් අතර පවත්නා ඍජු සබඳතාවක පදනම මත පිහිටා ආදායම් ප්‍රකාශය තුළ වියදම් හඳුනා ගැනේ. කාර්යක්ෂම තත්වයන් යටතේ ව්‍යාපාරය පවත්වාගෙන යාම සහ දේපළ, පිරියත හා උපකරණ නඩත්තු කිරීම යන කාර්යයන්හි ලා දරන ලද සියලු වියදම් ආදායම් ප්‍රකාශයට අයගත කෙරේ. ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා, "වියදම්හි ක්‍රියාකාරිත්වය" නැමැති ක්‍රමය අනුගමනය කර ඇත. එසේ එම ක්‍රමය අනුගමනය කර ඇත්තේ, සමාගමේ හා සමූහයේ කාර්ය සාධනය පිළිබඳව මූලාංශ එමගින් සාධාරණ අයුරින් ගෙනහැර දැක්වෙතැයි යන පදනම මතය.

## 2.4.19 ණය ගැනුම් පිරිවැය

ණය ගැනුම් පිරිවැය හඳුනා ගැනෙනුයේ, කිසියම් වත්කමක් අත්කර ගැනීමක්, ඉදිකිරීමක් හෝ නිපදවීමක් එහි අපේක්ෂිත භාවිතය හා විකිණීම පිණිස සූදානම් කෙරෙන සැලකිය යුතු කාල සීමාවක් දක්වා එලෙස යම් වත්කමක් අත්කර ගැනීමට, ඉදිකිරීමට හෝ නිපදවීමට ඍජුවම අදාළ වන පරිදි එකී ණය ගැනුම් පිරිවැය උද්ගතවන තාක් වූ දුර හැරුණු විට ඒවා එලෙස දරනු ලබන කාල සීමාව දක්වා වූ දුරකට ගැනෙන වියදමක් වශයෙන් වන අතර එය එකී වත්කමෙහි කොටසක් ලෙස ප්‍රාග්ධනනය කරනු ලැබේ.

## 2.4.20 ඛණ්ඩමය වාර්තාකරණය

ඛණ්ඩයක් යනු ව්‍යාපාර සමූහය සම්බන්ධයෙන් හඳුනාගනු ලැබිය හැකි එක්තරා අංශයකි. අනෙකුත් අංශ වලට වඩා වෙනස් ස්වරූපයක් ගත් අවදානම් හා ලැබුම් දීමනා වලට යටත් විශේෂිත ආර්ථික පරිසරයක් තුළ සේවා සැපයීමේ කාර්යන්හි ලා එම අංශය නිරත වේ.

සමාගමේ අවදානම් හා ලාභ අත්කර ගැනීමේ අනුපාතය කෙරෙහි සමාගම විවිධ රටවල් තුළ ස්වකීය ක්‍රියාකාරකම් ඉටු කරන්නේය යන සාධකය ප්‍රබල ලෙස බලපෑම් ඇති කරන්නක් හෙයින් එකී මෙහෙයුම් කටයුතු වල භූගෝලීය පැතිරයාම මත පදනම්ව අදාළ මූලික ඛණ්ඩ නිශ්චය කරනු ලැබේ. විකුණුම් උත්පාදනය මගින් සලසා ගැනෙන පිරිවැටුමෙහි විශ්ලේෂණය ලබා ගැනෙනුයේ විකුණුම සිදු කළ කලාපය වෙත ආදායම වෙන් කිරීම මගිනි. කිසියම් විශේෂ ඛණ්ඩයකට යටත් කොට ඍජුවම හඳුනා ගත නොහැකි වියදම් වෙන්කර දක්වමින් හෙළිදරව් කිරීමක් සිදු නොවේ.

භූගෝලීය ඛණ්ඩ වෙත වත්කම් හා අදාළ බැරකම් වෙන්කර දීම යෝග්‍ය පදනමක් මත නොපවතී යයි කළමනාකරණය හඟියි. ඒ අනුව ඛණ්ඩමය වත්කම්,ඛණ්ඩමය බැරකම් සහ ගෝලීය ඛණ්ඩ ආශ්‍රිත තොරතුරු යනාදිය සම්බන්ධයෙන් හෙළිදරව් නොකෙරේ. ව්‍යාපාරික ඛණ්ඩය අනුව ද්විතීයික වාර්තාකරණය පදනම් වනුයේ සමූහය විසින් සලසනු ලබන සේවාවන්හි ස්වභාවය මතය. සමූහය ප්‍රධාන ව්‍යාපාර ඛණ්ඩද්වයක නිරතව සිටියි. එනම්, ගුවන් ප්‍රවාහන කටයුතු වල සහ සිය අනුබද්ධ සමාගම ඔස්සේ ගුවන්යානාස්ථ ආහාරපාන සේවා සැපයීමේ කටයුතු වල නියැලීමයි.

## 2.5 නිකුත් කළ මුත් මේ දක්වා ක්‍රියාත්මක නොවන ගිණුම්කරණ ප්‍රමිත

නිකුත් කර ඇති නමුත් මෙම මූල්‍ය ප්‍රකාශ නිකුත් කරනු ලැබූ දිනය දක්වා ක්‍රියාත්මකව නොමැති ගිණුම්කරණ ප්‍රමිති පහත දක්වා ඇත. මෙම ප්‍රමිති බලාත්මකවූ විට ව්‍යාපාර සමූහය විසින් ඒවා අනුගමනය කරනු ඇත.

සවිස්තරාත්මක සමාලෝචනයක් අපේක්ෂිත හෙයින් මෙම ප්‍රමිතිවල මූල්‍ය බලපෑම යුක්තයුක්ත ලෙස තක්සේරු කළ නොහේ.

(i) ශ්‍රී ලං.මු.රෙ.ප්‍ර.9 - මූල්‍ය සාධන පත්‍ර: වර්ගීකරණය සහ මානනය
නිකුත් කර ඇති පරිදි ශ්‍රීලං.මු.රෙ.ප්‍ර.9 මගින් නිරූපණය වනුයේ ශ්‍රීලං.ගි.ප්‍ර. 39 වෙනුවට එය යොදා ගැනීමේ මුල් අදියරේ කටයුතු වන අතර එය මූල්‍ය වත්කම් හා බැරකම් වර්ගීකරණයට හා මානනයට අදාළ වේ.

(ii) ශ්‍රී ලං.මු.රෙ.ප්‍ර.13 - සාධාරණ අගය මානනය
ශ්‍රී ලංකා මූල්‍ය රෙගුලාසි ප්‍රමිති යටතේ සාධාරණ අගය සඳහා වූ සියලු මානනය කිරීම් සම්බන්ධයෙන් ශ්‍රී ලං.මු.රෙ.ප්‍ර.13 මගින් ඒකීය මූලාශ්‍ර මග පෙන්වීමක් ස්ථාපනය කරයි.

ශ්‍රී ලං.මු.රෙ.ප්‍ර.9 සහ ශ්‍රී ලං.මු.රෙ.ප්‍ර.13 පිළිවෙළින් 2015.01.01 හා 2014.01.01 දිනට හෝ එදිනට පසුව ආරම්භ වන මූල්‍ය කාල පරිච්ඡේද සඳහා බල පැවැත්වෙනු ඇත.

ඉහත කරුණුවලට අමතර වශයෙන්, පහත දැක්වෙන ගිණුම්කරණ ප්‍රමිති ද නිකුත් කරනු ලැබ ඇති අතර 2014.01.01 දින සිට ඒවා ක්‍රියාත්මක වේ.

ශ්‍රී ලං.මු.රෙ.ප්‍ර. 10 - ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ
ශ්‍රී ලං.මු.රෙ.ප්‍ර. 11 - බද්ධ වැඩ පිළිවෙළ
ශ්‍රී ලං.මු.රෙ.ප්‍ර. 12 - වෙනත් ව්‍යාපාරවල සබඳතා හෙළිදරව් කිරීම

**2.6 ශ්‍රීලං.මු.රෙ. ප්‍රමිති ප්‍රථම වරට අනුගමනය කිරීම**

**2011.04.01 දිනට (ශ්‍රීලං.මු.රෙ. වලට සංක්‍රමණය වන දිනය) මූල්‍ය තත්වය සැසඳීම**

| | සටහන | සමූහය ශ්‍රීලං.ගි.ප්‍ර. 2011.4.1 රු.මි. | ප්‍රතිමානනය රු.මි. | සමූහය ශ්‍රීලං.මු.රෙ. 2011.4.1 රු.මි. | සමාගම ශ්‍රීලං.ගි.ප්‍ර. 2011.4.1 රු.මි. | ප්‍රතිමානනය රු.මි. | සමාගම ශ්‍රීලං.මු.රෙ. 2011.4.1 රු.මි. |
|---|---|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | | | |
| දේපළ,පිරියත හා උපකරණ | | | | | | | |
| | | 4,647.69 | - | 4,647.69 | 2,558.82 | - | 2,558.82 |
| ගුවන්යානා එන්ජින් වල ප්‍රධාන පිරිවැඩියා හා උත්ශ්‍රේණි | | 6,080.36 | - | 6,080.36 | 6,080.36 | - | 6,080.36 |
| ගුවන්යානා නඩත්තු සංචිතය | අ | 8,849.84 | (86.26) | 8,763.58 | 8,849.84 | (86.26) | 8,763.58 |
| ගුවන්යානා හා අමතර එන්ජින් තැන්පතු | අ | 2,156.38 | (43.35) | 2,113.03 | 2,156.38 | (43.35) | 2,113.03 |
| අස්පෘෂ්‍ය වත්කම් | | 111.69 | - | 111.69 | 110.07 | - | 110.07 |
| ආයෝජන | අ | 65.36 | (64.96) | 0.40 | 107.40 | (64.96) | 42.44 |
| **ජංගම වත්කම්** | | | | | | | |
| ඉන්වෙන්ට්‍රි භාණ්ඩ | | 21,911.32 | (194.57) | 21,716.75 | 19,862.87 | (194.57) | 19,668.30 |
| වෙළඳ හා වෙනත් ලැබීම් නියමිත | අ | 10,553.71 | 227.35 | 10,781.06 | 10,055.27 | 227.72 | 10,282.99 |
| ගුවන්යානා නඩත්තු සංචිතය | | 2,506.16 | - | 2,506.16 | 2,506.16 | - | 2,506.16 |
| මුදල් හා බැංකු ශේෂය | | 1,757.24 | - | 1,757.24 | 1,455.17 | - | 1,455.17 |
| | | 19,307.30 | 227.35 | 19,534.65 | 18,276.59 | 227.72 | 18,504.31 |
| **මුළු වත්කම්** | | 41,218.62 | 32.78 | 41,251.40 | 38,139.46 | 33.15 | 38,172.61 |
| **කොටස් ආයෝජන බැරකම්** | | | | | | | |
| **ප්‍රාග්ධනය හා සංචිත** | | | | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | | 5,146.35 | - | 5,146.35 | 5,146.35 | - | 5,146.35 |
| **එකතුව** | **64,837.94** | **64,837.94** | **48,835.00** | **48,835.00** |
| **මූල්‍ය බැරකම්** | | | | |
| පොලී දරන ණය හා ණය ගැනුම් | 44,159.72 | 44,159.72 | 12,954.32 | 12,954.32 |
| වෙළඳ හා වෙනත් ගෙවීම් නියමිත | 30,571.85 | 30,571.85 | 31,747.80 | 31,747.80 |
| **එකතුව** | **74,731.57** | **74,731.57** | **44,702.12** | **44,702.12** |
| **සමාගම** | | | | |
| **මූල්‍ය වත්කම්** | | | | |
| වෙළඳ හා වෙනත් ලැබීම් නියමිත | 11,920.57 | 11,920.57 | 11,321.44 | 11,321.44 |
| ගුවන්යානා නඩත්තු සංචිතය | 19,901.93 | 19,901.93 | 17,817.62 | 17,817.62 |
| අමතර ගුවන්යානා එන්ජින් තැන්පතු | 3,128.35 | 3,128.35 | 3,056.59 | 3,056.59 |
| ආයෝජන | 25,597.78 | 25,597.78 | 13,369.81 | 13,369.81 |
| මුදල් හා බැංකු ශේෂය | 3,640.56 | 3,640.56 | 1,733.32 | 1,733.32 |
| **එකතුව** | **64,189.19** | **64,189.19** | **47,298.78** | **47,298.78** |
| **මූල්‍ය බැරකම්** | | | | |
| පොලී දරන ණය හා ණය ගැනුම් | 45,210.09 | 45,210.09 | 14,012.55 | 14,012.55 |
| වෙළඳ හා වෙනත් ගෙවීම් නියමිත | 32,454.60 | 32,454.60 | 34,103.51 | 34,103.51 |
| **එකතුව** | **77,664.69** | **77,664.69** | **48,116.06** | **48,116.06** |

මූල්‍ය සාධන පත්‍රවලට සමූහයේ/සමාගමේ වෙළඳ හා වෙනත් ලැබීම් නියමිත, ගුවන්යානා නඩත්තු සංචිතය, අමතර ගුවන්යානා එන්ජින් තැන්පතු, භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජන, මුදල් හා මුදල් සාම්‍යයන්, පොලී දරන ණය හා ගැනුම් සහ වෙළඳ හා වෙනත් ගෙවීම් නියමිත ඇතුළත් වේ.

බලාත් හෝ අවසායිත විකුණුමක හැරුණු විට, ප්‍රවර්තන ගණුදෙනුවක් තුළ මනාප පාර්ශව අතර හුවමාරු කර ගත හැකි පාදක මුදල් ප්‍රමාණවල අගය මත මෙම සාධන පත්‍රවල සාධාරණ අගය නිශ්චය කෙරේ.

**සාධාරණ අගය ඇස්තමේන්තු කිරීම සඳහා, පහත දැක්වෙන විධික්‍රම හා උපකල්පන යොදා ගැණුනි.**

පාදක මුදල් ප්‍රමාණවල කෙටි කාලීන කල් පිරීම් විශාල වශයෙන් කරණකොටගෙන මුදල් හා වෙනත් ගෙවීම් නියමිත, ඒවායේ ධාරණ වටිනාකම සන්නිකර්ෂණය කරයි.

දිගු කාලීන විචල්‍ය අනුපාත ණය ගැනුම්, වෙළඳපළ පාදක වූ පොලී අනුපාත විශාල වශයෙන් කරණකොටගෙන ඒවායේ ධාරණ වටිනාකම සන්නිකර්ෂණය කරයි.

රජයේ භාණ්ඩාගාර බැඳුම්කරවල සාධාරණ අගය, රජෝර්තු දිනයට වෙළඳපළෙහි පවත්නා නිරීක්ෂණය කළ හැකි දත්ත මත පදනම් වේ. එහෙයින්, සමූහයේ/සමාගමේ මූල්‍ය සාධන පත්‍රවල ධාරණ වටිනාකම්, ඒවායේ සාධාරණ අගයන් හා යුක්තයුක්ත ලෙස සන්නිකර්ෂණය වන්නේය.

**සාධාරණ අගයේ ධුරාවලිය**

මාර්තු මස 31 වන දිනට, සමූහය/සමාගම පහත දැක්වෙන මූල්‍ය සාධන පත්‍ර, මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි සාධාරණ අගය මත දැරිය. තක්සේරුකරණ ශිල්ප ක්‍රම මගින් මූල්‍ය සාධන පත්‍රවල සාධාරණ අගය නිශ්චය කර අනාවරණය කිරීම සඳහා පහත දැක්වෙන ධුරාවලිය සමූහය/සමාගම භාවිතා කරයි.

| | සමූහය/සමාගම | |
|---|---|---|
| | **මට්ටම 2** | **මට්ටම 2** |
| | **2013** | **2012** |
| | **රු.මි.** | **රු.මි.** |
| **සාධාරණ අගය අනුව මානනය කළ මූල්‍ය වත්කම්** | | |
| විකුණුම් සඳහා පවත්නා ආයෝජන | 25,597.78 | 13,369.81 |
| - භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජන | | |

## 18. ආදායම හා ඛණ්ඩමය තොරතුරු

### 18.1 ආදායම

| | සමූහය 2013 | සමූහය 2012 | සමාගම 2013 | සමාගම 2012 |
|---|---|---|---|---|
| | 2013 රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. |
| කාල නිශ්චිත සේවා - මගීන් | 98,581.74 | 74,730.65 | 98,581.74 | 74,730.65 |
| - ගුවන් බඩු | 12,887.18 | 10,819.03 | 12,895.61 | 10,828.42 |
| - අතිරේක ගමන් බඩු | 509.02 | 407.85 | 509.02 | 407.85 |
| - තැපැල | 141.97 | 102.96 | 141.97 | 102.96 |
| | 112,119.91 | 86,060.49 | 112,128.34 | 86,069.88 |
| ගුවන් පර්යන්ත හා අනෙකුත් සේවා | 6,544.50 | 5,842.85 | 6,564.08 | 5,860.88 |
| තීරු බදු රහිත | 521.45 | 721.11 | 521.45 | 721.11 |
| කාල අනිශ්චිත සේවා | 357.03 | 216.06 | 357.03 | 216.06 |
| ගුවන්යානාස්ථ ආහාරපාන සැපයුම් | 1,864.77 | 1,798.09 | - | - |
| එකතුව | **121,407.66** | **94,638.60** | **119,570.90** | **92,867.93** |

### 18.2 ඛණ්ඩමය තොරතුරු - සමූහය

**(අ) භූගෝලීය ඛණ්ඩය අනුව මූලික වාර්තා කරණය - විකුණුම් ප්‍රභවය අනුව ආදායම**

| ආදායම | ආසියාව | යුරෝපය සහ අප්‍රිකාව | මැද පෙරදිග | උතුරු හා දකුණු ඇමරිකාව | නිරිත දිග ශාන්තිකරය | එකතුව 2013 |
|---|---|---|---|---|---|---|
| | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. |
| කාල නිශ්චිත සේවා - මගීන් | 57,782.10 | 19,124.45 | 18,266.95 | 2,816.63 | 591.61 | 98,581.74 |
| - ගුවන් බඩු | 10,287.51 | 1,882.40 | 608.16 | 46.06 | 63.05 | 12,887.18 |
| -අතිරේක ගමන් බඩු | 233.57 | 36.30 | 235.56 | 2.58 | 1.01 | 509.02 |
| - තැපැල | 91.36 | 48.96 | 0.08 | 0.03 | 1.54 | 141.97 |
| | 68,394.55 | 21,092.11 | 19,110.75 | 2,865.30 | 657.21 | 112,119.91 |
| ගුවන් පර්යන්ත හා අනෙකුත් සේවා | 6,544.50 | - | - | - | - | 6,544.50 |
| තීරු බදු රහිත | 342.63 | 61.63 | 117.19 | - | - | 521.45 |
| කාල අනිශ්චිත සේවා | 357.03 | - | - | - | - | 357.03 |
| ගුවන්යානාස්ථ ආහාරපාන සැපයුම් | 1,864.77 | - | - | - | - | 1,864.77 |
| **ඛණ්ඩමය ආදායම** | **77,503.48** | **21,153.74** | **19,227.94** | **2,865.30** | **657.21** | **121,407.66** |

| ආදායම | ආසියාව | යුරෝපය සහ අප්‍රිකාව | මැද පෙරදිග | උතුරු හා දකුණු ඇමරිකාව | නිරිත දිග ශාන්තිකරය | එකතුව 2012 |
|---|---|---|---|---|---|---|
| | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. |
| කාල නිශ්චිත සේවා - මගීන් | 41,339.08 | 18,560.65 | 11,893.60 | 2,209.62 | 727.70 | 74,730.65 |
| - ගුවන් බඩු | 8,575.97 | 1,460.55 | 726.87 | 38.94 | 16.70 | 10,819.03 |
| -අතිරේක ගමන් බඩු | 177.22 | 25.41 | 202.55 | 2.34 | 0.33 | 407.85 |
| - තැපැල | 77.59 | 25.28 | 0.07 | 0.02 | - | 102.96 |
| | 50,169.86 | 20,071.89 | 12,823.09 | 2,250.92 | 744.73 | 86,060.49 |
| ගුවන් පර්යන්ත හා අනෙකුත් සේවා | 5,842.85 | - | - | - | - | 5,842.85 |
| තීරු බදු රහිත | 453.23 | 115.74 | 152.14 | - | - | 721.11 |
| කාල අනිශ්චිත සේවා | 216.06 | - | - | - | - | 216.06 |
| ගුවන්යානාස්ථ ආහාරපාන සැපයුම් | 1,798.09 | - | - | - | - | 1,798.09 |
| **ඛණ්ඩමය ආදායම** | **58,480.09** | **20,187.63** | **12,975.23** | **2,250.92** | **744.73** | **94,638.60** |

**(ආ) ව්‍යාපාර ඛණ්ඩ අනුව ද්විතීයික වාර්තාකරණය**

| ආදායම | ගුවන් සමාගම | ව්‍යාපාර ඛණ්ඩය<br>ගුවන්යානාස්ථ ආහාරපාන සැපයුම් | සමූහය | ගුවන් සමාගම | ව්‍යාපාර ඛණ්ඩය<br>ගුවන්යානාස්ථ ආහාරපාන සැපයුම් | සමූහය |
|---|---|---|---|---|---|---|
| | **2013**<br>**රු.මි.** | **2013**<br>**රු.මි.** | **2013**<br>**රු.මි.** | **2012**<br>**රු.මි.** | **2012**<br>**රු.මි.** | **2012**<br>**රු.මි.** |
| බාහිර සේවා දායකයින්ට විකුණුම් | | | | | | |
| අන්තර් ඛණ්ඩමය විකුණුම් | 28.01 | 3,028.18 | - | 27.42 | 2,366.00 | - |
| **මුළු ආදායම** | **119,570.90** | ***4,892.95*** | **-** | **92,867.93** | **4,164.09** | **-** |
| **ප්‍රතිඵල** | | | | | | |
| බදු පසු ලාභය/(අලාභය) | (21,749.75) | 1,415.62 | (22,518.78) | (19,778.03) | 2,506.72 | (17,208.38) |
| **අනෙකුත් ඛණ්ඩමය තොරතුරු** | | | | | | |
| වත්කම් | 89,447.13 | 6,678.63 | 92,388.40 | 65,807.97 | 7,598.49 | 68,998.50 |
| බැරකම් | 101,142.83 | 2,973.89 | 99,548.82 | 68,056.36 | 2,963.90 | 65,948.42 |
| දේපළ, පිරියත හා උපකරණ අත්කර ගැනීම් | 2,029.20 | 62.64 | 2,091.84 | 2,605.05 | 87.32 | 2,692.37 |
| ප්‍රධාන පිරිවැඩියා මත දැරූ වියදම | 8,011.91 | - | 8,011.91 | 3,425.85 | - | 3,425.85 |
| අස්පෘෂ්‍ය වත්කම් අත්කර ගැනීම් | 140.24 | 0.53 | 140.77 | 1.40 | 0.15 | 1.55 |
| ක්ෂයවීම හා හිලව් කිරීම | 4,256.71 | 266.06 | 4,522.77 | 3,434.06 | 255.84 | 3,689.90 |
| මෙහෙයුම් වියදම් | 139,715.56 | 2,779.07 | 139,438.44 | 108,341.82 | 2,337.97 | 107,957.39 |

" සමූහය" යටතේ වාර්තා කරන ලද අගයන් අන්තර් සමූහ ශේෂ වලින් බැහැර වේ.

## 19. වෙනත් ආදායම් සහ ලාභ

| | සමූහය<br>2013<br>රු.මි. | සමූහය<br>2012<br>රු.මි. | සමාගම<br>2013<br>රු.මි. | සමාගම<br>2012<br>රු.මි. |
|---|---|---|---|---|
| දේපළ, පිරියත හා උපකරණ ව්‍යපහරණය මත ලාභය/(අලාභය) | 0.13 | (8.87) | - | (8.87) |
| විනිමය ලාභය | 1,465.66 | 916.88 | 1,610.85 | - |
| විවිධ (සටහන 19.1) | 150.04 | 288.65 | 144.20 | 280.57 |
| ලාභාංශ | - | - | 2,400.00 | 150.00 |
| | **1,615.83** | **1,196.66** | **4,155.05** | **421.70** |

19.1 රක්ෂණ හිමිකම්වලින් හා ගුවන්යානා ආරක්ෂක තැන්පතු සංචිත වලින් ලත් ලැබීම් විවිධ ආදායමමෙහි අන්තර්ගත වේ.

## 20.1 මූල්‍ය පිරිවැය

| | සමූහය<br>2013<br>රු.මි. | සමූහය<br>2012<br>රු.මි. | සමාගම<br>2013<br>රු.මි. | සමාගම<br>2012<br>රු.මි. |
|---|---|---|---|---|
| ණය ගැනුම් , බැංකු අයිරා හා අතිප්‍රමාදිත සැපයුම්කාර ශේෂ මත පොලී වියදම් | 2,854.39 | 1,295.91 | 2,920.41 | 1,341.50 |
| විලම්බිත ගුවන්යානා උත්ශ්‍රේණිගත කිරිම මත මූල්‍ය ගාස්තු | 137.38 | 164.10 | 137.38 | 164.10 |
| කල් බදුකර බැරකම් මත මූල්‍ය ගාස්තු | 80.61 | 32.29 | 80.61 | 32.29 |
| වරණීය කොටස් ලාභාංශ | 150.00 | 150.00 | - | - |
| | **3,222.38** | **1,642.30** | **3,138.40** | **1,537.89** |

## 20.2 මූල්‍ය පිරිවැය

| | සමූහය 2013 රු.මි. | සමූහය 2012 රු.මි. | සමාගම 2013 රු.මි. | සමාගම 2012 රු.මි. |
|---|---|---|---|---|
| පොලී ආදායම | 191.21 | 72.64 | 169.62 | 65.14 |
| භාණ්ඩාගාර බැඳුම්කර මත පොලිය | 1,465.35 | 184.26 | 1,465.35 | 184.26 |
| | **1,656.56** | **256.90** | **1,634.97** | **249.40** |

## 21. මෙහෙයුම් කටයුතුවලින් අලාභය

**අයකිරීමෙන් /(බැර කිරීමෙන්) පසු ප්‍රකාශිතය:**

| | සමූහය 2013 රු.මි. | සමූහය 2012 රු.මි. | සමාගම 2013 රු.මි. | සමාගම 2012 රු.මි. |
|---|---|---|---|---|
| **විකුණුම් පිරිවැයෙහි ඇතුළත්ය:** | | | | |
| කාර්ය මණ්ඩල වියදම් | 11,878.84 | 9,235.21 | 11,878.84 | 9235.21 |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වියදම් - පාරිතෝෂික | 365.56 | 315.33 | 365.56 | 315.33 |
| නිශ්චිත දායකත්ව සැලසුම් වියදම් - සේ.අ.අ. - සේ.නි.භා.අ. | 1,098.00 | 896.12 | 1,098.00 | 896.12 |
| ක්‍රියාකාරී බදුකර කුලී | 14,514.05 | 10,207.72 | 14,514.05 | 10,207.72 |
| ක්ෂයවීම / හිලව් කිරීම | 4,066.13 | 3,287.48 | 4,066.13 | 3,286.06 |
| මන්දගාමීව චලනය වන ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සඳහා ප්‍රතිපාදනය (ශුද්ධ) | 66.41 | 101.40 | 66.41 | 101.40 |
| ගුවන්යානා ඉන්ධන පිරිවැය | 63,754.50 | 48,702.87 | 63,754.50 | 48,702.87 |
| වරලත් ගාස්තු | 193.94 | 187.46 | 193.94 | 187.46 |
| **පරිපාලන වියදම්හි ඇතුළත්ය:** | | | | |
| කාර්ය මණ්ඩල වියදම් | 1,944.72 | 1,659.71 | 1,306.65 | 1,109.80 |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වියදම් - පාරිතෝෂික | 111.34 | 142.78 | 65.48 | 46.52 |
| නිශ්චිත දායකත්ව සැලසුම් වියදම් - සේ.අ.අ. - සේ.නි.භා.අ. | 207.83 | 176.96 | 156.05 | 130.68 |
| අඩමාන ණය සඳහා / (ප්‍රත්‍යාවර්තනය සඳහා) ප්‍රතිපාදන | (47.58) | 0.07 | (47.58) | 0.07 |
| ක්ෂයවීම / හිලව් කිරීම | 437.16 | 384.29 | 171.10 | 129.88 |
| විනිමය අලාභය | - | - | - | 386.23 |
| විගණකවරුන්ගේ පාරිශ්‍රමික | 6.94 | 6.09 | 4.89 | 4.89 |
| **විකුණුම් සහ අලෙවි පිරිවැයයෙහි ඇතුළත්ය::** | | | | |
| ප්‍රචාරණ වියදම් | 438.11 | 429.53 | 438.11 | 429.53 |
| කාර්ය මණ්ඩල වියදම් | 1,480.39 | 1,207.61 | 1,480.39 | 1,207.61 |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වියදම් - පාරිතෝෂික | 12.38 | 20.29 | 12.38 | 20.29 |
| නිශ්චිත දායකත්ව සැලසුම් වියදම් - සේ.අ.අ. - සේ.නි.භා.අ. | 108.45 | 94.74 | 108.45 | 94.74 |
| ක්ෂයවීම / හිලව් කිරීම | 19.48 | 18.12 | 19.48 | 18.12 |
| අලෙවි ගාස්තු අයකිරීම "ෆ්ලයිස්මයිල්ස්" | 7.88 | 4.03 | 7.88 | 4.03 |

## 22. බදුකරණය

| | සමූහය 2013 රු.මි. | සමූහය 2012 රු.මි. | සමාගම 2013 රු.මි. | සමාගම 2012 රු.මි. |
|---|---|---|---|---|
| **බදු වියදම** | | | | |
| ආදායම් බදු වියදමෙහි ප්‍රධාන අංග පහත දැක්වේ. | | | | |
| **ජංගම ආදායම් බද්ද** | | | | |
| වසර සඳහා සාමාන්‍ය කටයුතු ජංගම බදු වියදම් (සටහන 22.1) | 15.24 | 10.65 | - | - |
| ඉකුත් වර්ෂ සම්බන්ධ ජංගම බදු ඌණ / (අධි) ප්‍රතිපාදනය | - | 0.30 | - | 3.29 |
| | **15.24** | **10.95** | **-** | **3.29** |

22.1 ජංගම බදු වියදම් /(ආදායම්) සහ ගිණුම්කරණ අලාභ නිපැයුම් අතර සැසඳුම

| | සමූහය 2013 | සමූහය 2012 | සමාගම 2013 | සමාගම 2012 |
|---|---|---|---|---|
| බදු පූර්ව ගිණුම්කරණ අලාභය | (22,503.54) | (17,197.43) | (21,749.75) | (19,774.74) |
| බද්දට යටත් නොවූ ආදායම | 22,523.91 | 17,235.47 | 21,749.75 | 19,774.74 |
| 28% ක් වූ සාමාන්‍ය බදු අනුප්‍රමාණය යටතේ ව්‍යවස්ථාපිත ආදායම | 20.37 | 38.04 | - | - |
| බදුවන ලාභය | 20.37 | 38.04 | - | - |
| 28% ක් වූ බදු අනුප්‍රමාණය මත ව්‍යවස්ථාපිත බද්ද | 5.70 | 10.65 | - | - |
| ශුද්ධ අඩුකළ නොහැකි වියදම් කෙරෙහි බදු බලපෑම | 0.96 | - | - | - |
| වෙනත් ආදායම් මත බද්ද | 8.58 | - | - | - |
| ජංගම ආදායම් බදු වියදම | **15.24** | **10.65** | - | - |

## 23. බැඳීම් හා අවිනිශ්චිතතා

### 23.1 ප්‍රාග්ධන වියදම් බැඳීම්

සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලට අනුෂංගික දේපළ, පිරියත හා උපකරණ අත්කර ගැනීම වෙනුවෙන් සමූහයේ සහ සමාගමේ බැඳීම් පහත දැක්වේ.

| | 2013 රු.මි. | 2012 රු.මි. |
|---|---|---|
| ගිවිසුම්ගත එහෙත් ප්‍රතිපාදනය නොකළ | | |
| ස්පෘෂ්‍ය | 802.30 | 111.25 |
| අස්පෘෂ්‍ය | 40.25 | 15.16 |
| එන්ජින් පිරිවැඩියා | 2,028.00 | 1,530.30 |
| මැදිරි ප්‍රති අනුරූපනය | 418.28 | 1,031.71 |
| | 3,288.83 | 2,688.42 |
| මණ්ඩලය අනුමත කළ එහෙත් ගිවිස නොගත් | | |
| ස්පෘෂ්‍ය | 501.96 | 103.33 |
| අස්පෘෂ්‍ය | - | 31.95 |
| | 501.96 | 135.28 |
| | 3,790.79 | 2,823.70 |

**23.2 මූල්‍ය බැදීම්**

(අ) මාර්තු මස 31 දිනට අවලංගු කළ නොහැකි ක්‍රියාකාරි බදුකර යටතේ සමාගමේ අනාගත අවම බදුකර බැදීමෙහි මුළු ප්‍රමාණය පහත දැක්වේ.

| | සමාගම | |
|---|---|---|
| | සමූහය 2013 රු.මි. | සමූහය 2012 රු.මි. |
| වසරක් තුළ | 13,112.14 | 13,269.28 |
| වසරකින් පසුව එහෙත් වසර පහකට නොවැඩි | 29,256.80 | 41,761.83 |
| වසර පහකට පසුව | 9,491.80 | 22,964.35 |
| | 51,860.74 | 77,995.46 |

(ආ) බද්දට ගත් ගුවන් යානා සඳහා ඇප තැන්පතු ලෙස 2013 මාර්තු මස 31 වන දිනට රු.මි. 864.58 ( ඇ.ඩො.මි. 6.82 ) ක් වටිනා ණයවර ලිපි සමාගම මගින් නිකුත්කර ඇත.

(ඇ) සමාගම හා අනුබද්ධ ආයතන විසින් බදුගත් ඉඩම් හා ගොඩනැගිලි සඳහා වන ඉතිරි බදු කුලී බැදීම් පහත දැක්වේ.

| | සමූහය 2013 රු.මි. | සමූහය 2012 රු.මි. | සමාගම 2013 රු.මි. | සමාගම 2012 රු.මි. |
|---|---|---|---|---|
| **ගෙවිය යුතු වාරික මුදල** | | | | |
| වසරක් තුළ | 414.49 | 408.51 | 390.28 | 384.30 |
| වසරකින් පසුව එහෙත් වසර පහකට නොවැඩි | 1,644.08 | 1,641.94 | 1,526.49 | 1,522.93 |
| වසර පහකට පසුව | 3,539.85 | 3,956.48 | 3,175.16 | 3,569.00 |

**23.3අවිනිශ්චිතතා**

**සමාගම**

2013 මාර්තු 31 දිනට අවිනිශ්චිත බැරකම් රු.මි.2,988.94 ක් (2012: රු.මි.2,976.20) බව කළමනාකරණය ඇස්තමේන්තු කරයි. සමාගමට එරෙහිව ඉදිරිපත් කෙරුනු නීති කෘත්‍ය හා වෙනත් හිමිකම් ඉල්ලීම් හා සම්භාවී හිමිකම් ඉල්ලීම් සම්බන්ධයෙන් සමාගමේ සාමාන්‍ය ව්‍යාපාර කටයුතු කරගෙන යාමේදී උද්ගතව වූ යම් අවිනිශ්චිත බැරකම්වලට අදාළ සැලකිය යුතු බැරකම් කිසිවක් අධ්‍යක්ෂ වරුන් අපේක්ෂා නොකෙරෙන හෙයින් එහිලා මෙම මූල්‍ය ප්‍රකාශ තුළ ප්‍රතිපාදන කිසිවක් සලසා නැත.

මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළේ යානාස්ථ මුළුතැන්ගෙය ඉදිකිරීම සඳහා ස්වකීය අනුබද්ධ ආයතනය විසින් ලබාගෙන ඇති ඇ.ඩො.මි. 1.63 ක් වූ ණය මුදලට සමාගම ඇපවී ඇත.

**අනුබද්ධ සමාගම**

2013 මාර්තු මස 31 දිනට සමාගමට එරෙහිව කම්කරු විනිශ්චය සභාව ඉදිරියේ පනවා ඇති නඩු කිහිපයක තීන්දු අපේක්ෂිතව පවතී. ඊට අදාළ බැදීම් වල වටිනාකම ප්‍රමාණවත් විශ්වාසනීයත්වයකින් යුතුව ගණනය කළ නොහැකි නිසාත්, එබඳු බැරකම් මෙම මූල්‍ය ප්‍රකාශ කෙරෙහි සැලකිය යුතු අයුරින් බලපෑම් ඇති නොකරනු ඇතැයි අධ්‍යක්ෂවරුන් සලකන නිසාත් ඒ සඳහා ප්‍රතිපාදන කිසිවක් මූල්‍ය ප්‍රකාශ තුළ සලසා නැත.

**24 ප්‍රතිඥාත වත්කම්**

**සමූහය/සමාගම**

ලබාගෙන ඇති බැංකු පහසුකම් එල්ලේ වත්කම්වල විස්තර සඳහා 14.2 හා 14.3 වන සටහන් බලන්න.

**25 ශේෂ පත්‍රයේ දිනයට පසුව උද්ගතවන සිදුවීම්**

A 321 වර්ගයේ ගුවන් යානයක් 2014 දී ලබාගැනීම සඳහා ගුවන්යානා කල්බදු කරුවෙකු සමග අවබෝධතා ගිවිසුමකට සමාගම 2013 මාර්තු මාසයේදී එළඹියේය.

2014 – 2021 දක්වා කාලය තුළ A 330 – 300 වර්ගයේ එයා බස් ගුවන්යානා හයක් මිලදී ගෙන ලබාගැනීම සඳහා සමාගම 2013 ජුනි මාසයේදී ගැනුම් ගිවිසුමකට එළඹියේය.

රු.බි. 17 ක් වටිනා භාණ්ඩාගාර බැදුම්කර ප්‍රමාණයක් 2013 ජුලි මාසයේදී සමාගම විසින් ව්‍යාහපරණය කරන ලදි.

## 26 අදාළ පාර්ශවවල හෙළිදරව් කිරීම්

### 26.1 සමූහය හා සමාගම

#### 26.1.1 ප්‍රධාන කළමනාකරණ පිරිස් සමග ගණුදෙනු

සමාගමෙහි සහ එහි අනුබද්ධ ආයතනයෙහි කටයුතු සැලසුම් කිරීම මෙහෙයවීම හා පාලනය කිරීම යන කාර්යයන්හි බලධාරීත්වය හා වගකීම දරන තැනැත්තන් ලෙස අර්ථ නිරූපිත ප්‍රධාන කළමනාකරණ පිරිස් අදාළ පාර්ශවවලට ඇතුළත් වේ. එකී පිරිසට අධ්‍යක්ෂ මණ්ඩලය, ප්‍රධාන විධායක නිලධාරී හා යථෝක්ත නිර්ණායක සපුරාලන සමූහයට අයත් අනෙකුත් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ විධායක නිලධාරීන් ඇතුළත් වේ.

| | 2013<br>රු.මි.<br>ලැබීම්/ගෙවීම් | 2012<br>රු.මි.<br>ලැබීම් / ගෙවීම් |
|---|---|---|
| කෙටිකාලීන ප්‍රතිලාභ | 150.66 | 118.13 |
| පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ | 9.55 | 18.97 |

වසර තුළ අධ්‍යක්ෂවරුන්ට ගෙවන ලද රු.මි. 46.6 ක් වූ (2012: රු.මි. 34.73) පාරිශ්‍රමික ඉහත මුදල් ප්‍රමාණවලට ඇතුළත් වේ. හෙළිදරව්කර ඇති ඉහත ප්‍රතිපාදනවලට අමතරව, ප්‍රධාන කළමනාකරණ පිරිස් ඔවුන්ගේ කලත්‍රයන් හා යැපෙන දූ දරුවන් ස්වකීය ධූරකාලය තුළ ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ මාර්ග ගත ගුවන් සේවාවල "එෆ්. ඕ.සී." ව්‍යාපාරික පංතියෙහි ගමන් කිරීමට හිමිකම් ලබයි.

### 26.2 සමූහය

**26.2.1** (අ) සමාගම ස්වකීය සාමාන්‍ය ව්‍යාපාරික කාර්යයන් අතරතුර පහත දැක්වෙන සැලකිය යුතු කටයුතු ඇතුළත් ගණුදෙනු ශ්‍රී ලංකා රජයේ පාලනයට යටත් ආයතන සමඟ ඉටුකර ඇත.

| | 2013<br>රු.මි.<br>ලැබීම්/<br>(ගෙවීම්) | 2012<br>රු. මි.<br>ලැබීම්/<br>(ගෙවීම්) |
|---|---|---|
| විකුණුම් | 5,226.70 | 171.85 |
| ණය - ලැබීම් | 761.64 | 2,558.99 |
| - පොලිය ඇතුලු ආපසු ගෙවීම් | (4,547.37) | (725.59) |
| භාණ්ඩ/සේවා මිලදී ගැනුම් සහ ව්‍යවස්ථාපිත ගාස්තු* | (30,955.27) | (7,834.62) |

*භාණ්ඩ/සේවා මිලදී ගැනුම් සහ ව්‍යවස්ථාපිත ගාස්තු වලට විලම්බිත වැඩපිළිවෙළ යටතේ සිදු කළ ගෙවීම් ඇතුළත් වේ.

**26.2.1** (ආ) රපෝර්තු දිනට පහත දැක්වෙන වත්කම් හා බැරකම් ශ්‍රී ලංකා රජයේ පාලනයට යටත් ආයතන සමඟ පවතී:

- ඇ.ඩො. මිලියන 11.1 ක් වූ කෙටි කාලීන ණය. (2012 ඇ.ඩො. මි. 20)
- ඇ.ඩො. මිලියන 51ක් වූ අයිරා පහසුකම් (2012 ඇ.ඩො. මි. 31)
- ඇ.ඩො. මිලියන 10ක් වූ බැංකු ඇපකර පහසුකම් (2012 ඇ.ඩො. මි. 10)

**26.2.2** රපෝර්තු දිනට පහත දැක්වෙන වත්කම් හා බැරකම් ශ්‍රී ලංකා රජයේ පාලනයට යටත් ආයතන සමඟ පවතී:

- හිඟ හිට ඇති ගෙවිය යුතු ශුද්ධ ශේෂය රු.මි.39,677.64කි. (2012: රු.මි.26,549.71) *
- කෙටි කාලීන තැන්පතු වල වටිනාකම රු.මි. 31 කි. (2012 :රු.මි. 91.78).
- මුහුණත වටිනාකම රු.බි. 28.55ක් වූ භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජනය (සටහන 7.3).
- ඡන්ද වරය අහිමි නිදහස් කරගත හැකි සමුච්චිත පරිවර්ත්‍ය 15% (දස අවුරුදු) රු.මි. 10 ක් වටිනා වරණීය කොටස්.

* ශ්‍රී ලංකා රජයේ පාලනයට යටත් ආයතන වෙතින් වූ/වෙත වූ ශේෂ, මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි වෙළඳ හා වෙනත් ලැබීම් නියමිත/ගෙවීම් නියමිත සහ පොලී දරන බැරකම් යටතේ අන්තර්ගත කෙරේ.

**26.2.3** සමාගම ස්වකීය සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු කරගෙන යාමේදී රජයේ පාලනයට යටත් ආයතන සමග සැලකිය යුතු මට්ටමේ ගණු දෙනු සිදු කර ඇත.

| | |
|---|---|
| සී/ස ගුවන් තොටුපළ හා ගුවන් සේවා සමාගම | ලංකා බැංකුව |
| ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව |
| දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | සී/ස මිහින් ලංකා සමාගම |
| සිවිල් ගුවන් සේවා අධිකාරිය | සේවක අර්ථසාධක අරමුදල |

සේවක විශ්‍රාම ප්‍රතිලාභ සඳහා වූ දායකවීම් වලට අදාළ වැඩිමනත් ගණුදෙනු සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලේ අණපනත් හා රෙගුලාසි වලට අනුකූලව සිදු කරනු ලැබේ.

**26.3 සමාගම**

**26.3.1** සමාගම ස්වකීය ව්‍යාපාර කාර්යයන් අතරතුර පහත දැක්වෙන කටයුතු ඇතුළත් ගණුදෙනු ශ්‍රී ලංකා රජයේ පාලනය යටතට අයත් ආයතන සමඟ ඉටුකර ඇත.

| | 2013<br>රු. මි.<br>(ගෙවීම්) /<br>ලැබීම් | 2012<br>රු. මි.<br>(ගෙවීම්) /<br>ලැබීම් |
|---|---|---|
| **ගණුදෙනුවේ ස්වභාවය** | | |
| යානාස්ථ සේවා | 8.44 | 9.38 |
| ගුවන්යානාස්ථ ආහාරපාන හා වෙනත් සේවා | (3,008.58) | (2,347.97) |
| ලාභාංශ | 2,400.00 | 150.00 |
| දිගු කාලීන ණය ආපසු ගෙවීම | (236.93) | (232.37) |

**26.3.2** ශේෂ පත්‍රයේ දිනට අනුබද්ධ සමාගම සමඟ හිඟහිට පැවති ශේෂ පහත දැක්වේ:

- ලැබිය යුතු මුදල් වටිනාකම රු.මි.2,441.19කි. (2012: රු.මි..2,869.98)
- ණය ශේෂයේ වටිනාකම රු.මි. 1,253.93කි. (2012: රු.මි. 1,494.13 ) අදාළ පොලිය වනුයේ ගිවිසගත් සීමාවකට යටත් වූ මාසික 'ලිබෝ' අනුපාතයයි.
- ඡන්ද වරය අහිමි නිදහස්කර ගත හැකි සමුච්චිත පරිවර්ත්‍ය 15% (පස් අවුරුදු) රු.මි.10 ක් වටිනා වරණීය කොටස්.

**26.3.3** සමාගම ස්වකීය සාමාන්‍ය ව්‍යාපාරික කාර්යයන් අතරතුර පහත දැක්වෙන කටයුතු ඇතුළත් ගණුදෙනු ශ්‍රී ලංකා රජයේ පාලනයට යටත් ආයතන සමඟ ඉටුකර ඇත.

| | | 2013<br>රු. මි.<br>(ගෙවීම්)/<br>ලැබීම් | 2012<br>රු. මි.<br>(ගෙවීම්)/<br>ලැබීම් |
|---|---|---|---|
| විකුණුම් | | 5,018.27 | 37.73 |
| ණය | - ලැබීම් | 761.64 | 2,558.99 |
| | - පොලිය ඇතුලු ආපසු ගෙවීම් | (4,397.37) | (575.59) |
| භාණ්ඩ හා සේවා මිලදී ගැණුම් හා ව්‍යවස්ථාපිත ගාස්තු * | | (30,502.97) | (7,693.17) |

*භාණ්ඩ/සේවා මිලදී ගැනුම් සහ ව්‍යවස්ථාපිත ගාස්තු වලට විලම්බිත වැඩපිළිවෙල යටතේ සිදු කළ ගෙවීම් ඇතුළත් වේ.

සමාගම විසින් ලබාගත් පහසුකම්වල ලයිස්තුව 26..2.1 (ආ) සටහන යටතේ හෙළිදරව් කර ඇති පහසුකම් වලට සමාන වේ.

**26.3.4** ශේෂ පත්‍රයේ දිනට පහත දැක්වෙන වත්කම් හා බැරකම් ශ්‍රී ලංකා රජයේ පාලනය යටතට අයත් ආයතන සමඟ පවතී.

- හිඟ හිට ඇති ගෙවිය යුතු ශුද්ධ ශේෂය රු.මි. 39,945.93කි. (2012: රු.මි.26,606.68)*
- කෙටි කාලීන තැන්පතුවල වටිනාකම රු.මි.31කි. (2012 :රු.මි.91.78)
- මුහුණත වටිනාකම රු.බි. 28.55ක් වූ භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජනය (සටහන 7.3)

* ශ්‍රී ලංකා රජයේ පාලනය යටතට අයත් ආයතන වෙතින් වූ/වෙත වූ ශේෂ, මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි වෙළඳ හා වෙනත් ලැබීම් නියමිත/ගෙවීම් නියමිත සහ පොලී දරන බැරකම් යටතේ අන්තර්ගත කෙරේ.

**26.3.5** ශ්‍රී ලංකා රජයේ පාලනය යටතට අයත් සමාගම විසින් සැලකිය යුතු මට්ටමේ ගනු දෙනු සිදුකළ ආයතනවල ලයිස්තුව සමූහය (සටහන 26.2.3) යටතේ හෙළිදරව් කර ඇති ආයතනවලට සමාන වේ.

## 27 මූල්‍ය අවදානම් කළමනාකරණ පරමාර්ථ සහ ප්‍රතිපත්ති

සමාගමේ ප්‍රධාන මූල්‍ය වගකීම් සමන්විත වනුයේ ණය හා ණය ගැනුම්, වෙළඳ හා වෙනත් ලැබීම් නියමිත සහ වෙනත් මූල්‍ය වගකීම් යනාදියෙනි. මෙම මූල්‍ය වගකීම්වල ප්‍රධාන අරමුණ වනුයේ, සමාගමේ මෙහෙයුම් කටයුතුවලට මූල්‍යකරණය සලසා දීමයි. ස්වකීය මෙහෙයුම් කටයුතු තුළින් ඍජුවම ලබා ගන්නා වෙළඳ හා වෙනත් ලැබීම් නියමිත සහ මුදල් හා කෙටි කාලීන තැන්පතුවලින් සමාගමේ මූල්‍ය වත්කම් සමන්විත වේ.
ආයතනික කළමනාකරණය විසින් සර්වව්‍යාපී අවදානම් කළමනාකරණ න්‍යාසයක් වාරමය වශයෙන් සමාලෝචනයට හසුකර යාවත්කාලීන කරනු ලබන අතර සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකි පහත දැක්වෙන මූල්‍ය අවදානම් හඳුනාගනු ලැබ ඇත.

**(i) වෙළඳපළ අවදානම**
- පොලී අනුපාත අවදානම
- ව්‍යවහාර මුදල් අවදානම

**(ii) ද්‍රවශීලතා අවදානම**

**(iii) ණයවර අවදානම**

වෙළඳපළවල් තුළ සහ අනෙකුත් මූල්‍යමය අවදානම් සහිත කටයුතුවල වෙනස්කම් නිරූපණය වනු පිණිස සමාගම නිත්‍ය පදනමක් මත සිය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති හා ක්‍රියා පරිපාටි සමාලෝචනයට භාජනය කරන අතර, ඒවා පනවා ඇති ප්‍රතිපත්ති හා ක්‍රියා පරිපාටිවලට අනුකූලව අවදානම් හඳුනා ගනු ලැබ, මානනය කර, කළමනාකරණය වනු ඇති බවට වගබලා ගනු පිණිස ප්‍රශස්ත ප්‍රතිපත්ති හා ක්‍රියා පරිපාටි මගින් පාලනය කෙරේ.

(i) වෙළඳපළ අවදානම

(ii) පොලී අනුපාත අවදානම

පොලී අනුපාත අවදානම යනු, මූල්‍ය සාධන පත්‍රයක අනාගත මුදල් ගලනවල සාධාරණ අගය වෙළඳපළ පොලී අනුපාතවල වෙනස්කම් කරණකොට ගෙන උච්චාවචනය වීමේ අවදානමයි. වෙළඳපළ පොලී අනුපාතවල සිදුවන වෙනස්කම් ආශ්‍රිත අවදානම අදාළ වනුයේ, ඉපිලෙන පොලී අනුපාත සහිත සමාගමේ දිගු කාලීන ණය බැඳියාවන් කෙරෙහිය.

සමාගමේ ප්‍රතිපත්තිය වනුයේ, පොලී අනුපාත උච්චාවචනවල බලපෑම සමනය කරනු අටියෙන් සිදු කෙරෙන ගුවන්යානා කල්බදු මත සපයා ගැනීමේ කාර්යද ඇතුළුව ස්ථිර හා විචල්‍ය අනුපාත ණය ගැනුම් අතර ප්‍රශස්ත සමබරතාවක් පවත්වා ගැනීමයි. ස්වකීය විචල්‍ය අනුපාත ණය ගැණුම් ආශ්‍රිත පොලී අනුපාත උච්චාවචනයන් කෙරෙහි පවත්නා සිය නිරාවරණය වීමද ග්‍රහණය කරගනු පිණිස ව්‍යුත්පන්න සාධන පත්‍ර උපයෝගී කර ගනිමින් සමාගම විසින් නිශ්චිත ගණු දෙනු වලට ද එළඹ තිබේ.

ණය හා ණය ගැණුම් මත පොලී අනුපාත වලත්, බැඳුම්කර ආයෝජනවල පොලී අනුපාතවලත් යුක්තයුක්ත අයුරින් සිදුවිය හැකි වෙනස්කම්හී ලා උද්ගත වන සංවේදිතාව පහත දැක්වෙන වගුවෙන් නිරූපණය වේ. අනෙකුත් සියලුම විචල්‍යතා සංගතව පවතින තත්වයක් යටතේ, ඉපිලෙන අනුපාත මත ණය ගැනුම්වල මෙන්ම භාණ්ඩාගාර බැඳුම්කරවලද සංසට්ටනය ඔස්සේ සමූහයේ/සමාගමේ බදු පූර්ව අලාභය කෙරෙහි බලපෑම් ඇති වනුයේ පහත දැක්වෙන පරිදිය.

| | බදු පූර්ව අලාභය කෙරෙහි බලපෑම | | වෙනත් සර්වවාපී ආදායම් කෙරෙහි බලපෑම | |
|---|---|---|---|---|
| | සමූහය | සමූහය | සමාගම | සමාගම |
| | 2013 | 2012 | 2013 | 2012 |
| | රු.මී. | රු.මී. | රු.මී. | රු.මී. |
| **පොලී අනුපාතයේ වැඩිවීම/අඩුවීම** | | | | |
| + 1% | (611.29) | (613.96) | (921.43) | (921.43) |
| - 1% | 611.29 | 613.96 | 921.43 | 921.43 |

පොලී අනුපාතවල වැඩිවීම, අලාභවල වැඩි වීමට හේතු කාරයකයක් වෙයි

**විදේශ ව්‍යවහාර මුදල් අවදානම**

විදේශ ව්‍යවහාර මුදල් අවදානම යනු, මූල්‍ය සාධන පත්‍රයක අනාගත මුදල් ගලනවල සාධාරණ අගය විදේශ විනිමය අනුපාතවල වෙනස්කම් කරණකොට ගෙන උච්චාවචනය වීමේ අවදානමයි. විදේශ විනිමය අනුපාත උච්චාවචනවල බලපෑම කෙරෙහි සමාගම නිරාවරණය වනුයේ, විදේශ ව්‍යවහාර මුදලින් ගණනය වන ස්වකීය ආදායම්, වියදම් හා වෙනත් සාධන පත්‍ර ආශ්‍රිත කටයුතු නිසාය.

එක් එක් කරුණට අදාළ වන්නාවූ වැදගත් ව්‍යවහාර මුදල් ඒකක අනුසාරයෙන් හැකිතාක් දුරට ගළපා ගනිමින් උපයෝගී කර ගනු ලබන ප්‍රතිපත්තියකට අනුව සමාගම ස්වකීය විදේශ විනිමය ආශ්‍රිත කටයුතුවලට මුහුණ දීම කළමනාකරණය කරයි. මීට අමතර වශයෙන්, සමාගම ස්වකීය විදේශ මුදල් නිරාවරණය කළමනාකරණය කරනුයේ විදේශ ව්‍යවහාර මුදල් ආශ්‍රිත ඉදිරි ගිවිසුම් උපයෝගී කර ගනිමිනි.

ඇමරිකානු ඩොලර් ව්‍යවහාර මුදල් විනිමය අනුපාතයෙහි යුක්තයුක්ත අයුරින් සිදුවිය හැකි වෙනස්කම්හිලා උද්ගත වන සංවේදිතාව පහත දැක්වෙන වගුවෙන් නිරූපණය වන අතර අනෙකුත් සියලුම විචල්‍යතා සංගතව පවතින තත්වයක් යටතේ, වත්කම්වල හා බැරකම් වල සාධාරණ මුදල්මය අගය තුළ සිදුවන වෙනස්කම් හේතුවෙන් සමූහයේ/සමාගමේ බදු පූර්ව අලාභය මත ඇතිවූ බලපෑම ඉන් විද්‍යාමාන වේ. අනෙකුත් ව්‍යවහාර මුදල් සම්බන්ධයෙන් සිදුවූ විදේශ ව්‍යවහාර මුදල් විනිමය වෙනස්කම් ආශ්‍රිත සමූහයේ නිරාවරණය වැදගත් සේ නිරූපණය නොවේ.

| | බදු පූර්ව අලාභය | කෙරෙහි බලපෑම |
|---|---|---|
| | සමූහය | සමූහය |
| | රු.මී. | රු.මී. |
| **ඇමැරිකන් ඩොලර් අනුපාතයේ වැඩිවීම/(අඩුවීම)** | | |
| + 3% | 742.72 | 725.96 |
| - 3% | (742.72) | (725.96) |

පොලී අනුපාතවල වැඩිවීම, අලාභවල වැඩි වීමට හේතු කාරයකයක් වෙයි

**(ii) ද්‍රවශීලතා අවදානම**

ද්‍රවශීලතා අවදානම යනු, සිය ප්‍රවර්තන හා අනාගත මුදල් බැඳියාවන්, ඒවා ගෙවීමට නියමිත අවස්ථාව වන විට සමාගම විසින් සපුරාලීමට අසමත් විය හැකි අවදානමයි. දෛනිකව/සතිපතා/මාසිකව හා වාර්ෂිකව සිදු කෙරෙන මුදල් කළමනාකරණ හා අය වැය ලේඛන ක්‍රියාවලියක් උපයෝගී කර ගනිමින් සමාගම සිය අරමුදල් ඌනතාවයේ අවදානම අධීක්ෂණය කරයි. එකී අවදානම සමනය කිරීමේ අටියෙන් සමාගම, දිගු හා කෙටි කාලීන ණය, බැංකු අයිරා පහසුකම් සහ මූල්‍ය/ක්‍රියාකාරී කල්බදුකර ඇතුළු විවිධ මූලාශ්‍ර සහිත අරමුදල්කරණයක් මූල්‍ය ආයතන වෙතින් සපයා ගනියි.

ප්‍රාග්ධන නික්ෂේපණ වැඩසටහනේ කොටසක් වශයෙන් ශ්‍රී ලංකා රජය භාණ්ඩාගාර බැඳුම්කර අනුසාරයෙන් සමාගම සඳහා ආයෝජන සිදු කර තිබේ. එකී භාණ්ඩාගාර බැඳුම්කර ඒවායේ කල් ඉකුත් වීමට පෙර මුදල් කර ගැනීම සඳහා සමාගම කටයුතු කරමින් සිටින අතර එය, මීළඟ මූල්‍ය වර්ෂය තුළ සමාගමේ ද්‍රවශීලතා තත්වය සවිමත් කරනු ඇත.

සමාගමේ/සමූහයේ මූල්‍ය තත්වය පිළිබඳ කල් ඉකුත්වීමේ ආකෘතිය වට්ටම් ගත නොකළ කොන්ත්‍රාත්තුමය ගෙවීම් මත පදනම්ව පහත දැක්වෙන පරිදි සාරාංශගත කර දැක්විය හැකිය.

| | ඉල්ලූවිට<br>රු.මි. | මාස 3 ට අඩු<br>රු.මි. | මාස 3-12 අතර<br>රු.මි. | අවු. 1-5 අතර<br>රු.මි. | වසර 5 ට වැඩි<br>රු.මි. |
|---|---|---|---|---|---|
| **සමූහය** | | | | | |
| පොලී දරන බැරකම් | **6,849.32** | **3,191.91** | **8,851.75** | **29,433.58** | **735.29** |
| වෙළඳ හා වෙනත් ගෙවීම් නියමිත | **10,418.00** | **20,153.85** | **-** | **-** | **-** |
| වරණීය කොටස් | **-** | **-** | **-** | **-** | **2,200.00** |
| | **17,267.32** | **23,345.76** | **8,851.75** | **29,433.58** | **2,935.29** |
| **සමාගම** | | | | | |
| පොලී දරන බැරකම් | **6,849.32** | **3,133.00** | **8,675.04** | **28,400.38** | **735.29** |
| වෙළඳ හා වෙනත් ගෙවීම් නියමිත | **10,418.00** | **22,036.60** | **-** | **-** | **-** |
| | **17,267.32** | **25,169.60** | **8,675.04** | **28,400.38** | **735.29** |

**(iii) ණයවර අවදානම**

ණයවර අවදානම යනු, මූල්‍ය අලාභයකට හේතුවන අයුරින් මූල්‍ය සාධන පත්‍රයක් හෝ සේවා දායක කොන්ත්‍රාත්තුවක් යටතේ ප්‍රති පාර්ශවයක් විසින් ස්වකීය බැඳියා නොසපුරාලීමේ අවදානමයි. ප්‍රධාන වශයෙන් සිය මෙහෙයුම් කටයුතු ඔස්සේ (මූලික වශයෙන් වෙළඳ ලැබීම් නියමිත හරහා) සමාගම ණයවර අවදානමට නිරාවරණය වෙයි.

ගුවන් මගී විකුණුම් හා ගුවන් බඩු ප්‍රවාහනය මූලික වශයෙන් 'අයටා' සංගමයේ බලයලත් අලෙවි නියෝජිතයන් හරහා සිදුවේ. එබඳු විකුණුම්හි ණයවර අවදානම පුළුල් විවිධාංගීකරණය හේතුවෙන් සාපේක්ෂ වශයෙන් සුළු එකකි. මෙම නියෝජිතයන් විසින් කරනු ලබන මුදල් බේරුම් කිරීම, සිය ගුවන් මගී හා ගුවන් භාණ්ඩ බේරුම් කිරීමේ ක්‍රියා පිළිවෙත් ඔස්සේ 'අයටා' සංගමය විසින් සෘජුවම ගුවන් සමාගමට බේරුම් කරන අතර එමගින් එකී නියෝජිත වරුන්ගේ ණය ගෙවීමේ හැකියාව පිළිබඳව වැඩිමනත් සහතිකයක් ද සැපයේ.

ප්‍රධාන ගුවන් සමාගම් අතර ලැබීම් නියමිත හා ගෙවීම් නියමිත මූලික වශයෙන් නිරවුල් කෙරෙනුයේ 'අයටා' සංගමයේ නිශ්කාෂණ මධ්‍යස්ථානයෙනි. සාමාන්‍යයෙන් ලැබීම් නියමිත හා ගෙවීම් නියමිත එකතුකර නිරවුල් කෙරෙනුයේ සතිපතා විරාමයක් සහිතව වන අතර එමගින් ගෙවීම් ප්‍රමාද කිරීමේ අවදානම තුළ පැහැදිලි අඩුවීමක් සිදුවේ.

වෙනත් සේවා සබඳතා සඳහා, ඉටු කරනු ලබන සේවාවන්හි ස්වභාවය හා විෂය පථය අනුව රඳා පවතින සමපාර්ශවික ඇපයක් අවශ්‍ය වේ. ණය ගැතියන් වෙතින් ලැබෙන එබඳු සමපාර්ශවික ඇපවලට බැංකු ඇපකර සහ සුරැකුම් තැන්පතු ඇතුළත් වේ.

අවදානම් හඳුනා ගනු ලබූ විට ලැබීමට නියමිත අනුමත ගිණුම් සඳහා දුබලත්ව ප්‍රතිපාදන සැපයේ.

**ප්‍රාග්ධන කළමනාකරණය**

මෙම මූල්‍ය ප්‍රකාශවල 2.1.2 වන සටහනෙහි වැඩිමනත් වශයෙන් විස්තර කර ඇති අනුමත ව්‍යාපාර සැලැස්ම මත පිහිටා ශ්‍රී ලංකා රජය අවශ්‍ය අරමුදල් සපයා දීම සඳහා වන සිය වගකීම ප්‍රදර්ශනය කර ඇත. (11 වන සටහන බලන්න)

සමූහයේ කළමනාකරණය ප්‍රාග්ධන ව්‍යුහය අඛණ්ඩව සමාලෝචනයට භාජනය කරනු ලබන අතර ප්‍රවර්තන වෙළඳපළ තත්වයන් මෙන්ම සමූහයේ මෙහෙයුම් කටයුතුද නිරූපණය වනු පිණිස අවශ්‍ය ගැළපුම් සිදු කිරීම සඳහා සුදුසු පියවර ගනු ලබනවා ඇත.

# දස අවුරුදු සමාලෝචනය - සමාගම

| | | 2004 | 2005 | 2006 |
|---|---|---|---|---|
| **ආදායම් ප්‍රකාශය** | | | | |
| ආදායම | රු. මි. | 45,397.54 | 53,808.85 | 61,160.14 |
| මෙහෙයුම් වියදම | රු. මි. | 39,441.82 | 54,145.20 | 60,720.29 |
| ශුද්ධ ලාභය/(අලාභය) | රු. මි. | 7,424.48 | 479.87 | 476.53 |
| **ශේෂ පත්‍රය** | | | | |
| කොටස් ප්‍රාග්ධනය/ප්‍රකාශිත ප්‍රාග්ධනය | රු. මි. | 5,146.35 | 5,146.35 | 5,146.35 |
| ජංගම නොවන වත්කම් | රු. මි. | 13,072.68 | 10,908.79 | 16,136.77 |
| ජංගම වත්කම් | රු. මි. | 24,954.44 | 22,303.26 | 21,866.73 |
| මුළු වත්කම් | රු. මි. | 38,123.01 | 33,307.94 | 38,003.50 |
| ජංගම බැරකම් | රු. මි. | 20,612.84 | 22,381 .67 | 25,485.05 |
| **ඉපදවීම/ඒකක පිරිවැය** | | | | |
| සමස්ත ඉපදවීම | රු. tkm | 47.3 | 48.1 | 52.2 |
| ඒකක පිරිවැය | රු. tkm | 34.8 | 36.2 | 37.62 |
| සමච්ඡේදක පැටවුම් සාධකය | % | 68.7 | 74.9 | 72.0 |
| මගී කිලෝමීටර් ප්‍රමාණ ආදායම | රු./RPK | 4.9 | 5.1 | 5.3 |
| **නිපැයුම** | | | | |
| මගී ධාරිතාව | ASK මිලියන | 9,692.08 | 11,326.54 | 11,934.86 |
| සමස්ත ධාරිතාව | ATK මිලියන | 1,289.94 | 1,484.02 | 1,590.55 |
| **ප්‍රවාහනය** | | | | |
| ප්‍රවාහනිත මගීන් | දහස් සංඛ්‍යාත | 2,065 | 2,423 | 3,005 |
| ප්‍රවාහනිත මගීන් | RPK මිලියන | 7,276.35 | 8,142.54 | 9,050.44 |
| මගී පැටවුම් සාධකය | % | 75.08 | 71.89 | 75.83 |
| ප්‍රවාහනිත ගුවන් බඩු | ටොන් | 54,943 | 66,977 | 82,142 |
| ප්‍රවාහනිත ගුවන් බඩු පැටවුම | RTK මිලියන | 240.90 | 296.68 | 300.73 |
| සමස්ත ප්‍රවාහනිත සැපයුම | RTK මිලියන | 896.59 | 1,039.34 | 1,102.77 |
| ගුවන් බඩු පැටවුම් සාධකය | % | 52.08 | 56.95 | 56.11 |
| සමස්ත පැටවුම් සාධකය | % | 69.51 | 70.04 | 69.33 |
| **කාර්ය මණ්ඩලය** | | | | |
| සාමාන්‍ය සේවක පිරිස | සංඛ්‍යාව | 4,714 | 5,163 | 5,395 |
| ඒක සේවක පිරිස | රු. | 9,630,365 | 10,422,012 | 11,336,449 |
| ඒක සේවක ධාරිතාව | ටොන්-කි.මී. | 273,640 | 287,433 | 294,820 |
| ඒක සේවක ප්‍රවාහනිත පැටවුම | ටොන්-කි.මී. | 190,197 | 201,305 | 204,406 |
| **ගුවන් යානා ඇණිය** | | | | |
| A320-200 | ගණන | 3 | 5 | 5 |
| A330-200 | ගණන | 4 | 4 | 4 |
| A340-300 | ගණන | 5 | 5 | 5 |
| ටර්බෝ ඔට | ගණන | - | 2 | 2 |
| වසරාවසන සේවයේ නිරත ගුවන් යානා | ගණන | 12 | 16 | 16 |

| 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|---|
| 67,963.76 | 79,128.56 | 73,307.77 | 62,363.58 | 77,125.45 | 90,544.22 | 119,570.90 |
| 69,406.68 | 82,154.01 | 84,794.86 | 69,026.74 | 81,334.34 | 109,376.82 | 143,972.27 |
| 568.04 | 4,428.23 | (9,305.94) | (2,698.20) | (381.61) | (19,678.71) | (21,749.75) |
| 5,146.35 | 5,146.35 | 5,146.35 | 5,146.35 | 5,146.35 | 19,432.67 | 32,032.75 |
| 16,568.73 | 15,730.43 | 19,333.18 | 28,531.75 | 19,862.87 | 44,835.93 | 34,541.91 |
| 21,347.46 | 32,209.67 | 15,008.38 | 15,910.82 | 18,276.59 | 21,735.12 | 54,905.22 |
| 37,916.19 | 47,940.10 | 34,341.56 | 44,442.57 | 38,139.46 | 66,571.05 | 89,447.13 |
| 25,006.65 | 29,134.89 | 25,012.31 | 28,399.92 | 28,017.97 | 58,259.86 | 68,684.68 |
| 55.71 | 61.01 | 64.85 | 54.94 | 60.27 | 62.74 | 74.31 |
| 40.30 | 46.48 | 50.71 | 43.37 | 45.92 | 56.03 | 67.27 |
| 72.34 | 76.18 | 78.19 | 78.94 | 76.19 | 86.53 | 90.52 |
| 5.6 | 6.5 | 6.8 | 5.8 | 6.3 | 6.4 | 9.2 |
| 12,375.62 | 12,599.58 | 11,731.56 | 10,724.83 | 12,481.41 | 14,248.94 | 15,944.31 |
| 1,695.91 | 1,741.10 | 1,635.62 | 1,541.03 | 1,755.23 | 1,978.33 | 2,186.96 |
| 3,176 | 3,196 | 2,735 | 2,558 | 2,867 | 3,459 | 4,255 |
| 9,535.79 | 9,793.05 | 8,546.44 | 8,357.89 | 9,584.02 | 11,270.23 | 12,968.74 |
| 77.05 | 77.73 | 72.85 | 77.93 | 76.79 | 79.10 | 81.34 |
| 88,833 | 93,161 | 73,106 | 72,058 | 86,053 | 87,750 | 101,100 |
| 325.97 | 350.35 | 302.36 | 283.83 | 332.98 | 345.67 | 377.75 |
| 1,150.84 | 1,232.62 | 1,065.15 | 1,028.11 | 1,184.13 | 1,338.30 | 1,513.70 |
| 58.44 | 61.60 | 53.17 | 56.42 | 56.80 | 53.78 | 53.89 |
| 67.86 | 70.80 | 65.12 | 66.72 | 67.46 | 67.65 | 69.22 |
| 5,272 | 5,113 | 4,837 | 4,614 | 4,998 | 5,594 | 6,359 |
| 12,891,457 | 15,475,955 | 15,155,627 | 13,516,164 | 15,431,263 | 16,185,953 | 18,803,412 |
| 321,683 | 340,523 | 338,148 | 333,991 | 351,186 | 353,652 | 343,916 |
| 218,293 | 241,077 | 220,210 | 222,825 | 236,922 | 239,238 | 238,041 |
| 5 | 5 | 3 | 3 | 4 | 7 | 8 |
| 4 | 4 | 4 | 4 | 5 | 7 | 7 |
| 5 | 5 | 5 | 5 | 5 | 6 | 6 |
| 2 | - | - | - | 2 | 2 | 1 |
| 16 | 14 | 12 | 12 | 16 | 22 | 22 |

**පාරිභාෂික පද විවරණය**

**ලබා ගත හැකි ආසන කිලෝමීටර ප්‍රමාණය (ASK)**

විකුණුම් සඳහා තැබෙන ආසන නිපැයුම සහ ඒවා ප්‍රවාහනය කෙරෙන දුර ප්‍රමාණය.

**ලබාගත හැකි ටොන් කිලෝමීටර් ප්‍රමාණය (ATK)**

මෙය ප්‍රවාහන නිපැයුමෙහි මිණුම වේ.

ගුවන් යානාවක් නිපදවන ලබාගත හැකි ටොන් කිලෝමීටර් ප්‍රමාණය වනුයේ, පියාසර කළ දුර ප්‍රමාණයෙන් ගුණිත ටොන් ප්‍රමාණයෙන් ගණනය වන ගුවන් යානාවේ ලාභ භාරයේ ධාරිතාවයි.

**මගී කිලෝමීටර් ප්‍රමාණ ආදායම (RPK)**

ප්‍රවාහනය කරන ලද මගීන්ගේ නිපැයුම සහ ඒවා ප්‍රවාහනය කෙරෙන දුර ප්‍රමාණය

**ටොන් කිලෝමීටර් ප්‍රමාණ ආදායම (RTK)**

ප්‍රවාහනය කරන ලද මගීන්ගේ හා භාණ්ඩවල ටොන් ප්‍රමාණ නිපැයුම සහ ඒවා ප්‍රවාහනය කෙරෙන දුර ප්‍රමාණය

**පැටවුම් සාධකය**

ආදායම් පැටවුමට සැපයූ ධාරිතාවයේ සබඳතාව අනුව ප්‍රතිශතය

මගී පැටවුම් සාධකය, මගී කිලෝමීටර් ප්‍රමාණ ආදායමට ලබාගත හැකි ආසන කිලෝමීටර් ප්‍රමාණය හා අදාළ වන අතර සමස්ත පැටවුම් සාධකය, ටොන් කිලෝමීටර් ප්‍රමාණ ආදායමට ලබාගත හැකි ටොන් කිලෝමීටර් ප්‍රමාණය හා අදාළ වේ.

**මගී කිලෝමීටර් ප්‍රමාණ ආදායම එක් කිලෝමීටරයකට අනුව ආදායම**

මගී කිලෝමීටර් ප්‍රමාණ ආදායම එක් කිලෝමීටරයකට අනුව ආදායම, මගී ආදායමට මගී කිලෝමීටර් ප්‍රමාණ ආදායම හා අදාළ වේ.

**ඒකක පිරිවැය**

ඒකක පිරිවැය, මුළු මෙහෙයුම් පිරිවැයට ලබාගත හැකි ටොන් කිලෝමීටර් ප්‍රමාණය හා අදාළ වේ.

**සමස්ත ඉපදවීම**

සමස්ත ඉපදවීම, ශුද්ධ ප්‍රවාහන ආදායමට ටොන් කිලෝමීටර් ප්‍රමාණ ආදායම හා අදාළ වේ.

ශුද්ධ ප්‍රවාහන ආදායම වනුයේ මගීන්, අතිරේක ගුවන් බඩු, ගුවන් බඩු හා මෙහෙයුම් වියදම් යනාදියෙන් ලැබෙන මුදල් ප්‍රමාණයයි.

**සමච්ඡේදක පැටවුම් සාධකය**

කාල නිශ්චිත ගුවන් සමාගම් මෙහෙයුම් වලින් ලබන ආදායම මෙහෙයුම් පිරිවැය හා සාම්‍ය වනු පිණිස පැටවුම් සාධකය අවශ්‍ය වේ.

**මහා සභා රැස්වීම දැනුම් දීම**

සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ කොටස් හිමියන්ගේ තිස්පස් වන වාර්ෂික මහසභා රැස්වීම පහත දැක්වෙන අරමුණු සඳහා **2013 සැප්තැම්බර් මස 26 වන ගුරු දින ප.ව. 3.00** ට කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ පිහිටි **බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ** කමිටු කාමර **'D'** දරන ස්ථානයේදී පවත්වනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**න්‍යාය පත්‍රය**

1. 2013 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වර්ෂය වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශ, ඒ පිළිබඳ විගණකවරුන්ගේ වාර්තාව සමඟ භාරගනු ලැබ සලකා බැලීම.

2. අර්න්ස්ට් ඇන්ඩ් යංග් සමාගම විගණක වරුන් වශයෙන් නැවත පත්කිරීම හා ඔවුන්ගේ පාරිශ්‍රමික නියම කිරීම සඳහා අධ්‍යක්ෂවරුන්ට බලය පැවරීම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

**අ/කළේ: සමාගමේ ලේකම්**

**මිල්ඩ්‍රඩ් පීරිස්**

2013 ජුලි මස 30 වන දින
කටුනායකදීය.

සටහන:

1. මහ සභා රැස්වීමට සහභාගි වී ඡන්දය දීමට හිමිකම් ලබන සාමාජිකයෙකු ඔහු වෙනුවෙන් එම රැස්වීමට සහභාගි වී ඡන්දය පාවිච්චි කිරීම සඳහා පෙරකලාසිකරුවකු පත්කරනු ලැබීම පිණිස හිමිකම් ලබයි.
2. පෙරකලාසිකරුවකු සමාගමේ සාමාජිකයෙකු වීම අවශ්‍ය නොවේ.
3. මෙම දැනුම් දීම සමඟ පෙරකලාසි පත්‍රයක් මෙයට යාකර ඇත.
4. මහ සභා රැස්වීමට සහභාගි වන කොටස් හිමියන්/පෙරකලාසිකරුවන් මෙම දැනුම් දීම සමඟ ඔවුන්ගේ ජාතික හැඳුනුම්පත්‍රයද රැගෙන ආ යුතුයයි ඉල්ලා සිටිනු ලැබේ.

**පෙරකලාසි පත්‍රය**

සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම

සී/ස ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ගුවන් සමාගමේ සාමාජිකයෙකු/සාමාජිකයන් වන ..........................................................................................................................................................
පදිංචි......................................................................................................................................................
වන මම/අපි , 2013 සැප්තැම්බර් මස 26 වන ගුරු දින ප.ව. 3.00 ට පවත්වනු ලබන සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමට අයත් කොටස් හිමියන්ගේ තිස්පස් වන වාර්ෂික මහ සභා රැස්වීමේදී හා එහි කිසියම් කල් තැබූ රැස්වීමකදී මා/අප වෙනුවෙන් පෙනී සිටිමින් මා/අප නියෝජනය කිරීම පිණිස ...............................................................................................................................................පදිංචි
...............................................................................................................................................හෝ
ඔහු/ඇය පැමිණීමට අපොහොසත් වෙතොත් පහත දැක්වෙන,

නිශාන්ත වික්‍රමසිංහ මහතා
නිහාල් ජයමාන්න මහතා, ජ.නී.
කපිල චන්ද්‍රසේන මහතා
ෂමීන්ද්‍ර රාජපක්ෂ මහතා
මනිලාල් ප්‍රනාන්දු මහතා
ලක්ෂ්මී සංගක්කාර මහත්මිය
සනත් උක්වත්ත මහතා
සුසන්ත රත්නායක මහතා

යන අධ්‍යක්ෂවරුන්ගෙන් එක් අයෙකු,

මගේ/අපගේ පෙරකලාසි බලකරු වශයෙන් මෙයින් පත් කරමි.

වර්ෂ දෙදහස් දහතුනේ ...............................................මස ......................ක්වූ මෙදිනයේදී අත්සන් කළෙමි.

.....................................................

අත්සන

**සටහන:**

චවන කිසිවක් කපාහරිනු ලැබ නොමැතිනම් හෝ පෙරකලාසි පත්‍ර හිමිකරු සිය ඡන්දය පාවිච්චි කළයුතු ආකාරය සම්බන්ධයෙන් එකී පෙරකලාසි පත්‍ර හිමිකරු සැලකිල්ලට ගැනීමේදී (පෙරකලාසි පත්‍රයෙහි අඩංගු උපදෙස් සම්පූර්ණ කර ඇති ආකාරය පිළිබඳ හේතු කරණකොට ගෙන) යම් සැකයක් මතු නොවේ නම් හෝ පෙරකලාසි බලපත්‍ර හිමියා තමන් යෝග්‍ය යැයි හඟින පරිදි ස්වකීය ඡන්දය පාවිච්චි කරනු ඇත.

**පෙරකලාසි පත්‍රය සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්:**

1. ඔබගේ සම්පූර්ණ නම සහ ලිපිනය පැහැදිලිව ලියා, සපයා ඇති ඉඩෙහි අත්සන යොදා, අත්සන් තැබූ දිනයද සටහන් කර පෙරකලාසි පත්‍රය නිවැරදිව සම්පූර්ණ කරන්න.

2. නේවාසික/අනේවාසික කොටස් හිමියන් සම්බන්ධයෙන් වන විට, සම්පූර්ණ කරන ලද පෙරකලාසි පත්‍රය සමාගම වෙත භාරගනු ලැබීනේ පසුව ඊට අදාළ මුද්‍රා කටයුතු සිදු කෙරේ.

3. සම්පූර්ණ කරන ලද පෙරකලාසි පත්‍රය මහ සභා රැස්වීම පැවැත්වීමට නියමිත වේලාවට පැය 48 කට නොඅඩු කාලයකට පෙර සමාගමේ පහත දැක්වෙන ලියා පදිංචිකළ කාර්යාලයෙහි තැන්පත් කරනු ලැබිය යුතුය.

මණ්ඩලයේ අණ පරිදි,

**සමාගමේ ලේකම්**
**ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ලිමිටඩ්**
**ගුවන් ගමන් මධ්‍යස්ථානය**
**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ**
**කටුනායක**